194 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 194 - இல. 2
**Volume 194 - No. 2**

2010 ඔක්තෝබර් 06 වන බදාදා
2010 ஒக்ரோபர் 06, புதன்கிழமை
**Wednesday, 06th October, 2010**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද යෝජනාව:**
පාර්ලිමේන්තු සහ කාරක සභා රැස්වීම්වලට නියමිත වේලාවට සහභාගි නොකිරීම
2010.08.18 දින "ඩේලි නිවුස්" වාර්තාව

**සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී

**පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන විශේෂ කාරක සභාව**

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமைப் பிரேரணை:**
பாராளுமன்ற மற்றும் குழு அமர்வுகளில் குறித்த நேரத்தில் சமுகமளிக்க முடியாமற்செய்தல்
2010.08.18ஆந் திகதிய "டெய்லி நியூஸ்" அறிக்கை

**குடியியல் வான்செலவு சட்டமூலம்:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது

**பாராளுமன்ற சேவையின் சுயாதீனப் பண்பை வலுப்படுத்துவது பற்றி ஆராய்ந்து அறிக்கை சமர்ப்பிப்பதற்கான தெரிகுழு**

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE MOTION:
Disabling Participation in Parliamentary Sittings and Committees on Time
"Daily News" Report of 18.08.2010

CIVIL AVIATION BILL
Second Reading - Debate Adjourned

SELECT COMMITTEE TO INQUIRE AND REPORT ON STRENGTHENING THE INDEPENDENT CHARACTER OF THE PARLIAMENTARY SERVICE

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2010 ඔක්තෝබර් 06 වන බදාදා***
*2010 ஒக்ரோபர் 06, புதன்கிழமை*
*Wednesday, 06th October, 2010*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப.1.00மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR . SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2009 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමු කාණ්ඩයේ V කොටස, දෙවැනි කාණ්ඩයේ VI වැනි කොටස සහ හතරවැනි කාණ්ඩයේ IV කොටස ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.
ගරු අතාවුද සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා - පැමිණ නැත.
ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහනුවර, දුම්රිය ධාවනාගාරයේ ජේ.එම්.එන්. මායාදුන්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පොල්ගම්පල, කපුගොඩ පදිංචි එම්.කේ.ඩී. කුලසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.

**ගරු ඩුලිප් විජේසේකර මහතා**
(மாண்புமிகு துலிப் விஜேசேக்கர)
(The Hon. Duleep Wijesekera )
ගරු කථානායකතුමනි, මම වතුරුගම, ඉඳුරුගල්ල, අමුවත්ත පදිංචි දයාසීලි අමරසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 1-0246/'10 -(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, හම්බන්තොට කලාපයෙන් විස්තර ගෙන්වා ගැනීමට අවශ්‍ය නිසා මට මේ ප්‍රශ්නයට උත්තර දීමට සති හතරක කාලයක් අවශ්‍ය වනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5 - 0485/'10 -(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Irrigation and Water Resources Management)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 - 0247/'10 -(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අවතැන් වූවන්ගේ විවාහ : මුදල් ආධාර
## இடம்பெயர்ந்தோரின் திருமணங்கள் : நிதி உதவி
## MARRIAGES OF DISPLACED PERSONS : FINANCIAL AID

0462/'10

8\. **ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රටේ අභ්‍යන්තරව අවතැන් වී සිටින පවුල්වලට අයත් අවිවාහක අයෙකු විවාහ ගිවිස ගැනීමේදී පුද්ගලයින්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය වෙතින් ලබා දෙන මුදල් ආධාරය කොපමණද;

(ii) වර්ෂ 2004 සිට 2010 මැයි මස දක්වා පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය, මුන්දලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අවතැන්ව සිටින පවුල්වලට අයත්, එම මුදල් ආධාර ලබා දුන් පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) අවතැන් වූ පවුල් දෙකක් අතර විවාහ ගිවිස ගැනීමේදී එම දෙපළටම ලබා දෙන මුදල් ප්‍රමාණය සහ එසේ මුදල් ලබා දුන් අවස්ථා ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) ඉහත (අ)(iii) හි පරිදි සිදු වූ විවාහ වීම් සහ එක් අයෙකු අවතැන් පවුලක සාමාජිකයකුව සිදු වූ විවාහ වීම්වලට අදාළව වර්ෂ 2004-2010 කාලය තුළදී ලබා දුන් මුදල් ප්‍රමාණය, මුදල්ලාභීන්ගේ නම්, ලිපිනයන්, මුදල් නිකුත් කළ දිනයන්, වවුචර් අංක හා දිනයන් කවරේද යන්න ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டினுள் இடம்பெயர்ந்துள்ள குடும்பங்களைச் சேர்ந்த திருமணமாகாத ஒருவர் விவாக ஒப்பந்தம் செய்கின்றபோது ஆட்கள், ஆதனங்கள், கைத்தொழில்கள் புனர்வாழ்வளிப்பு அதிகார சபையினால் வழங்கப்படுகின்ற நிதி உதவி எவ்வளவென்பதையும்,

(ii) 2004 ஆம் ஆண்டு முதல் 2010, மே மாதம் வரை புத்தளம், வனாதவில்லுவ, கல்பிட்டி, முந்தல் ஆகிய பிரதேச செயலகப் பிரிவுகளில் இடம்பெயர்ந்துள்ள குடும்பங்களைச் சேர்ந்த, மேற்படி நிதி உதவி வழங்கப்பட்டுள்ள நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்,

(iii) இடம்பெயர்ந்துள்ள இரண்டு குடும்பங்களுக்கிடையில் திருமண ஒப்பந்தம் மேற்கொள்ளப்படும்போது அந்த இரு சாராருக்கும் வழங்கப்படும் நிதித் தொகை மற்றும் அவ்வாறு நிதி வழங்கப்பட்டுள்ள சந்தர்ப்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) மேற்படி (அ) (iii) இன் பிரகாரம் இடம்பெற்றுள்ள விவாகங்கள் மற்றும் இடம்பெயர்ந்த குடும்பமொன்றின் உறுப்பினரொருவராக செய்துள்ள விவாகங்களுக்கேற்ப 2004-2010 காலத்தினுள் வழங்கப்பட்டுள்ள நிதித் தொகை, நிதி பெறுநர்களின் பெயர்கள், முகவரிகள், நிதி வழங்கப்பட்டுள்ள திகதிகள், செலவுறுதிச் சீட்டு இலக்கங்கள் மற்றும் திகதிகள் யாவையென்பதை மேற்குறிப்பிட்டுள்ள பிரதேச செயலக பிரிவுகள் ரீதியாக அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rehabilitation and Prison Reforms:

(a) Will he state-

(i) the financial aid provided by the Rehabilitation of Persons, Property and Industries Authority when an unmarried person belonging to internally displaced family in the country, enters into matrimony ;

(ii) the number of persons belonging to internally displaced families in the Divisional Secretaries' Divisions of Puttalam, Wanathawilluwa, Kalpitiya and Mundalama who were provided with such financial aid from 2004 to May 2010 ; and

(iii) the amount of money given to both partners at the marriage of two persons from internally displaced families and the number of such instances of provision of money?

(b) Will he state on the basis of aforesaid Divisional Secretaries' Divisions the amount of money given, names of recipients, their addresses, dates of issue of money and the numbers and dates of vouchers from 2004 to 2010 with regard to marriages that took place as of (iii) above and marriages in which one partner was from a displaced family?

(c) If not, why?

**ගරු ඩිව් ගුණසේකර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Rehabilitation and Prison Reforms)

(අ) (i) (අ) මනාලයා හෝ මනාලිය යන දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් අවතැන් කඳවුරක පදිංචි වී සිට විවාහ වූයේ නම් එම තැනැත්තා හෝ තැනැත්තිය වෙත රුපියල් 12,500ක මුදලක් ලබා දෙනු ලැබේ.

(ආ) මනාලයා හා මනාලිය යන දෙපළම අවතැන් කඳවුරුවල පදිංචි වී සිටි නම් එම දෙපළ විවාහ වීමේදී රුපියල් 25,000ක ආධාර මුදලක් ලබා දෙනු ලැබේ.

(ii) වර්ෂ 2004 සිට 2010 මැයි මස දක්වා පුත්තලම, වනාතවිල්ලුව, කල්පිටිය හා මුන්දලම යන ප්‍රදේශවල ආධාර ලබා දුන් පුද්ගලයන් සංඛ්‍යාව 4,630ක් වේ.

(iii) විවාහ වූ දෙපළම අවතැන් කඳවුරුවල පදිංචිව සිට විවාහ වූ පවුල් සඳහා ගෙවීම් සංඛ්‍යාව 247ක් වේ.

(ආ) වසර 2004 සිට 2010 දක්වා කාලයේදී ලබා දුන් මුදල් ප්‍රමාණය, මුදල්ලාභීන්ගේ නම, ලිපිනය, (කඳවුරේ නම) හා ලිපිගොනු අංක සඳහන් ලේඛනය ඇමුණුම 01 ලෙස දක්වා ඇත. වවුචර් අංක සඳහන් නොවේ. එම ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) පැන නොනඟී.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)

Hon. Minister, my first Supplementary Question is regarding the amount of money given to the couples, both of whom are from internally displaced families at marriage, in 2009. According to the Answer, if both partners are from internally dispalced families, you are giving Rs. 25,000. But, last year they gave such a couple only Rs. 12,500 at marriage. How has this happened?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

If one partner is from an internally displaced family, we give him or her Rs. 12,500 and if both partners are from internally displaced families we give them Rs. 25,000.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)

But, last year they have given only Rs. 12,500 for such a couple.

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

Hon. Member, let me know the details. All the lists are tabled. It is a bulky volume. It will appear in the Hansard. You can go through them. If there is any problem, let me know and I will look into it.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. දැන් විවිධ තොරතුරු, ආරංචි විවිධ විධියට පැතිරෙමින් තිබෙනවා, විශේෂයෙන්ම සරත් ෆොන්සේකා මැතිතුමා ඉන්න කුටිය සහ එතුමා -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒක අයිති නැහැ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පොඩ්ඩක් ඉන්න. මා ඇමතිතුමාගෙන් නේ අහන්නේ? - [*Interruption.*] You sit down. The Hon. Minister will answer the Question.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

හැම දාම රැස්වීම් පටන් ගත්තු ගමන් බාධා කරනවා. සභාවේ ගරුත්වය ආරක්ෂා කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, සරත් ෆොන්සේකා මහතා පිළිබඳව, එතුමාගේ ආරක්ෂාව පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෙනම අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙයට අදාළ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ප්‍රශ්නයට අදාළ නැති ප්‍රශ්න අහන්න එපා. [බාධා කිරීම්] ප්‍රශ්නයට අදාළ නැත්නම් අහන්න දෙන්න බැහැ. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa )
I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, අමාත්‍යවරයා කැමැතියි උත්තර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා කැමැති නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා කිව්වා - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9 -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක්. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වෙන කෙනෙක් නැඟිටලා ඉන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මා ප්‍රශ්නය අහන්නේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන්. ඇමතිතුමා කැමැත්තෙන් ඉන්නවා උත්තර දෙන්න. තමුන්නාන්සේ වාඩි වෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ, මා නඟන්නේ රීති ප්‍රශ්නයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා සූදානම් උත්තර දෙන්න. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් අහන්නේ - [බාධා කිරීම්] වෙන කෙනෙක් පැනලා උත්තර දෙන්න හදනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේ නිශ්ශබ්ද වන්න. ගරු විමල් වීරවංශ අමාත්‍යතුමනි, මොකක්ද තමුන්නාන්සේ කියන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඊයේ සරත් ෆොන්සේකා මැතිතුමා ගැන විපක්ෂ නායකතුමා ප්‍රකාශයක් කළා. එතුමාත් එක්ක තරගයට අර ස්වාධීන මන්ත්‍රී දයාසිරි ජයසේකර මහත්මයා අද ඒකම කරන්න හදනවා. එතුමාත් එක්ක තරග කරන්න මේ සභාව පාවිච්චි කරන්න එපා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි පක්ෂය පාවා දීලා ආණ්ඩුවත් එක්ක එකතු වුණේ නැහැ එතුමා වාගේ. එතුමා තමයි ආණ්ඩුවත් එක්ක එකතු වුණේ ජේවීපී එක විනාශ කරලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මෙයට අදාළ නැත. [බාධා කිරීම්] ප්‍රශ්න අංක 9, ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සෞඛ්‍ය ඇමතිතුමා නවවැනි ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා ස්වාධීන වුණාද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එතුමාට පක්ෂයක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි නේ. ඔබතුමා ස්වාධීන වුණාද? ලැජ්ජයි නේ. කෝ, ස්වාධීන වීමක් නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ තුන් කල් දැක්මට මොකද වුණේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කෝලම් මඩුවක් කරන්න එපා පාර්ලිමේන්තුව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 9-0466/'10-(1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සේවක අර්ථසාධක අරමුදල: ආයෝජන
## ஊழியர் சேமலாப நிதியம்: முதலீடுகள்
## EMPLOYEES' PROVIDENT FUND : INVESTMENTS

0486/'10

10. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ මේ වන විට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;
(ii) එම අරමුදල සතු මුදල් කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ආයෝජනය කර තිබේද;
(iii) එසේ නම් එම මුදල් ප්‍රමාණය කොපමණද;
(iv) එසේ ආයෝජනය කර ඇති සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලින් ලංකා හෝටල් සංස්ථාවේ ආයෝජනය කළ මුදල කොපමණද;
(ii) කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි සහ ලංකා හෝටල් සංස්ථාවේ ආයෝජනය කිරීමෙන් ලැබී ඇති ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

தொழில் உறவுகள், விளைவுப்பெருக்க மேம்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஊழியர் சேமலாப நிதியத்தில் தற்போதுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும் ,
(ii) அந்நிதியத்திற்கு சொந்தமான பணம் கொழும்பு பங்குச் சந்தையில் முதலீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்,
(iii) ஆமெனில், அப்பணத்தொகையின் பெறுமதி எவ்வளவென்பதையும்,
(iv) அவ்வாறு முதலீடு செய்யப்பட்டுள்ள கம்பனிகளின் பெயர்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிதியத்திலிருந்து லங்கா ஹோட்டல் கூட்டுத்தாபனத்தில் முதலீடு செய்யப்பட்ட தொகை எவ்வளவென்பதையும்,

(ii) கொழும்பு பங்குச் சந்தையிலும் லங்கா ஹோட்டல் கூட்டுத்தாபனத்திலும் முதலீடு செய்யப்பட்டதன் மூலம் பெறப்பட்ட இலாபம் அல்லது நட்டம் எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Labour Relations and Productivity Improvement :

(a) Will he inform this House-

(i) the amount of money in the Employees' Provident Fund as of today ;

(ii) whether the money owned by the aforesaid fund has been invested in the Colombo Stock Exchange ;

(iii) if so, the amount so invested ; and

(iv) the names of the companies in which the aforesaid investment has been made?

(b) Will he state-

(i) the amount of money invested in the Ceylon Hotels Corporation from the monies of the aforesaid fund ; and

(ii) the profit or loss made by investing in the Colombo Stock Exchange and Ceylon Hotels Corporation?

(c) If not, why?

**ගරු ජගත් බාලසූරිය මහතා (කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜகத் பாலசூரிய - தொழில் உறவுகள், விளைவுப்பெருக்க மேம்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Jagath Balasuriya - Deputy Minister of Labour Relations and Productivity Improvement)

ගරු කථානායකතුමනි, කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 31/08/2010 දිනට රුපියල් බිලියන 852ක් සේවක අර්ථසාධක අරමුදලේ තිබෙනවා.

(ii) ඔව්.

(iii) රුපියල් දසලක්ෂ විසිහයදහස් නවසියයක් පමණ.

(iv) ඔව්. ගරු කථානායකතුමනි, සමාගම් 76ක් පමණ තිබෙනවා. එම නිසා මා එම නාම ලේඛනය ඇමුණුම 1ලෙස **සභාගත*** කරනවා.

(ආ) (i) රුපියල් දසලක්ෂ 689.02යි.

(ii) හෝටල් සංස්ථාවේ ලාභය රුපියල් දසලක්ෂ 127.4ක් පමණ.

කොටස් වෙළෙඳ පොළ ආයෝජන ලාභය දසලක්ෂ 20,376ක් පමණ.

(ඇ) පැන නොනඟී.

***** ***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

සේ.අ.අ. ආයෝජනය කර ඇති සමාගම් (මිලියන 100 කට වැඩි)

01. අහුන්ගල්ල හෝටල් සමාගම
02. එයිට්කන් ස්පෙන්ස් සමාගම
03. ඒෂියන් හෝටල් සමාගම
04. අමායා ලෙෂර් හෝටල් සමාගම
05. කොමර්ෂල් බැංකුව
06. කැල්ටෙක්ස් සමාගම
07. කාර්ගිල්ස් සමාගම
08. සිලෝන් ග්ලාස් සමාගම
09. සිලෝන් හොටෙල්ස් කෝපරේෂන් සමාගම
10. සිලෝන් තියටර් සමාගම
11. කෝල්ඩ් ස්ටෝර්ස් සමාගම
12. සීඅයිසී සමාගම
13. ඩීඑෆ්සීසී බැංකුව
14. ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් සමාගම
15. ඩයලොග් සමාගම
16. ඩොක්යාර්ඩ් සමාගම
17. ගලදාරි හෝටල් සමාගම
18. හෙයිකාබ් සමාගම
19. හේලීස් සමාගම
20. හේලීස් එම්ජීටී නයිටිං සමාගම
21. හේමාස් සමාගම
22. හොටෙල් සර්විසස් සමාගම
23. එච්එන්බී බැංකුව
24. ජේකේඑච් සමාගම
25. කීල්ස් හෝටල සමාගම
26. ලයිට්හවුස් හෝටලය
27. එල්අයිඔසී සමාගම
28. ලංකා ටයිල්ස් සමාගම
29. ලංකා වෝල්ටයිල් සමාගම
30. එන්ඩීබී බැංකුව
31. නවලෝක සමාගම
32. ඕවර්සීස් රියලිටි සමාගම
33. රයිගම් වයඹ සමාගම
34. රිඩ්ඩ් පිරිස් සමාගම
35. රෝයල් සෙරමික් සමාගම
36. සම්පත් බැංකුව
37. සෙලාන් බැංකුව
38. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
39. ටැන්ජරීන් හෝටල් සමාගම
40. ටාජ් ලංකා හෝටල් සමාගම

සේ.අ.අ. ආයෝජනය කර ඇති සමාගම් (මිලියන 100 කට අඩු)

01. ඒසීඑල් කේබල්ස් සමාගම
02. ඇපලෝ රෝහල් සමාගම
03. ආසිරි මෙඩිකල් සමාගම
04. ඩර්ඩන්ස් සමාගම
05. ඊනින් හෝටල් සමාගම
06. ග්‍රේන් එලිවේටර්ස් සමාගම
07. නෙස්ලේ සමාගම
08. සිරා කේබල්ස් සමාගම
09. ටෝකියෝ සිමෙන්ති සමාගම
10. ට්‍රාන්ස් ඒෂියා හෝටලය
11. ඒසීඑල් ප්ලාස්ටික් සමාගම
12. අගලවත්ත වතු සමාගම
13. ආසිරි රෝහල් සමාගම
14. බලංගොඩ වතු සමාගම
15. බොගවන්තලාව වතු සමාගම
16. බ්‍රවුන්ස් සමාගම
17. බ්‍රවුන්ස් බීච් හෝටල් සමාගම
18. සී.ඩබ්ලිව්. මැක්‍රයි සමාගම
19. කලම්බු ලෑන්ඩ් සමාගම
20. ඩිස්ටිලරීස් සමාගම
21. හේමාස් පවර් සමාගම
22. කෑගල්ල වතු සමාගම
23. කැලණි කේබල්ස් සමාගම
24. කැලණි වැලි වතු සමාගම
25. කුරුවිට ටෙක්ස්ටයිල් මිල්ස් සමාගම
26. ලංකා ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස් සමාගම
27. පැගාසස් හෝටල් සමාගම
28. රේණුකා සිටි හෝටල් සමාගම
29. සෙරෙන්ඩිබ් හෝටල සමාගම
30. සීගිරිය විලේජ් හෝටල් සමාගම
31. සිංගර් ශ්‍රී ලංකා සමාගම
32. ස්ටැෆර්ඩ් හෝටල් සමාගම
33. තලවකැලේ වතු සමාගම
34. ටී ස්මෝල්හෝල්ඩර්ස් ෆැක්ටරීස් සමාගම
35. වැලිබල් පවර්ස් සමාගම
36. වටවල වතු සමාගම

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීමෙන් ලබා ඇති ලාභය හෝ පාඩුව කොපමණ ද කියා කියන්න පුළුවන්ද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

පුළුවන්. කොටස් වෙළෙඳ පොළේ අපි ආයෝජනය කිරීමෙන් පාඩුවක් වෙලා නැහැ. ලාභයක් තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ලාභය කොච්චර තිබෙනවාද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

හෝටල් සංස්ථාවේ ලාභය රුපියල් මිලියන 127.4යි. කොටස් වෙළෙඳ පොළේ ආයෝජන ලාභය රුපියල් මිලියන 20,376යි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නියෝජ්‍ය ඇමතිතුමා, බොහොම වග කීමක් ඇතිව නේ මේ පිළිතුර ඉදිරිපත් කරන්නේ?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

ඔව්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තවමත් හෝටල් සංස්ථාවේ මේ ආයෝජනය තිබෙනවාද? නැත්නම් දැන් ඒක ඉවත් කර ගෙන ද තිබෙන්නේ?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

අපට දන්වා තිබෙන ආකාරයෙන් තවම තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

බොහොම ස්තුතියි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා. සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජනය කරන්නේ මහ බැංකුව. Labour Ministry එක නොවෙයි. එතකොට මේ අරමුදල් බැංකුවල ආයෝජනය කරන්න මහ බැංකුවට තහනම් කර තිබෙන බව නියෝජ්‍ය ඇමතිතුමා දන්නවාද?

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම සේවක අර්ථසාධක අරමුදලේ පරිපාලනය තිබෙන්නේ අපේ අමාත්‍යාංශයට. මුදල් ආයෝජනය කිරීමේ කාර්ය භාරය තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයට. විශේෂයෙන්ම මහ බැංකුවට. නමුත් මෙම අවස්ථාවේදී මෙතුමා අහන ප්‍රශ්නයේ හැටියට අපට කියන්න තිබෙන්නේ, මහ බැංකුවේ පරිපාලකයා හැටියට ක්‍රියා කළත්,

බැංකුවල මුදල් ආයෝජනය කිරීමෙන් අපට වාසියක් ලැබෙන නිසා එසේ ආයෝජනය කර තිබෙන බවයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, නැහැ. ඒක වැරැදියි. ආයෝජනය කරන්න බැහැයි කියන ලේඛනය -සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය- මා ළඟ තිබෙනවා. කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය ගැන නේ දැන් කථා කරන්නේ. එහි 2.6.2.2 යටතේ තිබෙනවා, "මුදල් මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ආයතන අධීක්ෂණය කරනු ලබන බැවින් බැංකු සහ මූල්‍ය ආයතනවල ව්‍යාපාර වස්තුවල ආයෝජනය කිරීමට අරමුදලට අවසර නොමැත." කියලා. "නොමැත" කියන එකෙන් කියන්නේ කරන්න බැහැයි කියන එකයි. අපි දන්නවා, පෙරේදා සේවක අර්ථසාධක අරමුදල හැටන් නැෂනල් බැංකුවෙන් රුපියල් මිලියන එකක shares අරගෙන තිබෙන බව. ඉතින් මෙතැන බැහැයි කියා තිබෙනවා නම් කොහොමද ඒක කරන්නේ? [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක වැරැදියි නේ නියෝජ්‍ය අමාත්‍යතුමා. [බාධා කිරීම්]

**ගරු ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு ஜகத் பாலசூரிய)
(The Hon. Jagath Balasuriya)
ගරු කථානායකතුමනි, දැන් මේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳව සම්පූර්ණ වගකීම තිබෙන්නේ මහ බැංකුවේ මුදල් පාලක මණ්ඩලයටයි. ඒ පිළිබඳව විස්තර මා පසුව ඔබතුමාට ලබා දෙන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11 -0248/'10- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුර ගෙන්වා ගැනීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12 -0444/'10- (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 13 -0463/'10- (1), ගරු නූර්දීන් මෂූර් මහතා.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
I ask Question No. 13.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Re-settlement)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 -0467/'10- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், விமானச்சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Aviation)
ගරු කථානායකතුමනි, වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ඉක්මනින් පිළිතුර ලබා දෙන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
පුළුවන් තරම් ඉක්මනට දෙන්නම්.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ග්‍රාම නිලධාරි තනතුරු: බඳවා ගැනීම
## கிராம உத்தியோகத்தர் பதவிகள்: ஆட்சேர்ப்பு
## GRAMA NILADHARI POSTS : RECRUITMENT

0487/'10

15. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැනට ශ්‍රී ලංකාව තුළ පුරප්පාඩු වී ඇති ග්‍රාම නිලධාරි තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

(ii) මෙයට පෙර පැවති තරග විභාගයේ ප්‍රතිඵල අනුව එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(iii) නො එසේ නම් නව ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු ලෙසට රජය විසින් ඉදිරිපත් කරන සුදුසුකම් කවරේද;

(iv) නව බඳවා ගැනීම් සඳහා නැවත තරග විභාගයක් පවත්වන්නේද;

(v) එසේ නම් ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இலங்கையில் வெற்றிடமாயுள்ள கிராம உத்தியோகத்தர் பதவிகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) பிரதேச செயலாளர் பிரிவு மட்டத்தில் மேற்படி வெற்றிடங்கள் வெவ்வேறாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்ப தையும்,

(ii) இதற்கு முன்னர் நடைபெற்ற போட்டிப் பரீட்சையின் பெறுபேறுகளுக்கு ஏற்ப மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்,

(iii) இன்றேல், புதிய கிராம உத்தியோகத்தர்களை ஆட்சேர்ப்புச் செய்கின்ற போது விண்ணப்ப தாரர்கள் பூர்த்தி செய்ய வேண்டுமென அரசாங்கம் முன்வைக்கும் தகைமைகள் யாவையென்பதையும்,

(iv) புதிய ஆட்சேர்ப்புகளுக்கான மீண்டும் போட்டிப் பரீட்சை நடத்தப்படுமா என்பதையும்.

(v) அவ்வாறாயின், அது எப்போது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், என்?

asked the Minister of Public Administration and Home Affairs :

(a) Will he state-

(i) the number of vacancies exist in Grama Niladhari posts in Sri Lanka at present ;

(ii) the number of aforesaid vacancies on Divisional Secretary's Division basis, separately ?

(b) Will he inform this House-

(i) the course of action that will be followed to fill those vacancies ;

(ii) whether measures will be taken to fill those vacancies on the results of the competitive examination that was held previously?

(iii) if not, the qualifications stipulated by the Government to be met by the applicants, in recruiting new Grama Niladharis ;

(iv) whether a competitive examination will be held again for new recruitments ; and

(vi) if so, the date on which it will be held?

(c) If not, why?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

(අ) (i) 2010.06.30 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 2066කි.

(ii) ඔව්. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) (i) තරග විභාගයක් පවත්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සුදුසුකම් ලබන අය පත් කිරීමෙන්.

(ii) නැත.

(iii) අපොස (සා. පෙළ) භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වීම සහ අපොස (උ. පෙළ) විෂයයන් 03කින් සමත් වීම.

(iv) ඔව්.

(v) නිශ්චිතව කිව නොහැක.

(ඇ) විභාග කොමසාරිස් ජනරාල්ගේ එකඟතාව මත විභාගය පවත්වන දිනය තීරණය කරනු ඇත.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

** Annex tabled:*

ඇමුණුම 1

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

| දිස්ත්‍රික්කය District | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| කොළඹ | Colombo | 558 | 72 | 17 | 55 |
| කළුතර | Kaluthara | 762 | 131 | 31 | 100 |
| ගම්පහ | Gampaha | 1177 | 123 | 28 | 95 |
| මාතලේ | Mathale | 545 | 113 | 14 | 99 |
| මහනුවර | Kandy | 1188 | 212 | 15 | 197 |
| නුවරඑළිය | Nuwaraeliya | 491 | 76 | 11 | 65 |
| ගාල්ල | Galle | 896 | 145 | 24 | 121 |
| මාතර | Mathara | 650 | 114 | 11 | 103 |
| හම්බන්තොට | Hambanthota | 576 | 83 | 18 | 65 |
| මොණරාගල | Monaragala | 319 | 62 | 3 | 59 |
| අම්පාර | Ampara | 503 | 97 | 7 | 90 |
| මඩකලපුව | Batticaloa | 345 | 57 | 7 | 50 |
| ත්‍රිකුණාමලය | Trincomalee | 230 | 36 | 5 | 31 |
| මුලතිව් | Mullativ | 127 | 28 | 2 | 26 |
| කිලිනොච්චිය | Killinochchi | 95 | 27 | 4 | 23 |
| යාපනය | Jaffna | 435 | 102 | 14 | 88 |
| කුරුණෑගල | Kurunegala | 1610 | 319 | 38 | 281 |
| කෑගල්ල | Kegalle | 573 | 114 | 15 | 99 |
| අනුරාධපුර | Anuradhapura | 702 | 95 | 23 | 72 |
| පොළොන්නරුව | Polonnaruwa | 295 | 57 | 8 | 49 |
| පුත්තලම | Puttalam | 548 | 91 | 13 | 78 |
| රත්නපුර | Rathnapura | 575 | 99 | 16 | 83 |
| බදුල්ල | Badulla | 567 | 106 | 11 | 95 |
| මන්නාරම | Mannar | 153 | 31 | 6 | 25 |
| වව්නියා | Vavniya | 102 | 18 | 1 | 17 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **14022** | **2408** | **342** | **2066** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

කොළඹ දිස්ත්‍රික්කය

Colombo District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GNs who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| මහරගම | Maharagama | 41 | 2 | 0 | 2 |
| සීතාවක | Seethawaka | 68 | 9 | 2 | 7 |
| කඩුවෙල | Kaduwela | 57 | 2 | 0 | 2 |
| කැස්බෑව | Kesbewa | 73 | 10 | 5 | 5 |
| පාදුක්ක | Padukka | 46 | 8 | 1 | 7 |
| රත්මලාන | Rathmalana | 13 | 2 | 0 | 2 |
| මොරටුව | Moratuwa | 42 | 4 | 2 | 2 |
| තිඹිරිගස්යාය | Thimbirigasyaya | 20 | 1 | 1 | 0 |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | Sri Jayawardhanapura Kotte | 20 | 0 | 0 | 0 |
| දෙහිවල | Dehiwala | 15 | 5 | 0 | 5 |
| හෝමාගම | Homagama | 81 | 12 | 3 | 9 |
| කොළඹ | Colombo | 35 | 6 | 0 | 6 |
| කොලොන්නාව | Kolonnawa | 47 | 11 | 3 | 8 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **558** | **72** | **17** | **55** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය

## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010

කළුතර දිස්ත්‍රික්කය

Kaluthara District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| වලල්ලාවිට | Walallavita | 60 | 6 | 1 | 5 |
| බණ්ඩාරගම | Bandaragama | 59 | 14 | 8 | 6 |
| මතුගම | Mathugama | 57 | 9 | 2 | 7 |
| අගලවත්ත | Agalawatta | 34 | 10 | 0 | 10 |
| පාලින්දනුවර | Palindanuwara | 43 | 3 | 1 | 2 |
| දොඩන්ගොඩ | Dodangoda | 45 | 7 | 0 | 7 |
| ඉංගිරිය | Ingiriya | 31 | 6 | 0 | 6 |
| පානදුර | Panadura | 72 | 15 | 4 | 11 |
| මිල්ලනිය | Millaniya | 44 | 12 | 4 | 8 |
| හොරණ | Horana | 61 | 10 | 2 | 8 |
| බුලත්සිංහල | Bulathsinhala | 54 | 14 | 5 | 9 |
| මදුරාවල | Madurawala | 33 | 11 | 0 | 11 |
| බේරුවල | Beruwala | 82 | 4 | 1 | 3 |
| කළුතර | Kaluthara | 87 | 10 | 3 | 7 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **762** | **131** | **31** | **100** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය

## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010

ගම්පහ දිස්ත්‍රික්කය

Gampaha District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| අත්තනගල්ල | Attanagalla | 151 | 19 | 1 | 18 |
| බියගම | Biyagama | 49 | 7 | 4 | 3 |
| දිවුලපිටිය | Divulapitiya | 123 | 16 | 3 | 13 |
| දොම්පෙ | Dompe | 133 | 23 | 6 | 17 |
| ගම්පහ | Gampaha | 101 | 8 | 2 | 6 |
| ජාඇල | Ja-ela | 57 | 5 | 2 | 3 |
| කටාන | Katana | 79 | 3 | 2 | 1 |
| කැලණිය | Kelaniya | 37 | 0 | 0 | 0 |
| මහර | Mahara | 92 | 5 | 1 | 4 |
| මිනුවන්ගොඩ | Minuwangoda | 121 | 14 | 1 | 13 |
| මීරිගම | Meerigama | 149 | 14 | 5 | 9 |
| මීගමුව | Negombo | 39 | 7 | 0 | 7 |
| වත්තල | Wattala | 46 | 2 | 1 | 1 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **1177** | **123** | **28** | **95** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මාතලේ දිස්ත්‍රික්කය

Mathale District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| මාතලේ | Mathale | 52 | 11 | 2 | 9 |
| උකුවෙල | Ukuwela | 73 | 20 | 4 | 16 |
| නාඋල | Na-ula | 52 | 11 | 3 | 8 |
| යටවත්ත | Yatawatta | 56 | 8 | 0 | 8 |
| ගලේවෙල | Galewela | 59 | 10 | 1 | 9 |
| පල්ලේපොල | Pallepola | 44 | 10 | 1 | 9 |
| අඹන්ගඟ කෝරලේ | Ambanganga Korale | 20 | 6 | 1 | 5 |
| ලග්ගල පල්ලේගම | Laggala Pallegama | 37 | 6 | 0 | 6 |
| විල්ගමුව | Wilgamuwa | 39 | 8 | 0 | 8 |
| දඹුල්ල | Dambulla | 59 | 10 | 2 | 8 |
| රත්තොට | Raththota | 54 | 13 | 0 | 13 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **545** | **113** | **14** | **99** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මහනුවර දිස්ත්‍රික්කය

Kandy District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| ගඟවට කෝරලේ | Gangawata Korale | 64 | 6 | 1 | 5 |
| කුණ්ඩසාලේ | Kundasale | 80 | 15 | 0 | 15 |
| අකුරණ | Akurana | 35 | 3 | 1 | 2 |
| යටිනුවර | Yatinuwara | 95 | 32 | 1 | 31 |
| පූජාපිටිය | Pujapitiya | 67 | 10 | 2 | 8 |
| උඩපලාත | Udapalatha | 49 | 6 | 2 | 4 |
| පස්බාගේ කොරලේ | Pasbage Korale | 29 | 5 | 0 | 5 |
| තුම්පනේ | Thumpane | 67 | 15 | 1 | 14 |
| පාතහේවාහැට | Pathahewaheta | 73 | 9 | 1 | 8 |
| දෙල්තොට | Delthota | 29 | 7 | 0 | 7 |
| ගඟඉහල කෝරලේ | Ganga Ihala Korale | 31 | 9 | 0 | 9 |
| මැදදුම්බර | Medadumbara | 94 | 14 | 0 | 14 |
| පාතදුම්බර | Pathadumbara | 52 | 15 | 0 | 15 |
| පන්විල | Panwila | 14 | 1 | 0 | 1 |
| උඩුදුම්බර | Ududumbara | 63 | 13 | 0 | 13 |
| මිණිපේ | Minipe | 48 | 8 | 0 | 8 |
| උඩුනුවර | Udunuwara | 124 | 16 | 0 | 16 |
| හාරිස්පත්තුව | Harispaththuwa | 84 | 15 | 5 | 10 |
| දොළුව | Doluwa | 33 | 3 | 0 | 3 |
| හතරලියද්ද | Hatharaliyadda | 57 | 10 | 1 | 9 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **1188** | **212** | **15** | **197** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010
### නුවරඑළිය දිස්ත්‍රික්කය
### Nuwaraeliya District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| කොත්මලේ | Kothmale | 96 | 21 | 2 | 19 |
| නුවරඑළිය | Nuwara-eliya | 72 | 11 | 2 | 9 |
| අඹගමුව | Ambagamuwa | 67 | 7 | 2 | 5 |
| වලපනේ | Walapane | 125 | 23 | 5 | 18 |
| හගුරන්කෙත | Hanguranketha | 131 | 14 | 0 | 14 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **491** | **76** | **11** | **65** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010
### ගාල්ල දිස්ත්‍රික්කය
### Galle District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| අක්මීමන | Akmeemana | 63 | 9 | 1 | 8 |
| අම්බලන්ගොඩ | Ambalangoda | 36 | 6 | 1 | 5 |
| ඇල්පිටිය | Elpitiya | 51 | 12 | 2 | 10 |
| බද්දේගම | Baddegama | 70 | 6 | 0 | 6 |
| බලපිටිය | Balapitiya | 52 | 13 | 5 | 8 |
| බෙන්තොට | Benthota | 51 | 6 | 3 | 3 |
| බොපෙ පෝද්දල | Bope Poddala | 44 | 7 | 0 | 7 |
| කඩවත් සතර | Galle Town Four Gravets | 50 | 3 | 0 | 3 |
| ගෝනපීනුවල | Gonapeenuwala | 19 | 6 | 0 | 6 |
| හබරාදුව | Habaraduwa | 59 | 7 | 4 | 3 |
| හික්කඩුව | Hikkaduwa | 97 | 20 | 3 | 17 |
| ඉමදූව | Imaduwa | 43 | 6 | 1 | 5 |
| කරන්දෙණිය | Karandeniya | 40 | 12 | 1 | 11 |
| නාගොඩ | Nagoda | 53 | 8 | 2 | 6 |
| නෙළුව | Neluwa | 34 | 5 | 0 | 5 |
| නියාගම | Niyagama | 34 | 7 | 0 | 7 |
| තවලම | Thawalama | 36 | 6 | 1 | 5 |
| වැලිවිටිය දිවිතුර | Welivitiya Divithura | 20 | 2 | 0 | 2 |
| යක්කලමුල්ල | Yakkalamulla | 44 | 4 | 0 | 4 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **896** | **145** | **24** | **121** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මාතර දිස්ත්‍රික්කය

Mathara District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| මාතර | Mathara | 66 | 7 | 0 | 7 |
| මුලටියන | Mulatiyana | 48 | 8 | 0 | 8 |
| හක්මන | Hakmana | 34 | 9 | 3 | 6 |
| අතුරලිය | Athuraliya | 28 | 4 | 1 | 3 |
| කඹුරුපිටිය | Kamburupitiya | 39 | 6 | 0 | 6 |
| පිටබැද්දර | Pitabeddara | 40 | 11 | 1 | 10 |
| තිහගොඩ | Thihagoda | 40 | 7 | 1 | 6 |
| කොටපොල | Kotapola | 37 | 4 | 2 | 2 |
| වැලිපිටිය | Welipitiya | 38 | 0 | 0 | 0 |
| දෙවිනුවර | Devinuwara | 41 | 9 | 1 | 8 |
| දික්වැල්ල | Dikwella | 48 | 12 | 0 | 12 |
| කිරින්ද පුහුල්වැල්ල | Kirinda Puhulwella | 25 | 2 | 1 | 1 |
| අකුරැස්ස | Akuressa | 46 | 11 | 0 | 11 |
| මාලිම්බඩ | Malimbada | 29 | 6 | 1 | 5 |
| පස්ගොඩ | Pasgoda | 43 | 8 | 0 | 8 |
| වැලිගම | Weligama | 48 | 10 | 0 | 10 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **650** | **114** | **11** | **103** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

හම්බන්තොට දිස්ත්‍රික්කය

Hambanthota District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| හම්බන්තොට | Hambanthota | 30 | 5 | 2 | 3 |
| සූරියවැව | Sooriyawewa | 21 | 2 | 0 | 2 |
| වලස්මුල්ල | Walasmulla | 53 | 11 | 4 | 7 |
| බෙලිඅත්ත | Beliatta | 71 | 8 | 3 | 5 |
| තංගල්ල | Thangalla | 72 | 8 | 0 | 8 |
| කටුවන | Katuwana | 56 | 11 | 2 | 9 |
| ලුණුගම්වෙහෙර | Lunugamwehera | 36 | 5 | 0 | 5 |
| වීරකැටිය | Weeraketiya | 60 | 7 | 2 | 5 |
| අම්බලන්තොට | Ambalanthota | 55 | 11 | 0 | 11 |
| අගුණකොළපැලැස්ස | Angunakolapelessa | 51 | 3 | 1 | 2 |
| ඕකේවෙල | Okewela | 27 | 6 | 3 | 3 |
| තිස්සමහාරාම | Thissamaharama | 44 | 6 | 1 | 5 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **576** | **83** | **18** | **65** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මොණරාගල දිස්ත්‍රික්කය

Monaragala District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | Divisional Secretariat | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| බිබිල | Bibila | 40 | 6 | 0 | 6 |
| මැදගම | Medagama | 35 | 5 | 0 | 5 |
| මඩුල්ල | Madulla | 38 | 10 | 1 | 9 |
| සියඹලාණ්ඩුව | Siyambalanduwa | 48 | 9 | 0 | 9 |
| මොනරාගල | Monaragala | 26 | 5 | 0 | 5 |
| බඩල්කුඹුර | Badalkumbura | 41 | 10 | 1 | 9 |
| බුත්තල | Buththala | 29 | 7 | 1 | 6 |
| වැල්ලවාය | Wellawaya | 29 | 5 | 0 | 5 |
| සෙවනගල | Sewanagala | 14 | 2 | 0 | 2 |
| තණමල්විල | Thanamalwila | 14 | 2 | 0 | 2 |
| කතරගම | Katharagama | 5 | 1 | 0 | 1 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **319** | **62** | **3** | **59** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

අම්පාර දිස්ත්‍රික්කය

Ampara District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | Divisional Secretariat | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| දෙහිඅත්තකණ්ඩිය | Dehiattakandiya | 13 | 4 | 0 | 4 |
| පදියතලාව | Padiyathalawa | 20 | 8 | 1 | 7 |
| මහඔය | Mahaoya | 17 | 5 | 0 | 5 |
| උහන | Uhana | 55 | 10 | 0 | 10 |
| අම්පාර | Ampara | 22 | 6 | 0 | 6 |
| දමන | Damana | 33 | 3 | 2 | 1 |
| ලාහුගල | Lahugala | 12 | 2 | 0 | 2 |
| පොතුවිල් | Pothuwil | 27 | 8 | 1 | 7 |
| තිරුක්කෝවිල් | Thirukkovil | 22 | 6 | 0 | 6 |
| අලයඩිවෙම්බු | Alayadiwembu | 22 | 4 | 1 | 3 |
| අක්කරපත්තුව | Akkaraipattu | 28 | 6 | 0 | 6 |
| අඩ්ඩාලච්චේන | Addalachchena | 32 | 5 | 0 | 5 |
| කාර්තිව් | Karthiv | 17 | 6 | 0 | 6 |
| සායින්දමරුදු | Saindamarudu | 17 | 3 | 0 | 3 |
| කල්මුණ - මුස්ලිම් | Kalmune - Muslim | 29 | 5 | 0 | 5 |
| කල්මුණ- දෙමළ | Kalmune - Tamil | 29 | 0 | 0 | 0 |
| නාවින්දවෙලි | Nvindaveli | 20 | 2 | 0 | 2 |
| සමන්තුර | Samanthurei | 51 | 8 | 1 | 7 |
| එරගම | Eragama | 12 | 3 | 0 | 3 |
| නින්දවූර් | Nindavur | 25 | 3 | 1 | 2 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **503** | **97** | **7** | **90** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මඩකලපුව දිස්ත්‍රික්කය

Batticaloa District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| කොරලේපත්තු උතුර | Koralepattu North | 16 | 2 | 0 | 2 |
| මන්මුනේ බටහිර | Manmune West | 24 | 3 | 2 | 1 |
| කෝරලේපත්තු දකුණ | Koralepattu South | 18 | 5 | 0 | 5 |
| මන්මුනේ නිරිත | Manmune East | 24 | 2 | 1 | 1 |
| කොරලේපත්තු | Koralepattu | 12 | 1 | 1 | 0 |
| මන්මුනේ දකුණ | Manmune South | 45 | 9 | 0 | 9 |
| මන්මුනේපත්තු | Manmunepattu | 27 | 2 | 0 | 2 |
| මන්මුනේ උතුර | Manmune North | 48 | 14 | 0 | 14 |
| කාත්තන්කුඩි | Kaththankudi | 18 | 2 | 0 | 2 |
| එරාවූර්පත්තු | Eravurpattu | 39 | 6 | 1 | 5 |
| කොරලේපත්තු මධ්‍යම | Koralepattu Central | 8 | 0 | 0 | 0 |
| කෝරලේපත්තු බටහිර | Koralepattu West | 8 | 1 | 0 | 1 |
| එරාවූර් නගරය | Eravur Town | 15 | 1 | 0 | 1 |
| පෝරතිව්පත්තු | Porthivpattu | 43 | 9 | 2 | 7 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **345** | **57** | **7** | **50** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

Trincomalee District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| නගර හා කඩවත් | Trinco Town Four Gravets | 42 | 8 | 0 | 8 |
| පදවි ශ්‍රී පුර | Padavi Sree Pura | 10 | 1 | 0 | 1 |
| ගෝමරන්කඩවල | Gomarankadawala | 10 | 2 | 1 | 1 |
| කින්නියා | Kinniya | 31 | 10 | 0 | 10 |
| සේරුවිල | Seruwila | 17 | 3 | 0 | 3 |
| මූතූර් | Muthur | 42 | 3 | 3 | 0 |
| කන්තලේ | Kanthale | 23 | 1 | 0 | 1 |
| කුච්චවේලි | Kuchchaweli | 24 | 4 | 0 | 4 |
| මොරවැව | Morawewa | 10 | 3 | 0 | 3 |
| තඹලගමුව | Thambalagamuwa | 12 | 0 | 0 | 0 |
| වෙරුගල්/ඊච්චලම්පත්තුව | Welugal/Ichchalampattu | 9 | 1 | 1 | 0 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **230** | **36** | **5** | **31** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

මුලතිව් දිස්ත්‍රික්කය

Mullativ District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| පුදුකුඩුරිප්පු | Pudukudeerippu | 19 | 4 | 0 | 4 |
| මාන්තායි නැගෙනහිර | Manthai East | 15 | 4 | 2 | 2 |
| තුනුක්කායි | Thunukkai | 20 | 3 | 0 | 3 |
| මැරිටයිම්පත්තු | Meritimepattu | 46 | 9 | 0 | 9 |
| ඔඩ්ඩුසුඩාන් | Oddusudan | 27 | 8 | 0 | 8 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **127** | **28** | **2** | **26** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

කිලිනොච්චි දිස්ත්‍රික්කය

Kilinochchi District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| කරච්චි | Karachchi | 42 | 6 | 3 | 3 |
| කන්දවලායි | Kandawalai | 16 | 7 | 1 | 6 |
| පූනාකරි | Punakari | 19 | 7 | 0 | 7 |
| පච්චිලෙයිපල්ලි | Pachchileipalli | 18 | 7 | 0 | 7 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **95** | **27** | **4** | **23** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

කුරුණෑගල දිස්ත්‍රික්කය

Kurunegala District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| ගිරිබාව | Giribawa | 35 | 9 | 1 | 8 |
| ගල්ගමුව | Galgamuwa | 62 | 11 | 4 | 7 |
| ඇහැටුවැව | Ehetuwewa | 35 | 7 | 2 | 5 |
| මහව | Mahawa | 68 | 20 | 3 | 17 |
| අඹන්පොල | Ambanpola | 28 | 1 | 0 | 1 |
| කොටවෙහෙර | Kotawehera | 31 | 11 | 3 | 8 |
| රස්නායකපුර | Rasnayakapura | 28 | 7 | 1 | 6 |
| නිකවැරටිය | Nikaweratiya | 42 | 7 | 0 | 7 |
| පොල්පිතිගම | Polpithigama | 82 | 11 | 3 | 8 |
| ඉබ්බාගමුව | Ibbagamuwa | 74 | 11 | 1 | 10 |
| ගනේවත්ත | Ganewatta | 42 | 13 | 0 | 13 |
| මාවතගම | Mawathagama | 71 | 15 | 2 | 13 |
| මල්ලවපිටිය | Mallawapitiya | 45 | 11 | 1 | 10 |
| කුරුණෑගල | Kurunegala | 54 | 10 | 0 | 10 |
| මාස්පොත | Maspotha | 33 | 8 | 0 | 8 |
| වීරඹුගෙදර | Weerambugedara | 38 | 6 | 0 | 6 |

| | | | | | |
|---|---|---|---|---|---|
| පොල්ගහවෙල | Polgahawela | 84 | 14 | 0 | 14 |
| අලව්ව | Alawwa | 66 | 13 | 4 | 9 |
| නාරම්මල | Narammala | 54 | 12 | 0 | 12 |
| කුලියාපිටිය නැගෙනහිර | Kuliyapitiya East | 45 | 7 | 0 | 7 |
| කුලියාපිටිය බටහිර | Kuliyapitiya West | 68 | 10 | 2 | 8 |
| වාරියපොල | Wariyapola | 56 | 6 | 0 | 6 |
| පඩුවස්නුවර නැගෙනහිර | Panduwasnuwara East | 39 | 13 | 2 | 11 |
| බමුණාකොටුව | Bamunakotuwa | 36 | 6 | 0 | 6 |
| කොබෙයිගනේ | Kobeigane | 35 | 5 | 2 | 3 |
| පඩුවස්නුවර බටහිර | Panduwasnuwara West | 64 | 19 | 0 | 19 |
| බිංගිරිය | Bingiriya | 52 | 7 | 3 | 4 |
| උඩුබද්දව | Udubaddawa | 43 | 8 | 2 | 6 |
| පන්නල | Pannala | 87 | 18 | 2 | 16 |
| රිදීගම | Rideegama | 113 | 23 | 0 | 23 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **1610** | **319** | **38** | **281** |

**<u>2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය</u>**

**<u>LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010</u>**

යාපනය දිස්ත්‍රික්කය

Jaffna District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| ඩෙල්ෆ් | Delf | 6 | 2 | 0 | 2 |
| චෙලනායි | Chelanai | 30 | 4 | 0 | 4 |
| කයිට්ස් | Kytes | 15 | 5 | 2 | 3 |
| කරෙයිනගර් | Kareinagar | 9 | 3 | 0 | 3 |
| යාපනය | Jaffna | 28 | 11 | 2 | 9 |
| නල්ලූර් | Nallur | 40 | 8 | 0 | 8 |
| සන්දිලිපායි | Sandilipai | 28 | 7 | 2 | 5 |
| චානක්කනි | Chanakkani | 25 | 5 | 0 | 5 |
| උඩුවිල් | Uduvil | 30 | 9 | 0 | 9 |
| තෙලිප්පායි | Thelippai | 45 | 7 | 4 | 3 |
| කෝපායි | Kopai | 31 | 9 | 4 | 5 |
| චාවකච්චේරි | Chawakachcheri | 60 | 10 | 0 | 10 |
| කරවෙඩ්ඩි | Karacheddi | 35 | 6 | 0 | 6 |
| පොයින්ට් පේද්‍රු | Point Pedro | 35 | 7 | 0 | 7 |
| මුරුතන්කර්නි | Muruthankerny | 18 | 9 | 0 | 9 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **435** | **102** | **14** | **88** |

**<u>2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය</u>**

**<u>LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010</u>**

කෑගල්ල දිස්ත්‍රික්කය

Kegalle District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| රඹුක්කන | Rambukkana | 89 | 19 | 0 | 19 |
| වරකාපොල | Warakapola | 78 | 10 | 3 | 7 |
| අරණායක | Aranayaka | 61 | 14 | 0 | 14 |
| මාවනැල්ල | Mawanella | 71 | 14 | 5 | 9 |
| ගලිගමුව | Galigamuwa | 51 | 15 | 3 | 12 |
| යටියන්තොට | Yatiyanthota | 32 | 4 | 0 | 4 |
| රුවන්වැල්ල | Ruwanwella | 38 | 5 | 0 | 5 |
| කෑගල්ල | Kegalle | 61 | 12 | 2 | 10 |
| දෙහිඕවිට | Dehiovita | 39 | 10 | 2 | 8 |
| බුලත්කොහුපිටිය | Bulathkohupitiya | 27 | 5 | 0 | 5 |
| දැරණියගල | Deraniyagala | 26 | 6 | 0 | 6 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **573** | **114** | **15** | **99** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010

### අනුරාධපුර දිස්ත්‍රික්කය
### Anuradhapura District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව<br>Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව<br>No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව<br>No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව<br>No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| පදවිය | Padaviya | 15 | 2 | 1 | 1 |
| කැබිතිගොල්ලෑව | Kebithigollewa | 26 | 4 | 1 | 3 |
| මැදවච්චිය | Medawachchiya | 37 | 8 | 0 | 8 |
| රඹෑව | Rambewa | 38 | 5 | 3 | 2 |
| හොරොව්පතාන | Horowpathana | 38 | 5 | 4 | 1 |
| ගලෙන්බිදුනුවැව | Galenbindunuwewa | 41 | 7 | 1 | 6 |
| කහටගස්දිගිලිය | Kahatagasdigiliya | 40 | 7 | 0 | 7 |
| නැගෙනහිර නුවරගම් පලාත | Nuwaragam Palath East | 29 | 0 | 0 | 0 |
| නාච්චාදූව | Nachchaduwa | 19 | 3 | 0 | 3 |
| මධ්‍යම නුවරගම් පලාත | Nuwaragam Palath Central | 40 | 7 | 3 | 4 |
| නොච්චියාගම | Nochchiyagama | 36 | 4 | 0 | 4 |
| මහවිලච්චිය | Mahavilachchiya | 17 | 1 | 0 | 1 |
| තලාව | Thalawa | 39 | 4 | 2 | 2 |
| තඹුත්තේගම | Thambuttegama | 26 | 2 | 0 | 2 |
| රාජාංගනය | Rajanganaya | 21 | 1 | 0 | 1 |
| ගල්නෑව | Galnewa | 30 | 8 | 0 | 8 |
| ඉපලෝගම | Ipalogama | 32 | 4 | 1 | 3 |
| තිරප්පනේ | Thirappane | 41 | 3 | 2 | 1 |
| මිහින්තලේ | Mihinthale | 25 | 3 | 0 | 3 |
| පලුගස්වැව | Palugaswewa | 16 | 1 | 0 | 1 |
| පලාගල | Palagala | 35 | 4 | 3 | 1 |
| වැලිඔය | Welioya | 8 | 2 | 0 | 2 |
| කැකිරාව | Kekirawa | 53 | 10 | 2 | 8 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **702** | **95** | **23** | **72** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010

### පොලොන්නරුව දිස්ත්‍රික්කය
### Polonnaruwa District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව<br>Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව<br>No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව<br>No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව<br>No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| හිගුරක්ගොඩ | Hingurakgoda | 53 | 13 | 3 | 10 |
| ලංකාපුර | Lankapura | 28 | 7 | 0 | 7 |
| දිඹුලාගල | Dimbulagala | 56 | 8 | 2 | 6 |
| තමන්කඩුව | Thamankaduwa | 55 | 7 | 0 | 7 |
| මැදිරිගිරිය | Medirigiriya | 45 | 10 | 2 | 8 |
| ඇලහැර | Elahera | 28 | 6 | 0 | 6 |
| වැලිකන්ද | Welikanda | 30 | 6 | 1 | 5 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **295** | **57** | **8** | **49** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

පුත්තලම දිස්ත්‍රික්කය

Puttalam District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| ආරච්චිකට්ටුව | Arachchikattuwa | 33 | 1 | 1 | 0 |
| නවගත්තේගම | Nawagattegama | 19 | 5 | 0 | 5 |
| දංකොටුව | Dankotuwa | 47 | 2 | 0 | 2 |
| මාදම්පෙ | Madampe | 49 | 6 | 2 | 4 |
| වනාතවිල්ලුව | Wanathavilluwa | 17 | 4 | 1 | 3 |
| ආණමඩුව | Anamaduwa | 35 | 11 | 0 | 11 |
| කල්පිටිය | Kalpitiya | 31 | 8 | 0 | 8 |
| මුන්දලම | Mundalama | 31 | 6 | 0 | 6 |
| නාත්තන්ඩිය | Naththandiya | 47 | 8 | 3 | 5 |
| හලාවත | Chillaw | 49 | 6 | 0 | 6 |
| මහකුඹුක්කඩවල | Mahakumbukkadawala | 25 | 4 | 0 | 4 |
| මහවැව | Mahawewa | 47 | 6 | 4 | 2 |
| පල්ලම | Pallama | 18 | 4 | 0 | 4 |
| වෙන්නප්පුව | Wennappuwa | 52 | 11 | 2 | 9 |
| පුත්තලම | Puttalam | 22 | 5 | 0 | 5 |
| කරුවලගස්වැව | Karuwalagaswewa | 26 | 4 | 0 | 4 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **548** | **91** | **13** | **78** |

**2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය**

**LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010**

රත්නපුර දිස්ත්‍රික්කය

Rathnapura District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| ඇහැලියගොඩ | Eheliyagoda | 44 | 8 | 0 | 8 |
| කුරුවිට | Kuruvita | 39 | 3 | 2 | 1 |
| රත්නපුර | Rathnapura | 53 | 15 | 4 | 11 |
| කිරිඇල්ල | Kiriella | 17 | 5 | 0 | 5 |
| අයගම | Ayagama | 21 | 4 | 0 | 4 |
| කලවාන | Kalawana | 33 | 4 | 0 | 4 |
| පැල්මඩුල්ල | Pelmadulla | 37 | 4 | 1 | 3 |
| නිවිතිගල | Nivithigala | 24 | 5 | 0 | 5 |
| ඇලපාත | Elapatha | 20 | 4 | 0 | 4 |
| කහවත්ත | Kahawatta | 21 | 1 | 1 | 0 |
| ගොඩකවෙල | Godakawela | 44 | 11 | 0 | 11 |
| ඕපනායක | Opanayaka | 20 | 3 | 0 | 3 |
| වැලිගෙපොල | Weligepola | 30 | 4 | 2 | 2 |
| බලංගොඩ | Balangoda | 53 | 11 | 3 | 8 |
| ඉඹුල්පේ | Imbulpe | 50 | 8 | 3 | 5 |
| ඇඹිලිපිටිය | Embilipitiya | 40 | 4 | 0 | 4 |
| කොලොන්න | Kolonna | 29 | 5 | 0 | 5 |
| **මුළු සංඛ්‍යාව** | **Total** | **575** | **99** | **16** | **83** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010
### බදුල්ල දිස්ත්‍රික්කය
### Badulla District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| මහියංගනය | Mahiyanganaya | 35 | 9 | 0 | 9 |
| රිදීමාලියද්ද | Rideemaliyadda | 42 | 10 | 1 | 9 |
| කන්දකැටිය | Kandeketiya | 26 | 4 | 1 | 3 |
| මීගහකිවුල | Meegahakivula | 20 | 3 | 0 | 3 |
| සොරණාතොට | Soranathota | 25 | 2 | 0 | 2 |
| පස්සර | Passara | 41 | 11 | 0 | 11 |
| ලුණුගල | Lunugala | 28 | 5 | 0 | 5 |
| බදුල්ල | Badulla | 29 | 5 | 3 | 2 |
| හාලි ඇල | Hali-ela | 57 | 6 | 2 | 4 |
| ඌව පරණගම | Uva Paranagama | 68 | 14 | 3 | 11 |
| වැලිමඩ | Welimada | 64 | 10 | 1 | 9 |
| බණ්ඩාරවෙල | Bandarawela | 35 | 7 | 0 | 7 |
| ඇල්ල | Ella | 32 | 10 | 0 | 10 |
| හපුතලේ | Haputhale | 26 | 4 | 0 | 4 |
| හල්දුම්මුල්ල | Haldúmmala | 39 | 6 | 0 | 6 |
| මුළු සංඛ්‍යාව | **Total** | **567** | **106** | **11** | **95** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010
### මන්නාරම දිස්ත්‍රික්කය
### Mannar District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| මන්නාරම | Mannar | 49 | 10 | 2 | 8 |
| නානඩ්ඩාන් | Nanaddan | 31 | 2 | 0 | 2 |
| මුසලි | Musali | 20 | 0 | 0 | 0 |
| මාන්තායි බටහිර | Manthai West | 36 | 14 | 3 | 11 |
| මඩු | Madu | 17 | 5 | 1 | 4 |
| මුළු සංඛ්‍යාව | **Total** | **153** | **31** | **6** | **25** |

## 2010.09.30 දිනට ග්‍රාම නිලධාරී පුරප්පාඩු ලේඛනය
## LIST OF GRAMA NILADHARI VACANCIES ON 30.09.2010
### වවුනියා දිස්ත්‍රික්කය
### Vavniya District

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය Divisional Secretariat | | අනුමත ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව Approved Grama Niladhari Cardre | 2010.06.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.06.2010 | 2010.06.01 දින සිට පුහුණුවට වාර්තා කර ඇති සංඛ්‍යාව No.of GN who reported for the Training from 01.06.2010 | 2010.09.30 දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව No. of Vacancies on 30.09.2010 |
|---|---|---|---|---|---|
| වවුනියා | Vavniya | 42 | 12 | 1 | 11 |
| වවුනියා උතුර | Vavniya North | 20 | 1 | 0 | 1 |
| වවුනියා දකුණ | Vavniya South | 20 | 4 | 0 | 4 |
| වෙන්ගලචෙඩිකුලම් | Wengalachedikulam | 20 | 1 | 0 | 1 |
| මුළු සංඛ්‍යාව | **Total** | **102** | **18** | **1** | **17** |

දැනට අපි මේ සම්බන්ධව සාකච්ඡා කරගෙන යනවා. විභාග කොමසාරිස්වරයායි විභාගය පවත් වන්නේ. ඒ නිසා එතුමාගේ පහසුවත් බලලා අපි විභාගය ප්‍රසිද්ධියට පත් කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසු ගිය කාලයේ මේ සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍ර කැඳවා තරග විභාග තියලා සුදුසුකම් ලබා තිබෙන අයගේ යම් ලැයිස්තු ප්‍රමාණයක් අපි හඳුනා ගෙන තිබුණා. මා ගෞරවයෙන් ඔබතුමාගෙන් අහනවා, නැවත තරග විභාගයක් පවත්වා තවත් විශාල වියදමක් කරනවාට වඩා අර පසු ගිය ලැයිස්තුවේ ඉන්න අයට අවස්ථාවක් දෙන්න බැරි ඇයි, කියලා. ඒ ලැයිස්තුවල තව ඉන්නවා. සමහර වෙලාවට එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් දෙන්නෙක් තුන් දෙනෙක් වාගේයි අරගෙන තිබෙන්නේ. ඒ නිසා අනෙක් පුරප්පාඩුවලටත් ඒ තරග විභාගය තුළින් බඳවා ගන්න යම් කිසි වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි. නැත්නම් මේ ගොල්ලන්ට විශාල අසාධාරණයක් වනවා, ගරු ඇමතිතුමනි.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ඒ තරග විභාගය පවත්වපු අවස්ථාව වනකම් රටේ ඇති වුණු සියලුම ඇබෑර්තු ඒ තරග විභාගයේ ප්‍රතිඵල පදනම් කර ගෙන පිරෙව්වා. ඒ තරග විභාගයට පසුව ඇති වුණු පුරප්පාඩු පිරවීම සඳහායි නැවත තරග විභාගයක් තියන්නේ. ඒ තරග විභාගය පවත්වන කොට අපි හඳුනා ගෙන තිබුණා තනතුරු සංඛ්‍යාවක්. ඒ සංඛ්‍යාව පුරවා අවසානයි. විභාගයෙන් පස්සේ ඇති වුණු තනතුරු නැවත විභාගයක් පවත්වා පුරවන්න දැන් තීන්දු කරලා තිබෙනවා. ඒ ගැන ඔබතුමා සතුටු වන්නට ඕනෑ. මොකද, විභාගය පැවැත්වූවායින් පස්සේ සුදුසුකම් ලබාපු අයට අවස්ථාවක් නැහැ ඒ විභාගයේ ප්‍රතිඵලවලින්ම ගත්තොත්. නැවත විභාගයක් පැවැත්වූවොත් ඒ අයටත් මේ විභාගයට ඉදිරිපත් වන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒක මම පිළිගන්නවා. ගරු අමාත්‍යතුමනි, මේ වේලාවේ නැවත බඳවා ගැනීම් කරන නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, නිවැරදි තරග විභාගයක් පවත්වලා නියමිත සුදුසුකම් ඇති අයට මේ පත්වීම් ලබා දෙන්න ඔබතුමා කටයුතු කරනවා ද, නැත්නම් වෙනත් විධියේ බලපෑම් මත මේ බඳවා ගැනීම් කරනවා ද කියලා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

නැහැ, නැහැ. අනවශ්‍ය පාටක් මේකට ගාන්න එපා. බොහොම සද්භාවයෙන් මේක කරන්නේ. ඒ බව ඔබතුමාට පෙනේවි. ප්‍රතිපත්තිමය වශයෙන් මේක ඉතාමත්ම හොඳ වැඩ පිළිවෙළක්. විභාගය පැවැත් වීමට ඉස්සර වෙලා තිබුණු ඇබෑර්තු පුරවන්නේ ඒ විභාගයෙන්. ඒ විභාගය පැවැත් වීමෙන් පසුව ඇති වෙච්ච ඇබෑර්තුවලට නැවත විභාගයක් පවත්වලායි පුරවන්නේ. ඒක බොහොම සද්භාවයෙන් හා හොඳ චේතනාවකින් කරන දෙයක්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මගේ ඊ ළඟ අතුරු ප්‍රශ්නය. ඔබතුමන්ලා සමෘද්ධි නියාමකයන් මේ තනතුරු සඳහා පත් කරන්නට කුමක් හෝ වැඩ පිළිවෙළක් සාකච්ඡා කරලා තිබෙනවාද?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

දැනට අරගෙන තිබෙන තීන්දුව තමයි මම ඒ කිව්වේ. ඒ තීන්දුව අනුව අපි විභාගයක් පවත්වලා අර කියපු සුදුසුකම් තිබෙන අයගෙන් තෝරා ගන්න තමයි දැනට තීරණය කරලා තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ කියන්නේ සමෘද්ධි නියාමකවරුන් මේ තනතුරට බඳවා ගන්න බලාපොරොත්තුවක් නැහැ?

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

දැනට එහෙම තීන්දුවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පිළිතුරු පැහැදිලියි. බොහොම හොඳයි.

දෙවන වටය. ප්‍රශ්න අංක 2-0359/'10-(1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, විස්තරාත්මක පිළිතුරක් ලබා දිය යුතු නිසා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මම සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදුලි සංදේශ සහ ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන් : විස්තර
## தொலைத்தொடர்பு மற்றும் செல்லிடத் தொலைபேசிச் சேவைகள் வழங்குனர்: விபரம்
## TELECOMMUNICATION PROVIDERS AND MOBILE OPERATORS : DETAILS

0385/'10

3. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සහ ජංගම දුරකථන සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ගේ නම්, මෙරටේදී ඔවුන් විසින් ගෙවන ලද කොටස් ප්‍රාග්ධනය සහ ඔවුන් ලැබූ ලාභය කොපමණද;

(iii) ඔවුන් ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කටයුතු කළ කාලය කොපමණද;

යන්න එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ස්ථාවර දුරකථන සේවා මෙහෙයුම්කරුවන් සහ ජංගම දුරකථන මෙහෙයුම්කරුවන්ගෙන් මාසිකව අය කරනු ලබන බදු ප්‍රමාණය කොපමණද;

(ii) පසු ගිය වසර පහක කාල සීමාව තුළ ජංගම සහ ස්ථාවර දුරකථන සේවා සපයන්නන්ගෙන් රජය උපයන ලද මුළු ආදායම කොපමණද;

(iii) පසු ගිය වසර හතරක කාල සීමාව තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වාර්ෂිකව උපයන ලද ලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

தபால், தொலைத்தொடர்புகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் இன்றுள்ள தொலைத்தொடர்பு வழங்குனர்கள் மற்றும் செல்லிடத் தொலைபேசி நடத்துனர்களின் எண்ணிக்கையையும்,

(ii) அவர்களின் பெயர், நாட்டில் அவர்கள் கட்டிய மூலதனப்பங்கு, மற்றும் அவர்களது இலாபங்கள் ஆகியவற்றையும்,

(iii) இலங்கையில் எவ்வளவு காலமாக அவர்கள் செயற்படுகிறார்களென்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(ஆ) (i) நிலையான தொலைபேசி செயற்படுத்துனர்கள் மற்றும் செல்லிடத் தொலைபேசி செயற் படுத்துனர்கள் மீது மாதமொன்றிற்கு விதிக்கப்படும் வரி எவ்வளவு என்பதையும்,

(ii) கடந்த ஐந்து வருடங்களாக, நிலையான மற்றும் செல்லிடத் தொலைபேசி களிலிருந்து அரசாங்கம் பெறும் மொத்த வருமானத்தை மாதாந்த அடிப்படையிலும்,

(iii) கடந்த நான்கு வருடங்களாக, ஸ்ரீலங்கா ரெலிகொம் பெற்ற இலாபத்தை வருடாந்த அடிப்படையிலும்

அவர் சபைக்கு தனித்தனியாகத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Posts and Telecommunication:

(a) Will he state separately -

(i) the number of Telecommunication Providers and Mobile Operators in Sri Lanka as of today;

(ii) their names, their paid up share capital of the country and their profits; and

(iii) how long they have been operating in Sri Lanka?

(b) Will he inform this House separately -

(i) the tax imposed on Fixed Line Operators and Mobile Operators per month;

(ii) the total Revenue that the Government gets on Mobile and Fixed Lines on per year basis for the last five years; and

(iii) the profit of Sri Lanka Telecom on per year basis for the last four years?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ)

(i) ස්ථාවර විදුලි සංදේශ සේවාවන් සපයන සංඛ්‍යාව - 04

ජංගම දුරකථන සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව - 05

(ii)

| | ස්ථාවර දුරකථන සේවා සපයන සමාගම | කොටස් ප්‍රාග්ධන (2009) | ලාභය (2009) මිලියන |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 1,804,860,000 | 1,232 |
| 02 | ලංකා බෙල් පෞද්ගලික සමාගම | 1,713,070,270 | (410) |
| 03 | සන්ටෙල් ලිමිටඩ් සමාගම | 3,855,924,900 | (563) |
| 04 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම | 5,314,182,030 | (2583) |
| | **ජංගම දුරකථන සේවා සපයන සමාගම්** | | |
| 01 | ඩයලොග් ටෙලිකොම් සමාගම | 1,990,921,000 | (9,210) |
| 02 | මොබිටෙල් පෞද්ගලික සමාගම | 9,942,380,000 | (395.32) |
| 03 | එටිසලාට් පෞද්ගලික සමාගම | 2,329,132,000 | (1,725) |
| 04 | හචිසන් ටෙලිකොම් සමාගම | 875,000,000 | (2,293) |
| 05 | භාරතී එයාටෙල් සමාගම | 5,255,964,000 | (3,746) |

(iii) මෙහෙයුම් කටයුතු කළ කාලය

| | ස්ථාවර දුරකථන සේවා සපයන සමාගම් | කාලය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ටෙලිකොම් | අවුරුදු 100 ට වැඩි |
| 02 | ලංකා බෙල් පෞද්ගලික සමාගම | අවුරුදු 14 |
| 03 | සන්ටෙල් ලිමිටඩ් සමාගම | අවුරුදු 14 |
| 04 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම | අවුරුදු 04 |
| | **ජංගම දුරකථන සේවා සපයන සමාගම්** | |
| 01 | ඩයලොග් ටෙලිකොම් සමාගම | අවුරුදු 17 |
| 02 | මොබිටෙල් පෞද්ගලික සමාගම | අවුරුදු 17 |
| 03 | එටිසලාට් පෞද්ගලික සමාගම | අවුරුදු 22 |
| 04 | හචිසන් ටෙලිකොම් සමාගම | අවුරුදු 16 |
| 05 | භාරතී එයාටෙල් සමාගම | අවුරුදු 03 |

(ආ)

| | | |
|---|---|---|
| (i) | වැට් බද්ද | 12% |
| | පරිසර ආරක්ෂක බද්ද | 2% |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 3% |
| | ස්ථාවර/ජංගම ග්‍රාහක බද්ද | 10% |

| | | |
|---|---|---|
| (ii) | වර්ෂය | රුපියල් |
| | 2005 | 900,000,000.00 |
| | 2006 | 2,050,000,000.00 |
| | 2007 | 2,250,000,000.00 |
| | 2008 | 12,433,496,283.00 |
| | 2009 | 12,762,336,062.00 |
| (iii) | වර්ෂය | ලාභය (රුපියල් මිලියන - වාර්ෂික වාර්තාවට අනුව) |
| | 2009 | 1232 |
| | 2008 | 6601 |
| | 2007 | 5388 |
| | 2006 | 5497 |

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිවරයා නොමැති නිසා ප්‍රශ්නය අහන්න ටිකක් අසීරු වෙනවා. නමුත් එය අදාළ ඇමතිවරයාට යොමු කරයි කියා මා විශ්වාස කරනවා. දැන් මේකෙන් පෙනෙනවා, දළ ලාභය කොතරම් ශීඝ්‍රයෙන් අඩු වෙලා තිබෙනවා ද කියන එක. 2006 වර්ෂයේ ලාභය රුපියල් මිලියන 5,497ක් තිබුණා. මේ අවුරුද්දේ ලාභය රුපියල් මිලියන 1,232යි. එම නිසා එය අලාභයකට පරිවර්තනය වෙලා තිබෙනවාය කියා පෙනෙන්නට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා ගන්නා පියවර මොකක්ද? මම හිතන විධියට ආණ්ඩුව තුළ තවමත් සියයට 50ක කොටස් ප්‍රමාණයක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අවශ්‍ය විස්තර සැපයීම සඳහා ඔබතුමාගේ ප්‍රශ්නය මම ඇමතිතුමාට යොමු කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ සභාවේ ඇමතිවරු නැත්තේ ඇයි?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉන්නවා නම් උත්තර දෙන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. ප්‍රශ්නවලට උත්තර දෙන්න අමාත්‍යවරු සිටියා නම් හොඳයි. නැත්නම් නියෝජ්‍ය අමාත්‍යවරයෙක්වත් සිටියොත් හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. මේ සම්බන්ධයෙන් සංශෝධනයක් කළා, වැඩි කිරීමෙන්. අඩු කරන්න තිබෙන යුගයක, වැඩි කරලාත් අලාභයක් තිබෙනවා නම් තව අඩු කරන්න කොයි ආකාරයෙන්ද වැඩ කටයුතු කරන්නේ කියන එක මම ගරු ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ පිළිබඳව විස්තර අපි ඉදිරි කාලයේදී ඉදිරිපත් කරන්නම්. අය වැය ලේඛනයත් ළඟදී එනවා. ඒ අනුව ගරු ඇමතිතුමා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැම එකක්ම අය වැයට තියන්න එපා. ඕකෙන් මෙලොව දෙයක් ලැබෙන්නේ නැත.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එහෙම නම් අපි 04 වන ප්‍රශ්නයට යමුද? [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔය කථාව අවුරුදු හයක් කිව්වා නේ. රටයි, මහ ජනයායි ලබන්න තිබෙන දේ ලැබුවා නේ. [බාධා කිරීම්] මා එය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, වැඩි විස්තර දීම සඳහා අදාළ ඇමතිවරයාට යොමු කරයි. ප්‍රශ්න අංක 04ට යමු.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ඉදි කළ නිවාස : විස්තර
## புத்தளம் மாவட்டத்தில் உள்வாரியாக இடம்பெயர்ந் தோருக்கென நிர்மாணிக்கப்பட்ட வீடுகள் : விபரம்
## HOUSES BUILT FOR INTERNALLY DISPLACED PERSONS IN PUTTALAM DISTRICT : DETAILS

0461/'10.

4. **ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
නැවත පදිංචිකිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) උතුරු පළාතේ පදිංචිව සිටි දැනට පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය, මුන්දලම, වනාතවිල්ලුව සහ පුත්තලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අභ්‍යන්තර අවතැන් වූවන් ලෙස පදිංචි වී සිටින ජනතාව වෙනුවෙන් ලෝක බැංකු නිවාස ආධාර යටතේ වර්ෂ 2007 සිට මේ වන තෙක් සම්පූර්ණයෙන් ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිවාස ඉදි කිරීම් සඳහා වියදම් කරන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම පදිංචිකරුවන් සඳහා නිවාස ඉදි කිරීමට මූලාධාර පිරිනැමීමේදී අනුගමනය කරන ලද පිළිවෙත කවරේද;

(iv) එය වාරික වශයෙන් ලබා දුන්නේ නම් එක් එක් වාරිකය සඳහා ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) එම ලෝක බැංකු නිවාස ආධාර වැඩසටහන යටතේ මුදල් පිරිනමන ලද පුද්ගලයින්ගේ නම්, ලිපිනයන්, දිනයන් සහ වවුචර් පත් අංකයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

மீள் குடியேற்ற அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமாகாணத்தில் குடியிருந்து தற்போது புத்தளம் மாவட்டத்தில் கல்பிட்டி, முந்தல், வனாத்தவில்லுவ மற்றும் புத்தளம் ஆகிய பிரதேச செயலாளர் பிரிவுகளில் உள்வாரியாக இடம்பெயர்ந்த பதிவு செய்யப்பட்டுள்ள மக்களுக்கென உலக வங்கி வீடமைப்பு உதவித் திட்டத்தின் கீழ் 2007ஆம் ஆண்டு தொடக்கம் இதுவரை முழுமையாக நிர்மாணிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாதென்பதையும்,

(ii) இந்த ஒவ்வொரு வீடமைப்புக்குமாக செலவு செய்யப்பட்ட முழுத் தொகை யாதென்பதையும்,

(iii) இக்குடியிருப்பாளர்களுக்கு வீடமைப்புக்கான நிதியுதவி வழங்குகையில் கடைப்பிடிக்கப்பட்ட நடைமுறை யாதென்பதையும்,

(iv) இது தவணை அடிப்படையில் வழங்கப்பட்டிருப்பின் ஒவ்வொரு தவணையிலும் வழங்கப்பட்ட தொகை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இந்த உலக வங்கி வீடமைப்பு உதவித் திட்டத்தின் கீழ் நிதி வழங்கப்பட்ட நபர்களின் பெயர், முகவரி, திகதி மற்றும் செலவுச் சீட்டு இலக்கம் ஆகியவற்றை பிரதேச செயலாளர் பிரிவு வாரியாக அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Resettlement :

(a) Will he state -

(i) the number of houses completed under the World Bank Housing Aid Programme from 2007 up to now, for the people who have been residing as internally displaced persons in the Divisional Secretaries' Divisions of Kalpitiya, Mundalama, Vanathawilluwa and Puttalam in the Puttalam District;

(ii) the total amount spent on construction of each of those houses;

(iii) the procedure followed in granting financial aid to those settlers for the construction of houses; and

(iv) if that was provided in instalments, the amount paid for each instalment?

(b) Will he state on Divisional Secretary's Division basis, the names and addresses of the people who were granted money under the World Bank Housing Aid Programme, the dates they were granted money and the numbers of the vouchers?

(c) If not, why?

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

(අ) (i) නිම කළ නිවාස සංඛ්‍යාව

a. නව නිවාස ඉදි කිරීම:

ලබා දෙන ලද නිවාස 4,460න් 2010 සැප්තැම්බර් මසට නිවාස 2,218ක ඉදි කිරීම් කටයුතු නිම කර ඇත.

b. නිවාස අලුත්වැඩියා කිරීම්

ලබා දෙන ලද නිවාස 778න් 2006 සැප්තැම්බර් මසට නිවාස 314ක් ඉදි කිරීම් කටයුතු නිම කර ඇත.

(ii) එක් එක් නිවාස සඳහා වැය කළ මුදල

a. නව නිවාස ඉදි කිරීම් රු.325,000.00

b. නිවාස අලුත්වැඩියා කිරීම් රු.100,000.00

(iii ) තෝරා ගැනීමේ කටයුතු /ක්‍රමය

අදියර 01

සුභ සාධක මධ්‍යස්ථානවල තේරීම්/වර්ග කිරීම

පුත්තලම නිවාස යෝජනා ක්‍රමය පහත සඳහන් කරුණු 03ක් මූලික කර ගෙන සුභ සාධක මධ්‍යස්ථාන වර්ග කර ඇත.

I. පොල් අතු නිවාස ප්‍රතිශතය

II. ඉඩම්වලට හිමිකම් ලබා තිබෙන ප්‍රතිශතය

III. UNHCR ආයතනය 2006 වර්ෂයේදී සිදු කරන ලද සංගණනයේදී පුත්තලම් දිස්ත්‍රික්කයේ පදිංචිවීමට කැමැත්ත ප්‍රකාශ කළ අයගේ ප්‍රතිශතය.

අදියර 02

සුභ සාධක මධ්‍යස්ථානවල පදිංචි පවුල්වලට නිවාස ආධාර ලබා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

a. ඉඩම් සඳහා ඔප්පු තිබිය යුතුය.

b. අදාළ පවුල් සුභ සාධන මධ්‍යස්ථානයේ ජීවත් විය යුතුයි. (2006 වර්ෂයේ UNHCR සමීක්ෂණයට අනුව)

c. පුත්තලම දිස්ත්‍රික්කයේ ස්ථිර නිවාසයක් ලබා නොතිබිය යුතු අතර, තමාගේ ස්ථිර පදිංචි ස්ථානයේ මෙවැනි ආධාර ලබා නොතිබිය යුතුයි.

d. 2006 අප්‍රේල් මාසයේදී අදාළ සුභ සාධන මධ්‍යස්ථානයේ ඉඩම් ලබා තිබිය යුතු අතර, අදාළ සුභ සාධන මධ්‍යස්ථානයේ තාවකාලික හෝ අර්ධ ස්ථිර නිවසක් තබා තිබිය යුතුය.

(2006 අප්‍රේල් මාසයේ UNHCR සමීක්ෂණයට අනුව)

(iv) නිවාස යෝජනා දීමනා ක්‍රමය

**දීමනාව** **සියලුම දීමනා කාර්මික නිලධාරින්ගේ නිර්දේශයෙන් පසු ලබා දෙනු ලැබේ.**

| **තාවකාලික නිවාස දීමනා රු.325,000.00** | **මුදල රු.** | **ඉලක්කය** |
|---|---|---|
| පළමුවන අදියර දීමනාව | 50,000.00 | වැඩ ආරම්භයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම, අත්තිවාරම් කැපීම 4" කොන්ක්‍රීට් දැමීම (1:3:6) 500 වර්ග අඩි ප්‍රමාණ සහිත නිවාස සඳහා ද, වැසිකිළිය සඳහා ද (බිම් ඇතුළු) අත්තිකාරම් වැඩ නිම කිරීම සඳහා ලබා දේ. |
| දෙවන අදියර දීමනාව | 60,000.00 | නිවසක් සඳහා ද, වැසිකිළි තැනීම සඳහා, ලිංටල්, වහල දක්වා වූ බිත්ති වැඩ නිම කිරීම සඳහා ලබා දෙනුලැබේ. |
| තුන්වන අදියර දීමනාව | 30,000.00 | නිවාස සඳහා වූ දොර, ජනෙල් හා උළුවහු හා වැසිකිළි උළුවහු තැබීම සඳහා ලබා දෙනු ලැබේ. |
| හතරවන අදියර දීමනාව | 75,000.00 | නිවාස හාවැසිකිළිවලට වහල සැදීම සඳහා |
| පස්වන අදියර දීමනාව | 50,000.00 | නිවසේ ඇතුළු බිත්ති සහ වැසිකිළි බිත්ති වලට කපරාරු සහ බිමට කොන්ක්‍රීට් දමා සිමෙන්ති දැමීම සඳහා |
| හයවන අදියර දීමනාව | 40,000.00 | නිවසේ සියලුම දොරවල් හා වැසිකිළි දොර ජනේල, ග්‍රිල් ඇතුළු වැඩ නිම කිරීම සඳහා |
| හත්වන අදියර දීමනාව | 20,000.00 | වැඩ සම්පූර්ණයෙන් නිම කළ පසු ලබා දෙනු ලැබේ. |

| **අර්ධ නිවාස දීමනාව 100,000/=** | **මුදල රුපියල්** | **ඉලක්කය** |
|---|---|---|
| පළමුවන අදියර දීමනාව | 50,000.00 | වැඩ ආරම්භ කර ද්‍රව්‍ය ලබා ගෙන සූදානම් වීම සඳහා |
| දෙවන අදියර දීමනාව | 50,000.00 | ලබා දෙන ලද උපදෙස් අනුව සම්පූර්ණ කළ යුතු වැඩ නිම කිරීම සඳහා ලබා දෙනු ලැබේ. |

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මේකයි. කොයි අයටද දැනට දෙන්න තිබෙන්නේ?

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)
ප්‍රශ්න තිබෙන ඒවායේ. කල්පිටියේ සහ පුත්තලමේ -ඒ දෙකේම- දැනට දීලා ඉවරයි. තව ප්‍රශ්න තිබෙන අයට අපි කියලා තිබෙනවා, එවන්නය කියලා. අපි වෙනම කොමිටියක් පත් කරලා තිබෙනවා, ඒ අයට ලබා දෙන්න.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
Third phase එක තවම පටන් ගත්තේ නැහැ. දැන් ප්‍රශ්නය මේකයි. මේ කට්ටිය ආපහු මන්නාරමට පදිංචියට යන නිසා World Bank නිවාස ආධාර හරි දෙන්න ඕනෑ.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)
දෙන්න පුළුවන්. එහේ පදිංචියට යද්දී අපි දෙනවා.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
ඒකට මොනවා හරි තීරණයක් ගන්න ඕනෑ.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)
එහෙම කර දෙන්නම්.

**ගරු නූර්දීන් මෂූර් මහතා**
(மாண்புமிகு நூர்டீன் மசூர்)
(The Hon. Noordeen Mashoor)
බොහොම ස්තුතියි.

## උතුරු සහ නැඟෙනහිර පළාත්වල ඉන්ධන පිරවුම්හල් : විස්තර

வடக்கு மற்றும் கிழக்கு மாகாண எரிபொருள் நிரப்பு நிலையங்கள்: விபரம்

PETROL STATIONS IN NORTHERN AND EASTERN PROVINCES: DETAILS

0435/'10

7. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල ක්‍රියාත්මකව පවතින මුළු ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් ඉන්ධන පිරවුම්හල් අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු

තෙල් සමාගම සහ වෙනත් ආයතන යටතේ ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 ජනවාරි මස 01 වැනි දිනට පසු විවෘත කරන ලද ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අලුතින් විවෘත කරන ලද ඉන්ධන පිරවුම්හල් පවත්වාගෙන යාමට ඉඩ ලබා දී ඇති පාර්ශ්වයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ)(i)හි සඳහන් ඉන්ධන පිරවුම්හල් මඟින් පසු ගිය මාස 12 තුළ එක් එක් මාසයේදී අලෙවි කරන ලද පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් ආදී ඉන්ධන ලීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම් ඒ මන්ද?

பெற்றோலியக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் இயங்கும் எரிபொருள் நிரப்பு நிலையங்களின் மொத்த எண்ணிக்கையையும்,

(ii) மேற்குறிப்பிட்டவற்றுள், இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் (சி.பி.சி., இலங்கை இந்திய எண்ணெய்க் கூட்டுத்தாபனம் (எல்.ஐ.ஓ.சி.) மற்றும் ஏனையவர்களினால் நடத்தப்படும் நிலையங்களின் எண்ணிக்கையை தனித்தனியாகவும்,

(iii) 2010, ஜனவரி 01 ஆம் திகதிக்குப் பின்னர் திறக்கப்பட்ட எரிபொருள் நிரப்பு நிலையங்களின் எண்ணிக்கையையும்,

(iv) எத்தரப்பினருக்கு புதிதாக திறக்கப்பட்ட எரிபொருள் நிரப்பு நிலையங்கள் வழங்கப்பட்டன என்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஆ) மேற்படி (அ) (i) இன் பிரகாரம் எரிபொருள் நிரப்பு நிலையங்களினால் கடந்த 12 மாதங்களில், மாதமொன்றுக்கு விற்பனை செய்யப்பட்ட, பெற்றோல், டீசல், மண்ணெண்ணெய் ஆகியவற்றின் லீற்றர் அளவை வெவ்வேறாக இவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், என்?

asked the Minister of Petroleum Industries:

(a) Will he state-

(i) the total number of petrol stations operating in the Northern and Eastern Provinces;

(ii) out of the above, the number of stations operating under CPC (Ceylon Petroleum Corporation), LIOC (Lanka Indian Oil Corporation) and others, separately;

(iii) the number of petrol stations opened after 01, January 2010;

(iv) the parties to whom the newly opened CPC petrol stations were given?

(b) Will he inform this House separately the number of litres of petrol, diesel, kerosene oil, etc sold per month for the last 12 months by the petrol stations as per (a) (i) ?

(c) If not, why ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

(අ) (i) පිරවුම්හල් 156යි.

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - පිරවුම්හල් 147.

ලංකා ඉන්දියානු තෙල් සමාගම - පිරවුම්හල් 09.

(iii) උතුරු පළාත - පිරවුම්හල් 01

නැඟෙනහිර පළාත - පිරවුම්හල් 02යි.

(iv)

| පළාත | පිහිටි ස්ථානය | බෙදුම්කරුගේ නම |
|---|---|---|
| උතුරු පළාත | (පිරවුම් හල් 01) තුනුක්කායි-මල්ලාවි | ඒ.සී.අලි සාබ්‍රි |
| නැඟෙනනහිර පළාත | කින්නියා | ඉස්ලාම් සේවා සමාජය (Islamic Service Society) |
| | (පිරවුම් හල් 02) පොතුවිල් | එස්.ඒ.නස්රත් අලි |

(ආ) කරුණාකර ඇමුණුම 01 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි. (ඉදිරිපත් කර ඇති සංඛ්‍යා දත්ත ලීටර්වලින් දක්වා ඇත.)

(ඇ) පැන නොනඟී.

ගරු මන්ත්‍රීතුමනි, ඉහත (අ)(i) සඳහන් ඉන්ධන පිරවුම් හල් මඟින් මාස 12 තුළ එක් එක් මාසයේදී අලෙවි කරන ලද පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් ආදී ඉන්ධන ලීටර් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණ ද කියලායි ඔබතුමා මෙම ප්‍රශ්නයේ (ආ) කොටසෙන් අසා තිබෙන්නේ. ඒ සියලුම තොරතුරු පරිගණක දත්ත සමඟ මා ළඟ තිබෙනවා. Total කර නැහැ. එකින් එකට වෙන වෙනම තිබෙනවා. දැන ගැනීම පිණිස මා ඔබතුමාට එය එවන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමා, මාසයෙන් මාසයට ඉන්ධන පාවිච්චි කිරීමේ වර්ධනයක් තිබෙනවා ද කියා ඔබතුමාට කියන්නට පුළුවන් ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ඉන්ධන හල් 156 යේම තොරතුරු මෙහි තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. උදාහරණයක් වශයෙන් නලලූර් පිරවුම් හල ගත්තොත්, එහි බෙදුම්කරු කේ. තේවගුරුනාදන් යන අයයි. 2009 ඔක්තෝබර් මාසයේ Lanka Petrol 90 Octane ලීටර් 26,400යි. ඊ ළඟට නොවැම්බර් මාසයේ ලීටර් 23,100යි. දෙසැම්බර් මාසයේ ලීටර් 19,800යි. Lanka Auto Diesel ගත්තොත්, 2009 ඔක්තෝබර් මාසයේ ලීටර් 19,800යි. නොවැම්බර් මාසයේත් ඒ ලීටර් ප්‍රමාණයමයි. දෙසැම්බර් මාසයේ ලීටර් 13,200යි. අනෙක් පැත්තෙන් Lanka Kerosene ගත්තොත්, 2009 ඔක්තෝබර් මාසයේ ලීටර් 13,200යි. නොවැම්බර් මාසයේ ලීටර් 36,300යි. දෙසැම්බර් මාසයේ ලීටර් 19,800යි.

***පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ වර්ධනයක් නැහැ. ආර්ථික -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ. ඔබතුමාට මම පෙන්නුවේ නල්ලූර් පිරවුම් හලේ විස්තර. එකේ වාවාකච්චේරි පිරවුම් හල ගත්තොත් ඔක්තෝබර් මාසයේ Lanka petrol 90 Octane ලීටර් 26,400යි. නොවැම්බර් මාසයේ ලීටර් 29,700යි. දෙසැම්බර් මාසයේ ලීටර් 39,600යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකයි මට අවශ්‍ය වන්නේ. ඒ වර්ධනය තියෙනවා නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක පිහිටි ස්ථානය අනුව වෙනස් වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සමස්තයක් වශයෙන් බැලුවොත් උතුරු නැඟෙනහිර වර්ධනයක් තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
තිබෙනවා. ඒ වාගේම දැන් මෙහි සඳහන් නොවුණු ඒ-9 මාර්ගයේ පිරවුම් හල් දෙකක් ආරම්භ කරලා තිබෙනවා. ඒ දෙකම MPCS පිරවුම් හල්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, තව කරුණු දෙක තුනක් දැන ගන්න අවශ්‍යයි. දැන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකා විදුලිබල මණ්ඩලයට තෙල් විකුණනවා. ලංකා විදුලිබල මණ්ඩලය කියනවා මිලියන 200ක ලාභයක් තිබුණා කියලා. මීට පෙර හිටපු ඇමතිතුමා වශයෙන් ඔබතුමාට කියන්න පුළුවන්ද, මෙහේ අලාභයට විකුණලා එහේ ලාභයක් ඇති කරන මේ ප්‍රතිපත්තිය රජයේ ප්‍රතිපත්තියක්ද, නැත්නම් ඒ ඇමතිතුමාගේ ප්‍රතිපත්තියක්ද කියලා? මොකක්ද මේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු මන්ත්‍රීතුමනි, 2008 අය වැය ලේඛනයෙන්ම යෝජනාවක් හැටියට ඉදිරිපත් කළා, විශේෂයෙන්ම විදුලි බලය නිෂ්පාදනය කිරීමට යොදා ගන්නා දැවි තෙල් - furnace oil - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් සහනදායී මිලට විදුලි බල අංශයට දෙන්න කියලා. ඒ ප්‍රතිපත්තිමය තීන්දුව මත තමයි 2009 - 2010 වර්ෂයේ furnace oil දී ගෙන ආවේ. මුලින් furnace oil ලීටර් එකක පිරිවැය -cost එක- රුපියල් 51ක් වුණා. එහෙම වුණත් ලංකා විදුලි බල මණ්ඩලයට දුන්නේ රුපියල් 25 ගණනේ. පෞද්ගලික අංශයට දුන්නේ රුපියල් 31 ගණනේ. හැබැයි මේ අවුරුද්දේ අපේ නව ඇමතිවරයා පත් වුණාට පස්සේ, භාණ්ඩාගාරයත් එක්ක සාකච්ඡාවක් කරලා 2009 දෙසැම්බර් 31 දක්වා විදුලිබල අංශයෙන් අපට ලැබීමට තිබූ මුළු මුදල තුලනය කර ගැනීමේ වැඩ පිළිවෙළකට යනවා. මේ අවුරුද්දේ සැප්තැම්බර් පළමුවන දා ඉඳලා අපි දැවි තෙල් ලීටරයක මිල සංශෝධනය කළා, රුපියල් 40 දක්වා. Furnace oil අඩුවට දීම නිසා අගෝස්තු 31 වන දා දක්වා මසකට ලැබූ මිලියන 2,400ක පාඩුව මේ වන කොට අඩු කර ගෙන ඒ පාඩුවෙන් භාගයක් දක්වා ගෙනැල්ලා තිබෙනවා. අපි භාණ්ඩාගාරයට යෝජනා කරලා තිබෙනවා, ජනවාරි මාසයේ ඉඳලා අපේ පිරිවැයටම -අපට වැය වන මුදලටම- ඒ අංශවලට ඉන්ධන ලබා දෙන්නය කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, දැන් අතුරු ප්‍රශ්න තුනක් අහලා ඉවරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ප්‍රශ්න තුනක් අහලා ඉවරයි කියා ඔබතුමා කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තව එක ප්‍රශ්නයක් අහන්නකෝ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. අද තෙල් මිල ශීඝ්‍රයෙන් අඩු වෙලා තිබෙනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, මම දින පතා මේක check කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි අද ලීටරයක මිල රුපියල් 81යි කියමුකෝ. ඊට සුමාන දෙකකට ඉස්සෙල්ලා තිබුණේ රුපියල් 70ට නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඒ අවස්ථාවේදී ඒ වරප්‍රසාදය -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ලීටරය රුපියල් 74 ඉඳලා ක්‍රමානුකූලව වැඩි වෙලා අද වන කොට රුපියල් 81ක් වෙලා තිබෙනවා. සතියක් තුළ රුපියල් 81ක් වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලීටරය රුපියල් 56ට තිබෙන මේ ඉන්ධන රුපියල්115ට විකුණලා ඔබතුමන්ලා අධික ලාභයක් ලබනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ. ඒක සම්පූර්ණයෙන් වැරදියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ අංක ගණිතය අනුව මේක amortize කරලා සියලුම පව් පාරිභෝගිකයන් පිටට දමන්න හදනවා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකරලා කියන්න, කොයි ආකාරයෙන්ද තෙල් මිල අඩු කරන්න පුළුවන් වෙන්නේ කියලා. ඇයි ඒක කරන්නේ නැත්තේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔබතුමා මීට පෙර දිනයකදී ප්‍රශ්නයක් පැන නැඟුවා, Indian Oil Company එක මේ වන කොටත් තෙල් මිල වැඩි කරන්න ඉල්ලීමක් කරලා තිබෙනවා නේද කියලා. තෙල් සංස්ථාව අයිති රජයට නේ. අපි ඒක පැත්තකින් තියමුකෝ. එතකොට Indian Oil Company එක මිල වැඩි කරන්න ඉල්ලුවේ ඇයි? මොකද, ලෝක වෙළෙඳ පොළේ මිල ගණන් අනුව - [බාධා කිරීමක්] මිල සමීකරණය අනුව ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්] ඔව්. හරි. නමුත් පෙට්‍රල් සඳහා පමණයි රුපියල් 25ක tax එකක් තිබෙන්නේ. ඩීසල් සඳහා tax එක රුපියල් 2යි. Kerosene සඳහා රුපියල් 1.50යි. ඒවාට ඒ tax එක නැහැ. මේ රුපියල් විසිපහේ tax එක අද ඊයේ දමපු එකක් නොවෙයි. අපේ කරු ජයසූරිය හිටපු ඇමතිතුමාත් දන්නවා ඇති, මිල සමීකරණය ඉදිරිපත් කරපු අවදියේ ඉඳලාම ඒ රුපියල් විසිපහේ tax එක තිබුණා. ඕනෑම පාරිභෝගික භාණ්ඩයකට රජයක් විසින් බද්දක් අය කරනවා. බදු අය නොකර රාජ්‍ය සේවය පවත්වා ගෙන යන්න බැහැ. රජයක් අවශ්‍ය මුදල් ප්‍රමාණය උපයා ගන්නේ බදු අය කිරීමේ පදනම මත. අපි දැනට විවිධ රජයන් සමඟ සාකච්ඡා පවත්වනවා. ඉදිරි කාලය තුළ දී ලෝක වෙළෙඳ පොළේ පවතින මිල ගණන්වලට වඩා සහනදායී මිලකට තෙල් තොග වශයෙන් ලබා ගන්නට මා බලාපොරොත්තු වනවා. ඒ ප්‍රයත්නය සාර්ථක වුණොත් ඉදිරි කාලය තුළදී අපි ඒ සම්පූර්ණ වාසිය පාරිභෝගිකයාට දෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හෙජින් ගිවිසුම නිසා නොවේද ඔබතුමන්ලාට මෙච්චර අලාභයක් -

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මහ බැංකුවේ අධිපති, - [බාධා කිරීමක්] ඒ වරදින් රුපියල් මිලියන 11,000ක විතර අලාභයක් ලැබුවත් සරත් ෆොන්සේකා අද කරපු නැති වරදකට හිර ගෙදර ඉන්නවා. [බාධා කිරීම්]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමනි, හෙජින් ගනු දෙනුවේදී සිදු වෙච්ච අලාභයන් මේ වනතුරු තෙල් සංස්ථාවේ ලාභ අලාභ ගිණුමට එකතු කරලා නැහැ. [බාධා කිරීමක්] කළ යුතුව තිබෙනවා. නමුත් කරලා නැහැ. මා ඔබතුමාට පැහැදිලි කරන්නම්. මම මේ දිනවල නැවත ගිණුම් සියල්ල සකස් කර ගෙන යනවා. 2008, 2009 වර්ෂවලටත් අදාළව නැවත ගිණුම් සකස් කර ගෙන යනවා, ඒවාට provision තියලා. මේ අවසාන ගිණුම් සකස් කර අවසන් වන කොට ඒකේ සම්පූර්ණ ලාභ අලාභය කුමක්ද කියන එක ඉදිරි කාලය තුළදී පවසන්නට මට පුළුවන් වේවි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අලාභය ඔබතුමා දරන්න එපා මහ බැංකුවට දමන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
අපි ඒ අවස්ථාවේ දී ඒක තීන්දු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. බොහොම පැහැදිලියි. [බාධා කිරීමක්] දැන් ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා.

## වරප්‍රසාද යෝජනාව
## *சிறப்புரிமைப் பிரேரணை*
## PRIVILEGE MOTION

### I

### පාර්ලිමේන්තු සහ කාරක සභා රැස්වීම්වලට නියමිත වේලාවට සහභාගි නොකිරීම
பாராளுமன்ற மற்றும் குழு அமர்வுகளில் குறித்த நேரத்தில் சமுகமளிக்க முடியாமற்செய்தல்
DISABLING PARTICIPATION IN PARLIAMENTARY SITTINGS AND COMMITTEES ON TIME

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සරත් ෆොන්සේකා මහතා විසින් 2010 අගෝස්තු මස 20 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය."

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

## 2010.08.18 දින "ඩේලි නිව්ස්" වාර්තාව
## 2010.08.18 ஆந் திகதிய "டெய்லி நியூஸ்" அறிக்கை
## "DAILY NEWS" REPORT OF 18.08.2010

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් 2010 අගෝස්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුය."

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් පිළිබඳව කථා කරන්නට තිබෙනවා, ඔබතුමා අවසර දෙනවා නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔව්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන්ම කියන්න කැමැතියි ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ගැන අපේ සම්පූර්ණ අවධානය අපි යොමු කළ යුතුව තිබෙන බව. ඒ නිසා බන්ධනාගාරයේ ඉඳලා මහාධිකරණයට යන කොටත්, ආපසු එන කොටත් සරත්ෆොන්සේකා මන්ත්‍රීතුමාට STF ආරක්ෂාව ලබා දෙන්නය කියලා නියෝගයක් කරන මෙන් මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මම ඊයේ බන්ධනාගාරයට ගිය අවස්ථාවේදී මට එතුමාගෙන් දැන ගන්න ලැබුණා එහෙම කිසිම ආරක්ෂාවක් නැහැ, බන්ධනාගාර රථය විතරයි යන්නේ කියලා. ඒක හොඳ නැහැ. මා හිතන්නේ එතැනට අපි ආරක්ෂාවක් දෙන්න ඕනෑ. අපේ පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් මම පොඩි ඉල්ලීමක් කරනවා, බන්ධනාගාර ආඥාපනතේ 59 වැනි වගන්තියේ තිබෙන පහසුකම් පුළුවන් නම් එතුමාට ලබා දෙන්න කියලා. ඒකයි අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් කිව්වේ. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඔබතුමාට පුළුවන් නියෝගයක් දෙන්න කේපීට දෙන හැම පහසුකමක්ම සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමාටත් දෙන්න කියලා. එහෙම කළොත් මේ ඔක්කොම ප්‍රශ්න ඉවරයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු ඇමතිතුමාට පුළුවන් ඒ ප්‍රශ්නයට අවධානය යොමු කරන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

STF security must be given when he goes to High Court and comes back .

**ගරු ඩිව් ගුණසේකර මහතා**
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු කථානායකතුමනි, බන්ධනාගාරය ඇතුළත අවශ්‍ය සියලුම ආරක්ෂක කටයුතු පිළියෙල කර තිබෙනවා. මම විශේෂයෙන්ම ඒ පිළිබඳව උපදෙස් දීලා තිබෙනවා. විශේෂයෙන්ම අද උදේ බන්ධනාගාරයේ ඉඳලා උසාවියට ගෙන යන අතරතුර නියෝජ්‍ය පොලිස්පතිතුමා - DIG - කැඳවලා අවශ්‍ය පියවර සියල්ලම අරගෙන තිබෙනවා. [බාධා කිරීමක්] බන්ධනාගාරයේදී විශේෂ ආරක්ෂාව ඇතිව විශේෂිතව සලකන්නය කියන එක ගැනත් කියන්නම්. සිරකාරයන් සියලු දෙනාටම සමානව සලකන්නේ. හැබැයි වෛද්‍යවරයා කියනවා නම් විශේෂ පහසුකම් සලසන්න ඕනෑය කියලා, මගේ ළඟ මේ තිබෙනවා ඒ Ordinance එක, ඒක යටතේ ඒ පහසුකම් සලසන්න ඉඩකඩ තිබෙනවා. එතුමා කියනවා නම් ඒ අවශ්‍ය පහසුකම් සලස්වන්නම්. එහෙම නැත්නම් සියලු දෙනාටම සමානව තමයි සලකන්නේ. තමුන්නාන්සේ ඇමතිවරයකු වශයෙන් ඉන්න කාලයේ මමත් හිරේ හිටියා. කන්නවත් දුන්නේ නැහැ. කාටවත් බලන්න දුන්නේත් නැහැ. අපිට ඒ අත් දැකීම තිබෙනවා. නමුත් අපි හරියට කටයුතු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. දැන් ප්‍රධාන කටයුතු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එතුමා කිව්වේ කේපීට දෙන පහසුකම් දෙන්නය කියලායි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් අනවශ්‍ය විධියට මැදිහත් වෙනවා. [බාධා කිරීමක්] ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ,- [බාධා කිරීමක්] ඔව්, ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා මේ ඉස්සරහ තිබෙන ground එක පාර්ලිමේන්තුවට අයිති ground එකක් බව. දැන් ඒක මඩ වළක් වෙලායි තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක අයිති නාගරික සංවර්ධන අධිකාරියට.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
හරි. ඉතින් කථානායකතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්නකෝ. ඒකට ඔබතුමා උත්තර දීලා හරි යනවායැ? ගරු කථානායකතුමනි, ඒ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. ඒ වාගේම එතැන සංගීත සන්දර්ශන සහ නොයෙක් ආකාරයේ විවිධ වැඩසටහන් පවත්වනවා. මේ පාර්ලිමේන්තුවට තිබෙන ආරක්ෂාව පිළිබඳවයි මා කියන්නේ. මෙතැන මන්ත්‍රීවරු යන එන තැන. විවිධ මිනිස්සු එතැන ඉන්නවා. ඒ කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම මේ පිළිබඳව යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරලා පාර්ලිමේන්තුවේදී අපිට කියන්න මේ ground එක අයිති අපිටද, වෙන කාටවත්ද කියලා. මා දන්නා පිළිවෙළට නම් අපටයි අයිති. මා දන්නේ නැහැ ඔබතුමා වෙන කාටවත් දීලා තිබෙනවාද කියලා. මේ ground එකේ තිබෙන තත්ත්වය බලන්න. මේ ප්‍රදේශයේ මිනිසුන් ඔක්කෝම එන්නේ ඒකට. දැන් ඒක මඩ ගොඩක්. යන්න බැහැ. කරුණාකර ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය මා යොමු කරවනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම.

## සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත
## குடியியல் வான்செலவு சட்டமூலம்
## CIVIL AVIATION BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ. භා. 1.43]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම "සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතුය"යි යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි, මේ පිළිබඳ විවාදය අවසානයේදී කාරක සභා අවස්ථාව වෙනත් දිනයකට කල් තබන්න අපි බලාපොරොත්තු වන බව. දැන්, වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු දයාශ්‍රිත තිසේරා මැතිතුමා පනත් කෙටුම්පත පිළිබඳ විස්තරයක් කරනවා ඇති. [බාධා කිරීම්]

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, we can refer it to the Consultative Committee.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
There are other matters that come up at the Consultative Committee.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, that will be a special meeting for this purpose. That is all.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Then, are you going to restrict the debating time today if it is going before a Consultative Committee for further discussion?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
If you are agreeable, we can restrict the time.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
So, what is the time frame? We will have to inform that to the Speaker.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
How many speakers do you want?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Basically, we have two.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
They also might want to speak.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
So, four speakers and three from us.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes. What is the adjournment time because we need time? But, we will also have the opportunity of speaking once again after it comes back from the Consultative Committee.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
That is at the Committee Stage discussion. Is it?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
So, we will come back for the Committee Stage discussion.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
So, we have the right to speak and make any comments even after that. We reserve the right.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
In the Committee Stage discussion, anyone can raise a question, move an amendment or speak a few words. But, you cannot make long speeches there.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
So, why are we going to the Committee Stage? Can we not come back to the House? Thereafter, we can refer it to the Committee Stage because there maybe certain other contributions to be made.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අපි මේ විවාදය - [බාධා කිරීමක්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Standing Committee එකකට යොමු කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තහනමක් නැහැ. නමුත් සම්ප්‍රදායයක් හැටියට ගිහිල්ලා තිබුණා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සාමාන්‍යයෙන් අපි -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මෙහි විවාද කරලා ආපහු -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, කාරක සභා අවස්ථාවේදී -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Standing Committee එකට දැම්මා නම් හරි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අද මේ පනත් කෙටුම්පත කාරක සභා අවස්ථාවට යොමු කරන්නේ නැතිව එය පසු දිනකට කල් දමනවා නම් ගැටලුවක් මතු වනවා. විවාදයේදී අප ඉදිරිපත් කරන කරුණු පදනම් වනවා, කාරක සභා අවස්ථාවේ ඉදිරිපත් කරන සංශෝධන මත. එක්කෝ ඒ සංශෝධන අපට දැන් දෙන්න ඕනෑ. සංශෝධන ගන්නේ පස්සේ අවස්ථාවක නම්, කාරක සභා අවස්ථාව පසු දිනකට යනවා නම්, ඒ සංශෝධන නැතිව අපි දැන් කොහොමද කථා කරන්නේ? මොකද, මේ විවාදයේදී අපි නඟන තර්ක, ගොඩ නඟන කරුණු කාරක සභා අවස්ථාවත් එක්ක සම්බන්ධ වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී මේ පිළිබඳ උපදේශක කාරක සභාව රැස් වුණා, අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය යළිත් සැලකිල්ලට ගන්න තමයි කාරක සභාවක් වෙත යළිත් යොමු කරන්නේ. මේ කියන කරුණු ඉදිරිපත් කරන්න අවශ්‍ය නම් ඒ අවස්ථාවේදී රජය සාකච්ඡා කරලා කාරක සභා අවස්ථාව ආරම්භ කරන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒකේ කිසිම ගැටලුවක් නැහැ. ගරු කථානායකතුමනි, කාරක සභා අවස්ථාවේ ඉදිරිපත් කරන සංශෝධන අනුව තමයි එහි හරි වැරැද්ද බලපාන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඉදිරිපත් කරන දේ මොකක්ද කියලා අපි දන්නේ නැහැ නේ. ඔබතුමා ඉදිරිපත් කරන දේ අපි තවම දන්නේ නැහැ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා ඉදිරිපත් කරන සංශෝධන තවම අප දන්නේත් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි ඉදිරිපත් කරලා ඉවරයි. ඊයේ අප සාකච්ඡාවට ලක් කළා. ඔබතුමා ඊයේ හිටියේ නැහැ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා හිටියා. ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa )
ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් ලබා දෙන්න. අපි විරුද්ධ පක්ෂයේ ඉන්දෙද්දී එදා ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ ඇමතිතුමා මේ විධියටම Anti-dumping and Countervailing Duties Bill එක ගෙනාවා. එදා ඒ ගැන විවාදය යද්දී අප එතුමාගෙන් ඉල්ලා සිටියා, විවාද කරලා ඒ පනත් කෙටුම්පත සම්මත නොකර ඒකට සංශෝධන ගේන එක නැවත වෙන දවසකට දාන්න කියලා. ඒ ගැන පූර්වාදර්ශ ඕනෑ තරම් තිබෙනවා. ඒ විධියට මේ පාර්ලිමේන්තුවේ විවාද කරලා සම්මත නොකර ඊ ළඟ දිනවලට ගිහිල්ලා තිබෙනවා. ඒ අවශ්‍ය සංශෝධන කර ගෙන තිබෙනවා. ඒක කරන්නේ වැඩි හොඳටයි. මේ පිළිබඳව ඊයේ පැවැති උපදේශක කාරක සභාවේදී අතිගරු ජනාධිපතිතුමන්ට අපි සංශෝධන ඉදිරිපත් කළා. ඒ සංශෝධන එතුමා පිළිගත්තා. ඒවා ඉතා සංකීර්ණ සංශෝධන. ඒ නිසා තමයි අද අපි තීරණය කළේ ඒ සංශෝධනත් නැවත ඇතුළත් කරන්න ඕනෑය කියලා. ඒවා ඉතාමත් හිතකර මේ රටේ ගුවන් සේවයට අත්‍යවශ්‍ය සංශෝධනයි. ඒ නිසා තමයි එතුමා තීරණය කළේ අද මේ ගැන විවාද කරලා ඒ සංශෝධනත් ඊ ළඟ අවස්ථාවේදී සාකච්ඡාවට අරන් නැවත දිනයක මේක සම්මත කිරීමේ කටයුතු කරන්න ඕනෑය කියා. ඒක මේ රටට හිතකර පියවරක් මිසක් වෙන දෙයක් නොවෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පසු ගිය සතියේත් මේ ආකාරයෙන් Civil Procedure Code එකට සංශෝධනයන් ඉදිරිපත් කරපු වේලාවේ ඒ සංශෝධනයන් කළේත් පසුවයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අපි කියන්නේ, හිතකර සංශෝධනයන් නම් කරුණාකර මේ මන්ත්‍රීවරුන්ට ඒවා ලබා දෙන්න. එතකොට එය අධ්‍යයනය කරලා මේ විවාදයට එකතු වන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එය ලබා දීමට කටයුතු කරන්නම්. ගරු දයාශ්‍රිත තිසේරා නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 1.49]

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - துறைமுகங்கள், விமானச்சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Deputy Minister of Ports and Aviation)
ගරු කථානායකතුමනි, සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් ඒ ගැන විවාද කරන මේ අවස්ථාවේ මා හිතන්නේ මෙම පනත අලුත් පනතක් හැටියට නිර්මාණය කිරීමට හේතු වූයේ වසර 60ක් පමණ පරණ -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට point of Order එකක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Can we speak when this Bill comes before the House next time?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයකදී එක පාරයි කථා කරන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේක එහෙම වුණාම පසු අවස්ථාවකදී යොදා ගන්නා දේ නැවත සංශෝධනයට ලක් කළාට පසුව අපට ඒ ගැන කථා කරන්න බැරිද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයේදී පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සංශෝධනයන් ගෙනෙන්නේ මේ වගන්තිවලට. කාරක සභා අවස්ථාවේදී කථා කරන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, දැන් මෙතුමා කියන මේ කාරණය අනුව අද දවස පුරා විවාදය කරනවා. නමුත් අපට සංශෝධනයන් දෙන්නේ -ඔය කියන හොඳ සංශෝධන දෙන්නේ- කාරක සභා අවස්ථාවේදී. කාරක සභා අවස්ථාවේදී විවාදයක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කලබල වන්න එපා. සංශෝධන දැන් දෙනවා. [බාධා කිරීමක්] කාරක සභා අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කළාම කරුණු ටිකක් පැහැදිලි කර ගන්න අවස්ථාව දෙනවා. [බාධා කිරීමක්] ඇමතිවරු මාරු වන විට එහෙම වෙනවා.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)
ඒ නිසා තමයි ඊයේ ජනාධිපතිතුමා නිලධාරින්ට සැහෙන්න දොස් කිව්වේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පක්ෂ නායකයින් හෙට දින තුළ රැස්වීමට බලාපොරොත්තු වෙනවා. මේ ගැන සාකච්ඡා කර පැයක පමණ විවාදයක් පවත්වා කාරක සභාවට අපට යන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. එහෙම කරමු. අපි ඒ සංශෝධනයන් පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව දෙමු.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)
ගරු කථානායකතුමනි, 1950 දී ඉදිරිපත් කරන ලද පැරණි පනතක් තමයි මෙතුවක් කල් සිවිල් ගුවන් සේවා පනත හැටියට තිබුණේ. ඒ පැරණි පනතේත් අඩංගු කරුණු රාශියක් ඇතුළත් කර අද කාලයට ගැළපෙන ප්‍රමිතියක් ඇතිව, ජාත්‍යන්තර නිර්ණායකයන් ඇතිව ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතක් තමයි සාකච්ඡා කරන්නේ. ගරු කථානායකතුමනි, අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රඥප්තිය චිකාගෝ ප්‍රඥප්තිය හැටියට 1944 දී අත්සන් කිරීමෙන් පසු ශ්‍රී ලංකාව එම ප්‍රඥප්තියේ බැඳුම්කාර රජයක් බවට පත් වුණා. ඒ අනුව අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් සිවිල් ගුවන් සේවා කටයුතු සම්බන්ධයෙන් පවත්වනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිය සහ නිර්දේශිත ක්‍රියා පටිපාටි රට තුළ බල පවත්වා ගැනීම සඳහා ඒවා සඵල ක්‍රියාවේ යෙදවීමේ සම්පූර්ණ වගකීම රජයට පැවරෙනවා. ඒ සඳහා අවශ්‍ය වූ මූලික නීති රාමුව 1950 අංක 15 දරන ගුවන් සංතරණ පනත නිර්මාණය කිරීමෙන් ආරම්භ කළා.

මේ වන විට අප රට වටා ජාත්‍යන්තර ගුවන් තොටු පොළවල් ඉදි වෙද්දී, රට තුළ අභ්‍යන්තර ගුවන් තොටු පොළවල් ඉදි වෙද්දී, ඒ වාගේම අභ්‍යන්තර ගුවන් සේවාවන් ආරම්භ වීමට නියමිතව තිබියදී මේ රටට ශක්තිමත් පනතක අවශ්‍යතාව තිබෙනවාය කියන එක වැටහීමෙන් පසුව තමයි මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් වන්නේ. මෙහිදී විවාදයට ගැනෙන මේ පනත් කෙටුම්පත පිළිබඳව මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කරන අදහස්, යෝජනා ඉදිරියේදී කරනු ලබන සංශෝධන සඳහා වැදගත් වනවා. එම නිසා මේ පනත් කෙටුම්පත තුළ තවත් අඩු පාඩුකම් තිබෙනවා නම්, ඔබ සැමගේ අදහස් උදහස්, යෝජනා අරගෙන තව දුරටත් ශක්තිමත් කරන සංශෝධිත පනතක් හැටියට ගෙන ඒමට අපට පුළුවන් වනු ඇතැයි කියන අදහස ඇතිවයි අද අපි කටයුතු කරන්නේ.

පසු ගිය ත්‍රස්තවාදී අවධියේදී ගුවන් තොටු පොළ පද්ධතිය තුළත් එන යන කවුළුවල මඟීන් සංඛ්‍යාව දිනකට 3,000ක්, 3,500ක් පමණ වුණා. අද මේ වන විට එම සංඛ්‍යාව 10,000 ඉක්ම වනවා. එන යන කවුළු අතරින් දිනකට රටට එන යන මඟීන් සංඛ්‍යාව අද වැඩි වෙලා තිබෙනවා. එම නිසා ඉදිරියේදී මේ රට තුළ ගුවන් ක්ෂේත්‍රයේ හොඳ දැක්මක් දැක බලා ගැනීම සඳහා ලකලෑස්ති වීමට අවශ්‍යයි කියන හැඟීම අද ඇති වෙලා තිබෙනවා.

සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහාත් මෙම ගුවන් ක්ෂේත්‍රය ශක්තිමත් පදනමක් මත මේ රට තුළ ස්ථාපිත විය යුතුයි කියන කාරණය අද මේ රටේ ජීවත් වන හැම කෙනකුටම හැඟිලා තිබෙනවා. ඒ නිසා ශක්තිමත් සිවිල් ගුවන් සේවා පනතක් මේ රට තුළ ස්ථාපිත කිරීමටත්, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළේ 12 සහ 13 වන පිටුවල සඳහන් නිල් ගුවන ජය ගැනීමටත් අපට අවශ්‍යයි. ශ්‍රී ලාංකිකයන් හැටියට අපේ රටින් ත්‍රස්තවාදය තුරන් කරලා, ත්‍රස්තවාදයෙන් තොර නිදහස් නිවහල් රටක් මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දූවා දරුවන්ට අප ලබා දී තිබෙනවා. ඒ වාගේම ශක්තිමත්, සංවර්ධිත රටකුත් මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න ඔබේ මගේ අපේ දූවා දරුවන්ට ලබා දීමට වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය පැත්තෙන් විශේෂයෙන් සිවිල් ගුවන් සේවා පැත්තෙන් අප කටයුතු කරනවා. ඒ නිසා මේ රටේ සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම අපට වැදගත් වනවා.

මූලසුන හොබවන ඔබතුමා මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හැටියට සිටියදීත් මේ පනත රට තුළ ස්ථාපිත කිරීමට වරින් වර කටයුතු කළ නිසා මෙම පනත ශක්තිමත් පනතක් බවට අද පත් කර ගෙන තිබෙනවා. වග කිව යුතු රජයක් හැටියට මේ පනත සම්බන්ධව මේ උත්තරීතර සභාවේ ඉන්න සියලු මැති ඇමතිතුමන්ලාගේ අදහස් උදහස් අරගෙන නිවැරදි සංශෝධන යොදවා හොඳ ශක්තිමත් පනතක් බවට මෙම පනත පත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. "නිල් ගුවන ජය ගනිමු" කියන අදහස ඇතිව අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන" වැඩ පිළිවෙළ යටතේ විශේෂයෙන් සඳහන් කර ඇති කරුණු අනුව ශ්‍රී ලංකාව ආසියාවේ සංවර්ධිත රටක් බවට පත් කරන්න යන අවස්ථාවේදී මෙම පනත තුළින් නිල් ගුවන ශක්තිමත් කරමින් මේ රටේ ගුවන් ක්ෂේත්‍රය තුළින් විශාල වර්ධනයක් වාගේම විශාල වශයෙන් මුදල් උපයමින් සංවර්ධනය සඳහා දායකත්වය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. පැරණි පනතේ තිබෙන විශාල දේ අඩංගුව අලුත් පනත ඉදිරිපත් කරලා මෙම ගුවන් ක්ෂේත්‍රය අප රට තුළ ශක්තිමත් කිරීමට ඉදිරියේදී අපිට පුළුවන් වේවි කියන හැඟීම ඇතුව මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, සියලුම වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා යම් යම් අඩු පාඩු ඒ උදවියගෙනුත් විමසලා මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කටයුතු කෙරුණා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාත් මේ පනත් කෙටුම්පත දැඩි ලෙස පරීක්ෂණයට ලක් කරලා තවදුරටත් මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් උදහස් අරගෙනම මේ පනත් කෙටුම්පත

සංශෝධනය කළොත් හොඳයි කියන අදහස ඉදිරිපත් කළා. ඒ අනුව තමයි අද ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත සංශෝධන සහිතව ඉදිරි දිනකදී සම්මත කිරීමට අපි බලාපොරොත්තු වෙන්නේ කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

වර්ෂ 1944 දී රටවල් 53ක සහභාගිත්වයෙන් සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ අරමුණු සහිතව සාකච්ඡා කරමින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සමුළුව මුල් වරට පැවැත්වූ අතර, එහිදී සිවිල් ගුවන් සේවාවේ අනාගත උන්නතිය සඳහා වූ වගන්ති 96ක් ඉදිරිපත් වුණා. එහිදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු හා සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වා ගනු වස් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය බිහි වුණා. සිවිල් ගුවන් සේවා සුරක්ෂිතභාවය සඳහා එහි සාමාජික රටවල් තම රටට උචිත වන පරිදි එකඟ වූ වගන්ති බලාත්මක කළ යුතු වුණා. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ සාමාජිකත්වය හිමි රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවටද ඉන් වගන්ති 89ක් පමණ බලපාන අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අප ජාත්‍යන්තරය සමඟ බැඳී සිටිනවා. ඉහත වගන්ති 89 ඇතුළත් සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායකයේ බලයද සහිතව බලපැවැත්වීම සඳහා උත්තරීතර පාර්ලිමේන්තුව තුළින් සම්මත කිරීම මේ අවස්ථාවේ ඉතා වැදගත් බව අපි කවුරුත් දන්නා කාරණයක්.

මෙම පනත ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ වත්මන් සාමාජිකත්වය දරන රටවල් 190ක් සමඟ සාමූහිකව සිවිල් ගුවන් සේවාව හා සම්බන්ධ කටයුතු කිරීමේ හැකියාව ලැබෙන අතර, එය අප වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට සංවර්ධිත තත්ත්වය දක්වා පැමිණීමට ලැබෙන මහඟු රුකුලක් වනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පතේ වැදගත්කම ආණ්ඩු පක්ෂය, විපක්ෂය -අප දෙපක්ෂයම- තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් අනාගතයේදී අප රට තුළ සිවිල් ගුවන් සේවාවේ ජාත්‍යන්තර මට්ටමත්, රට තුළ පවතින අභ්‍යන්තර ගුවන් සේවාවනුත් හරියාකාරව පවත්වා ගෙන යමින් රටේ ආරක්ෂාවත් හරියාකාරව සපයා ගනිමින් හොඳ ක්ෂේත්‍රයක් හැටියට ඉදිරියට ගෙන ඒමට පුළුවන් වනු ඇතැයි අදහස් කරනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මේ පනත් කෙටුම්පත මේ රටේ ශුභසිද්ධිය සඳහා ඉවහල් වෙනවා. ඒ වාගේම අද ගුවන් ක්ෂේත්‍රයේ සේවය කරන අපේ සේවක මහත්ම මහත්මීන්ගේ ආරක්ෂාව සඳහාත් මෙය ඉවහල් වේවි. මේ පනත් කෙටුම්පත මේ අවස්ථාවේදී ඉදිරිපත් කරමින්, සංශෝධන සහිතව මෙය ශක්තිමත් පනතක් බවට පත් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

[අ. භා. 2.03]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මෙවැනි විෂයයක් සම්බන්ධයෙන් වූ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේදී මට වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා මේ අමාත්‍යාංශය ඔබතුමා යටතේ තිබුණු අවස්ථාවේදී මීට අවුරුද්දකට විතර පෙර අපි යම් අදහස් වගයක් ඉදිරිපත් කළ බව. ඒ අවස්ථාවේදී රජයේ නිලධාරින් කිව්වේ, "අපට අවශ්‍ය වන්නේ ICAO එකේ අවශ්‍යතාව නිසා මේවා සංශෝධනයට ලක් කරලා මේක නීති ගත කරන්න ඕනෑ" කියලායි. ඉන් පසුව හරියටම අවුරුද්දක් ගියා. ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපිට කිසිම වෙනසක් කරන්නේ නැතුව මේකම ඉදිරිපත් වෙලා තිබෙනවා. මෙවැනි රජයේ නිලධාරින්ට කියන්න ඕනෑ මීට වැඩිය වග කීමකින් කටයුතු කරන්න ඕනෑ කියලා. අපි දන්නවා ඇමතිවරුන්ට ඒ විෂය පද්ධති සම්බන්ධව සම්පූර්ණ දැනුමක අවශ්‍යතාවක් නැහැ කියලා. ගරු ජනාධිපතිතුමාට මේ සම්බන්ධයෙන් දැනුවත්කමක් නැහැ. නමුත් රජයේ නිලධාරින් විසින් එතුමන්ලාව දැනුවත් කරන්න අවශ්‍යයි. ඊයේ අපි ඉදිරිපත් කරපු අදහස්වලට ලැබුණු ප්‍රතිචාර ගැන මම හිතන්නේ ගරු ජනාධිපතිතුමාත් පුදුම වුණා. මෙවැනි පනත් කෙටුම්පතක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නිකම් මොන්ටිසෝරියක ළමයින් ටිකකට පනතක් ඉදිරිපත් කරනවා වාගේයි. මේ විෂය සම්බන්ධයෙන් දැනුවත්කමක් තිබෙන නිසායි මම කියන්නේ, මේක රටක් හදන්න පුළුවන් පනතක් කියලා. අපි එක පැත්තකින් කියනවා 2016 වසර වන කොට මේ රටට සංචාරකයෝ ලක්ෂ 25ක් ගෙනෙනවා කියලා. ඒ ප්‍රමාණය දෙ ගුණයක් හෝ තුන් ගුණයක් කරන්න පුළුවන්. මම හිතන්නේ මෙවැනි පනත් කෙටුම්පත් හරියාකාර විධියට, රටට ගැළපෙන විධියට ගෙන ඒමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ ගැන දැනුවත්කමක් ඇති වන්නට අවශ්‍යයි. මම හිතන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, ඊයේ ලැබුණු උත්තර එදා හරියාකාරව ලැබුණේ නැති නිසා තමයි මේක කල් ගියේ කියලා. දැන් අවුරුද්දකට පස්සේත් නැවත ඒ තත්ත්වයම තිබෙනවා නම් මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ වටිනාකමක් නැහැ. නිකරුණේ මේවා පාර්ලිමේන්තුවට එවනවා නම් අපේ වෙලාවත් නාස්ති වනවා. ජනතාවගේ සල්ලිත් නාස්ති වනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් මීට වැඩිය වැඩ කටයුත්තක් මේ අය කළ යුතුයි කියන එක මම මතක් කරන්න කැමැතියි. මට මතකයි ඒ අවස්ථාවේ ඔබතුමා නොදන්නා කරුණු අපෙන් දැන ගෙන එය සංශෝධනය කරලා ඒවා අඩංගු කරලා තිබුණා. මම ඒක අගය කරනවා. නමුත් ඊට වඩා හාත්පසින්ම වෙනස්, කිසි සේත්ම සම්බන්ධයක් නැති ඒවාත් ඒක ඇතුළට ඔබලා තිබෙනවා. මෙන්න මේක නිසා තමයි අපේ මේ ක්ෂේත්‍රය එක තැනක ඇනහිටලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මම ඊට වඩා ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. අපි මේ අවස්ථාව පාවිච්චි කරන්නේ අදහස් හුවමාරු කිරීම සඳහායි. ගරු අරුන්දික ප්‍රනාන්දු මන්ත්‍රීතුමා යම් අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කළා. හිටපු නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මැතිතුමාත් ඒ සම්බන්ධයෙන් ඕනෑකමින් අදහස් යොමු කර තිබෙනවාය කියා මට දැන ගන්න ලැබී තිබෙනවා. දයාශ්‍රිත තිසේරා නියෝජ්‍ය අමාත්‍යතුමාත් සිටියා. මම හිතන්නේ මීට වඩා දරුණු මට්ටමකින් කටයුතු කළේ නැත්නම් මේ පාර්ලිමේන්තුව විහිළුවකට ලක් වෙනවා. ගිය වරත් මෙම සංශෝධන ඉදිරිපත් කරන කොට ඔබතුමා සිටියා. එදා ඉඳලා අද වන විට අවුරුද්දක් ගත වෙලාත් වචනයක්වත් වෙනස් වෙලා නැත්නම් මොකටද මේ තීන්දු?

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී මම බලාපොරොත්තු වන්නේ ඇත්ත වශයෙන්ම මේ කර්මාන්තයේ සංවර්ධනයට අදහස් ටිකක් යොමු කරන්නටයි. එසේ අදහස් යොමු කරන ගමන් මම මුලින්ම මේ ටික මතක් කරන්න කැමැතියි.

The Government is trying to have an ambitious plan on tourism and I guess that is the correct thing. Peace dividend is obviously related to foreign business interactions and one of the prime benefits of that is tourism. Being an island nation, obviously we have to get the tourists coming here either by air or by ship. There is no other source. So, travel by air is obvious. But, Mr. Speaker, this Civil Aviation Bill that has been presented is not a fully comprehensive Bill. It is a Bill that has been presented just to satisfy certain officials who are supposed to do audit check. If that is the reason why bills are presented in Parliament, we look stupid in approving them and allowing such things to get through because the people who come here will obviously know that it is not done with zeal or conviction but for the sake of getting

the international wizkids legalized. So, Sir, I am sure, you being a keen person in this field, will take the necessary liberty to call upon and ask what happened then, what is happening now, and how we have got to go forward.

Let me take this opportunity to mention about the tourism growth factor. I think they are targeting 2.5 million tourists by 2013 and 5 million tourists in the next couple of years. First of all, has there been a discussion with the airline or the Board of Airline Representatives - the BAR, as they call it - and have they given any concurrent approval to such a thing? SriLankan Airlines is there. Then, you have Mihin Air that is being floated around losing heavily and you have the other airlines that basically support this. The majority of them, at this particular moment, have addressed that the information put into the Bill does not help them to provide the service that is expected of them in Sri Lanka. First, is the competitiveness. Just because you have got a Civil Aviation Bill, that does not mean that airlines will come in here. There must be a competitive edge. There must be certain safeguards. I do not mean to take it as a political point. But, what has happened to Gen. Sarath Fonseka who is also a Member of Parliament? Sir, look at Clause 92(2), if by chance a foreign airline assumes on a pet destination but the Government wants the industry to have a growth factor which is not conducive to the Government, this authority can call in those people and ensure that they be liable to a fine as well as a jail sentence, which will basically impact on decision-making of foreign airlines in this country. The reason for putting these type of things are obnoxious. There is a law and let the law take its place. But, bringing this into a bill and trying to impose it at this particular moment does not help to make a conducive climate. This is against the backdrop of what went on Gen. Sarath Fonseka. He was held before a court martial and was stalled on a thing that there was no involvement. The court martial says so. That is why I am referring to Clause 92(2) because the Hon. Dinesh Gunawardena was also there at the Consultative Committee yesterday. I am just trying to draw attention to say that these type of things are not healthy.

Next, what I would like to point out is, the country is obviously on an export promotional drive. That means, you need to have tourists on one side and you need to export the goods from Sri Lanka, on the other. When you talk about the cargo that comes in, it can be textile, footwear, fruits, flowers and so on. But, this particular Civil Aviation Bill does not cover any of those things. They do not cover the areas which have a growth factor. That is why I say that this is a sub-optimized Civil Aviation Bill. Sir, I mentioned the same thing one year ago when you were at the Consultative Committee. So, please ensure that the industries call and open it out. We legislate laws for the benefit of the industry but not for the benefit of the Government. The Government has to have its policies in the process. So, I would say that there needs to be an interaction between the industry and the relevant authorities led by the Ministry. We have fruits and flowers in the country grown in abundance and the cost is relatively competitive in Sri Lanka. But, when you add the air freight component, it is uncompetitive. That is where the Government policy needs to be created. The Government policy needs to go through the Civil Aviation Bill. But, this does not touch any of those. That is why I say this Bill is sub-optimized. There is only one aspect of it. Last time, the officials did tell us that this is in relation to certain requirements only which are there for international obligation. That is precisely what I am trying to say. In that case, it does not cover the entire industry by itself. Now, if you look at the Civil Aviation Bill of Thailand which has capitalized on the ability of trying to market their destination as a tourist destination, I guess that is a country that you must emulate. Singapore sometimes has gone a little overboard but those are the countries that we must follow. Hong Kong is another standing example. Even though there is no legislation in Maldives, the implementation process is so great that today they have more tourists in that small country than we, in Sri Lanka. So, Hon. Minister, let us ensure that we take this from a completely different point of view.

Then, the other is the consumer aspect of it. The passengers are, I am sure, whom the Government wanted to protect at one time. Obviously, it is so because this is a Government that talks of the consumer even though they do not look after the consumer. But, there is no relevance if the Airlines get together and cartelize themselves and charge rates that are exorbitant. Today, rates in Sri Lanka - I am sure the Sri Lankan Airlines will agree - are absolutely exorbitant. It is cheaper buying tickets out of Singapore; its cheaper buying tickets out of India which was much higher earlier; sometimes it is cheaper buying out of Dubai than buying out of Sri Lanka. So, then, what is the purpose? The captive market is from Sri Lanka and when you try to take undue advantage here, it does not take too long for the passengers to buy tickets from outside and get it transferred in here. You cannot stop that. So, these are the matters that need to be looked into and has not been addressed.

Now, for example, a popular destination to Europe is London. A ticket on Economy Class costs roughly Rs. 105,000 from Qatar Airways, Rs. 110,000 from Air Lanka, Rs. 85,000 from Gulf Air and from Kuwait Airways maybe Rs. 65,000. But, the majority is Rs.105,000. Business Class is Rs. 208,000 to Rs. 408,000. Now, you can buy the same thing out of Dubai; you can buy the same thing out of India for almost Rs. 65,000 to Rs. 70,000. Look at Maldives. It does not take 55 minutes. Before you fasten your seat belts, you can land at the destination. Basically, you have to pay a cost of around Rs. 30,000 per ticket. But, you can go to Thailand at Rs. 20,000 because there is competition in

that area. So, basically you do not have any rationality in doing such a thing. Now, this is why in 1995 - I guess Hon. Speaker, you were in the House - I opposed the privatization of the AirLanka in the way it was done. I told them it was a calamity, it is a great negligence and corruption that is taking place and at the end of the day you get Air Lanka in a much more worse situation than what it was. It was nobody else out of the persons who challenged, but my Friend, the late Hon. Jeyaraj Fernandopulle who said "Yes, we have made a mistake". So, I think especially in a driven knowledge-oriented area, there must be much bigger interaction between the industry and the relevant people, not just for the sake of legislating but for international obligation.

So, where is the Consumer Affairs Authority that could be linked to civil aviation in order to protect the consumer? This is obviously the area that has to be looked at.

Even though we may be having different policies, I must appreciate that the President himself was astounded as to why it was not there. Even the officials were unable to respond to certain questions that were posed. Now, the next one that would come in, is the areas that come under Clause 92. I will take it a little further. Hon. Speaker, the Civil Aviation Authority is one of the authorities that are supposed to be protecting civil aviation in the country. I will read from the Performance Report 2009 of the Ministry of Ports and Aviation and in that they say that their vision is to be a prime catalyst to the growth of the National Economy. Then, there are policies and objectives. In page 122, it states, I quote:

" Policies & Objectives

a. Achieve or exceed safety outcome target

b. Be appropriately resourced

c. Be professional and competent

d. Attain wide credibility and recognition

e. Sustain its achievements, and

f. Be a strong facilitator for planning and development of civil aviation"

Hon. Speaker, it was an institution that was under your purview. Would you tell us, that out of the six or seven policies and objectives that are there, have they been able to provide the necessary strategy to any of these? "No" is the answer. So, then, what is the purpose of having these in Statute books or in their Corporate Plans if they are not implementing them? That is why there is a degradation. As we say this from Opposition, you look as if we are trying to ridicule this. Obviously, if it is inefficiency, incompetence and corruption, we are going to tell it. We are not here to prop up the Government. We are here to prop up the country and in the process to wake up the sleeping Government and tell them that there is a reality and check that this needs to be done. I am sure the young Deputy Minister will be made a Minister before too long and then will be able to respond to some of these questions. But, the policies and objectives have not been achieved. If I go further, the key functions are, I quote:

"Communicating with the Minister ……

Setting policies and goals in the field of civil aviation ….."

Those are things of course I must say are happening because it has got to happen. Where the credit is due I need to give that but those things are not the most important things. It must be industry-driven.

Now, Sir, the next important institution is the Airport and Aviation Services (Sri Lanka) Limited which is the one that provides the services. There again, there is a monopoly. It may be having different intentions and expectations but the Government says they want to do it themselves. Well and good! But, there must be a sense of competition so that you can expect the best of services. If it is just the Government's monopoly and you give them the right to operate, you only bring absolute lethargy into the system. Then, what you can do out of Rs.100, you will not be able to get it done out of even Rs. 1,000. That is what needs to be done. I am sure even some of the Sri Lankan officials will agree that competition is the best way to ensure that the best of services come out. In the same Performance Report that I referred to, the Airport and Aviation Services (Sri Lanka) Limited states that their vision is, "To be the friendliest and best airport service provider in the Asia Region". Then, you look at the objectives. In page 126, it states, I quote:

" a. To increase passenger numbers to 8 million by 2013.

b. Make BIA a passenger Transit Hub of Asia Region by 2013".

Are these just put for the sake of adding on objectives or is it practically obtainable?

"c. To achieve a 40% Transit cargo out of total Aviation cargo of 600,000 MT by 2013.

d. To become the regional aviation training Centre.

e. Be the leader in airport services in the SAARC Region by 2013.

f. Minimize contribution towards aircraft incidents in 2013.

g. Manage all civil airports in Sri Lanka.

h. To provide an efficient and effective security service, to ensure the safety of international civil aviation as specified in ICAO document 8973".

They are trying to bring in a sub-aspect of that.

"i. Pursue service, value and operational excellence in corporation with all airport partners.

j. Maximization of Stakeholders value."

It has not even spoken of the stakeholders. The stakeholder would be the consumer. The stakeholder would be in the Airlines, the Board of Airline Representatives. The stakeholder would be in the cargo agents. None of them are brought into the system. Now, without that, what is the purpose of getting these type of things?

[ගරු රවි කරුණානායක මහතා]

I am only mentioning this for the simple reason that while there is a great expectation on what to do, that does not match with practical, implementable proposition. For example, you take the Mattala International Airport which is coming as the second international airport in the country. Both Hambantota, where Mattala International Airport is coming up and Katunayake, where the Bandaranaike International Airport is located have the same weather pattern. But, nobody has told the Government about that; they do not have the courage of conviction to say that. So, if there is a weather problem, whether it is in Katunayake or Mattala, one airport will not be able to help the other. That is the reason why there should have been a much closer study. I am sure the Hon. Dayasritha Thissera as the Deputy Minister may have gone through this. For political reasons, you would have got to do that, but there should be a national policy on these matters. The then United National Party Government was looking at Moneragala because the weather patterns of the two locations are different. If you have a problem at Katunayake and if you ask the IATA, I am sure they will say that the next point of landing would be Chennai or Male and not Mattala. So, I would greatly appreciate if you look into that. I may be subject to correction because things get changed dramatically. But, professionals who are not political in nature say that there is a colossal duplication of capital investment.

I am going through the Performance Report 2009 published by the Ministry of Ports and Aviation. It states that there was a Rs. 24 billion investment in 2009. By the time you have the real investment, it will be about Rs. 30 billion. Of that, they say US Dollars 209 million is coming from China as the initial cost. The Hon. Dinesh Gunawardena answered me when I asked a Question about the aid that had been given by China to Sri Lanka. If you take this amount at 8 per cent interest rate, at the end of the day you will have to pay - I am not talking about the capital cost because you need to invest capital expenditure - an interest cost of Rs. 3.5 billion a year. Now, to pay such a large sum of money as interest, you will have to have a lot of passengers going through that airport; you will have to have billions of tons of cargo going through the cargo villages. Without that, you are going to pay Rs. 3.5 billion as interest. I am not talking about the total Rs. 24 billion investment, I am talking about the US Dollars 209 million initial cost coming from China. So, can we afford it? That is why I am saying that this Civil Aviation Bill should have been looked at in a completely deep-oriented way. Certainly, it is the right thing to be done; you have got to do that.

Sir, at this moment I would like to say this for record. When AirLanka was to be privatized, we told them not to do it that way. It was the same Government that accepted and said, "Yes, we did it wrong" and it was the same Government that took it back. Today we are in the same unable, ill-capitalized position. You have Mihin Air and SriLankan Airlines. What is the purpose of having two airlines if both are losing? Now, that I am on the subject, let me take Mihin Air as an example. We should have a national airline, there is no question about it, but how we run it may be in two different ways. Efficiency, competitiveness and good rates to the passengers are essential components, but just because you have Mihin Air, it does not mean that that gives better service to the people.

Hon. Speaker, I am now reading from page 133 of the Performance Report 2009 published by the Ministry of Ports and Aviation which had come under your purview. There, it is stated that the overall load factor of the Mihin Air is maintained at 75 per cent; more than 100,000 passengers have flown with Mihin Air during 2009.

Now you go to page 134. There, they have spoken about profit and loss. The loss is US Dollars 8,095,147. Hon. Speaker, if you take that in Sri Lankan Rupee terms, the loss is Rs. 930 million. You say 100,000 people have flown and if you divide that loss of Rs. 930 million by 100,000 people, then each passenger who has flown with Mihin Air has cost the Government Rs. 10,000 loss. So, what is the purpose of charging Rs. 8,000 to Rs. 10,000 by Mihin Air to go to Dubai if you have lost Rs. 10,000 by flying? What is the logic behind that? I stated this on the Floor of this House. It was not political, it was national. I have a knowledge on this area because we have been commercially involved in this and that is the reason why I passionately want to take it up. After all, this is our national economy, this is not a SLFP economy or a UNP economy. I am just taking the accounts of Mihin Air from this Report. According to that, 100,000 people have flown and there is a Rs. 930 million loss. If you divide 100,000 people by Rs. 930 million, each passenger who has flown has cost a loss of Rs. 9,500. So, if you tell them, "We will give you Rs. 9,500 and you fly SriLankan Airlines", then SriLankan Airlines would have got Rs. 939 million more. I am sure they would have been happy. Today, they are trying to buy an aircraft. What nonsense is this? I can see the Hon. Sajin De Vass Gunawardena here and I would like to remind about the introduction he gave when I appeared on "Derana TV" about three years ago. "මේක කුඩා කොම්පැනියක්. මේක දැන් බඩ ගා ගෙන යන්නේ. මේකට ඇවිදින්න වෙලාව දෙනවා" කිව්වා. දැන් බඩ ගාලා, ඇවිදලා, දුවන්න තිබෙන කාලයේ රුපියල් මිලියන 930ක අලාභයක් තිබෙනවා. මේවා අපි කියන්නේ කුහකකමින් නොවෙයි. මේ ගැන දැනුවත්කමින්. නොදැනුවත්කමින් කරන දේ තමයි -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
අනෙක් ටිකත් කියන්න, කරුණාකරලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන්න, මොනවාද කියන්නේ?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
මම කියන්නම්. ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය තිබෙන්නේ මිහින් ලංකා සමාගම දුවන හැටි ගැන නොවෙයි, ක්‍රියා කලාපය ගැන නොවෙයි. ඒක ආරම්භ කරන්න ගත්ත ප්‍රතිපත්ති තීරණය ගැන කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම කිව්වේ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
අපි පස්සේ සංවාදයකට ගිහිල්ලා, -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි මම කිව්වේ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ඒක තමයි තමුන්නාන්සේ කිව්වේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා විවාදයකට පැත්ත පළාතකට ආවේ නැහැ. දැන්වත් විවාද කරන්න. ඒත් කමක් නැහැ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, මම හය පාරක්, - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් මම මෙතෙක් කිව්වේ මොකක්ද? එතුමා පරක්කු වෙලා ආව නිසායි මම කිව්වේ. කොම්පැනි දෙකක් තියලා දෙකම අලාභයට දුවන්නේ නැතුව අඩු ගණනේ එකක් -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
මට විවාදයකට එන්න කියලා කිව්වා. මම දැන් කියන්නම්. ඕනෑම අවස්ථාවක, ඕනෑම මාධ්‍යකට ඔබතුමා එන්න අපි කථා කරමු. කිසිම ගැටලුවක් නැහැ. ගරු මන්ත්‍රීතුමා මට කියන්න, දිනයයි වේලාවයි. මම එන්නම්. මම හය වතාවක් ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට අවස්ථාවක් දෙන්නම් කථා කරන්න. නම නම් ලැයිස්තුවේ නැහැ. ඒ වුණත් අපි දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමාටද, මටද? මට නම් ආරක්ෂාවක් ඕනෑ නැහැ. අපි කොහොමත් හැම දාම ආණ්ඩුවෙන් ගුටි කකා ඉන්නේ. ඉතින් එතුමාට ලබලා දෙන්න. ඕනෑම වේලාවක ස්වාධීන channel එකක් තුළින් විවාද කරන්න මම කැමැතියි කියන එක මේ මොහොතේ කියනවා. මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්න බැරි වුණු එක, මීට අවුරුදු තුනකට ඉස්සර වෙලා කරන්න බැරි වුණු එක දැන් කරලා, මිහින් එයාර් ආයතනයේ දැන් තිබෙන තත්ත්වය මොකක්ද -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු කථානායකතුමනි, මගේ නම කියපු නිසා,- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම හැංගි හොරා කියන්නේ නැහැ. මුහුණ ඉදිරියේ තියා ගෙන නේ කියන්නේ.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, ඕනෑම වෙලාවක -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඕනෑ වෙලාවක කියන්න එපා. දැන් කියන්න. කථානායකතුමාට පුළුවන්, ඒකේ නායකත්වය අරගෙන ඒ අවස්ථාව ලබා දෙන්න. හැබැයි ඒක මේ Privilege යටතේ කියන්න බැහැ. මම ඉතාම ගරු කරනවා ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිතුමාට. විවාද කළා; වැරැද්දක් කළා; ඇවිල්ලා අපට සමාව දුන්නා. ඒ නිසා එළියේ විවාදය පවත්වන්න. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද තුළින් විවාද කරන්න එපා.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඕනෑ නම් ස්වාධීන රූපවාහිනියේ

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ඒක ස්වාධීන නැහැ නේ. [බාධා කිරීමක්] ඒක ස්වාධීන නැහැ. මම ස්වාධීන කියන්නේ "සිරස", "ස්වර්ණවාහිනී", "දෙරණ". ඒවා අපි ගනිමු. ස්වාධීන,- [බාධා කිරීමක්]

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
මන්ත්‍රීතුමා, මේ අද හෙටම පවත්වමු. ගරු මන්ත්‍රීතුමා, හෙට පවත්වමු. මට වෙලාවක් දෙන්න, ඕනෑ නාළිකාවක - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඕනෑම වෙලාවක ඒක ප්‍රශ්නයක් නැහැ. අපි එන සුමානේ පවත්වමු. හෙට අපට මේ පාර්ලිමේන්තුවේ තිබෙනවා, No-Confidence Motion එක සම්බන්ධ විවාදය. ඊට පස්සේ සිකුරාදා අපට තිබෙනවා, Private Members' Motion. එන අඟහරුවාදා, බදාදා මේ "මිහින් එයාර්" සහ "ශ්‍රීලංකන් එයාර් ලයින්ස්" සම්බන්ධව විවාද කරන්න මම සතුටින් සූදානම්ව සිටිනවා. හැබැයි ඒක කරන්න අවශ්‍ය වන්නේ -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

අනිවාර්යයෙන්ම එනවා. අපි ඒක භාර ගන්නවා. "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්", "ලිට්‍රෝ ගෑස්", "සතොස" ඒවාත් ඒකට දමමුද, එහෙම නම්? [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතුමා විෂය පථය නොදන්නා පුද්ගලයෙක්. දැන් කියනවා ඒ විෂය පථය ලොකු කරන්න කියලා. ඕනෑ නම් මුළු රටේම ආර්ථිකය ගැන වුණත් මම විවාද කරන්න සූදානම්. [බාධා කිරීම්] නමුත් තමුන්නාන්සේ ඉස්සෙල්ලා මේ විවාදය අවසන් කර ගන්න. [බාධා කිරීම්] අපට පුළුවන් ඕනෑ විධියකට. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

අඟහරුවාදා කරමු?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ විවාදයට පුත්තලමේ හාදයෙක් අවශ්‍ය නැහැ. මට දැන ගන්න අවශ්‍ය වන්නේ, එතුමා තනිවම ඇවිල්ලා මේ විවාදය කරනවාද, එහෙම නැත්නම් සගයෙකුත් ඕනෑද කියලායි. [බාධා කිරීම්] සගයෙක් ඕනෑ නම් අරගෙන එන්න.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

අපට සගයෝ ඕනෑ නැහැ. අනිවාර්යයෙන්ම තනිවම එන්නම්. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් මේ සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත නීතිගත කරන්න ගිහින් අන්තිමට ඇති වෙලා තිබෙන්නේ, "මිහින් එයාර්" සහ "ශ්‍රීලංකන් එයාර් ලයින්ස්" සම්බන්ධයෙන් විවාදයක් කරන්න අපි සූදානම් වීමයි. ඒක ලබන සුමානයේ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා වෙන්න පුළුවන්, ගරු කථානායකතුමා වෙන්න පුළුවන් මැදිහත් වෙන්න. අඟහරුවාදා, බදාදා හෝ බ්‍රහස්පතින්දා වෙන්න පුළුවන්. මගේ diary එක මෙතැන නැති නිසා කියන්න බැහැ. අපි ලැහැස්ති කරමු. එකෙන් මොකක්ද ඇත්ත තත්ත්වය කියන එක රටට පෙන්වන්න පුළුවන්. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අඟහරුවාදාර "රතු ඉර" ට එන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මෙතුමන්ලා පනිනවා. මමයි විවාදය ඉල්ලුවේ. මෙතුමන්ලා නේ කුලප්පු වෙන්නේ. [බාධා කිරීම්] ඊට පසුව කියන්න එපා මොනවාද වෙන්නේ කියලා. [බාධා කිරීම්] ඒක තමයි මම කියන්නේ. අපි ඒ විවාදය මොන නාළිකාවෙන්ද - [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

අපි "රතු ඉර" වැඩසටහනෙන් කරමු. [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නොවෙයි. අපිට ගන්න පුළුවන් ස්වාධීන channel එකකට තිබෙන්නේ " සිරස". එහෙම නැත්නම් "ස්වර්ණවාහිනී"ය. ඒ දෙකම. එහෙම නැත්නම් "දෙරණ". [බාධා කිරීම්] ITN සහ රූපවාහිනී නාළිකා වැඩක් නැහැ. ඒවා හැම දාමත් අපට ගහන ඒවා. අපි විවාදයක් තියමු. ඒක කරන්න ඕනෑ කියන එක මම මතක් කරනවා. [බාධා කිරීම්] අවුරුදු හතරක් ගිහිල්ලා මොකද මේ අද නැඟිට ගත්තේ? අපි ඔක්කෝම මතක් කළාට පස්සේ නේද නැඟිටුණේ? [බාධා කිරීම්] අඩු ගණනේ "මිහින් එයාර්" එකේ අලාභය අඩු කරලා තිබෙන්නේ ගරු කථානායකතුමා එතැන හිටිය නිසායි. ඒකත් මම වාර්තා කරන්න අවශ්‍යයි. නැත්නම් මේ වන විට ඒක මීට වඩා තුන් ගුණයක අලාභයක් ලබනවා කියන එක මම මතක් කරන්න කැමැතියි. ගරු කථානායකතුමා ඒ කළ සේවය මේ අවස්ථාවේදී මතක් කරන්න අවශ්‍යයි.

දැන් මේ ගුවන් සේවා සම්බන්ධයෙන් තිබෙන පනත තුළ අඩංගු වෙලා තිබෙන කරුණු හරියාකාරව ඉදිරිපත් වෙලා නැත්තේ ඇයි? දැන් "මිහින් එයාර්" සම්බන්ධයෙන් මම වෙලාව නාස්ති කරන්නේ නැහැ. මම විවාදය තුළ එකට උත්තර දෙන්නම්.

ඉන් පසුව "ශ්‍රීලංකන් එයාර් ලයින්ස්" සම්බන්ධව බලමු. අඩු ගණනේ ඒකට යම් ඉදිරි දැක්මක් සහිතව යන්න පුළුවන්. එතුමාගේ අයියා, මනෝජ් ගුණවර්ධන කියන්නේ ක්ෂේත්‍රය ගැන දන්නා පුද්ගලයෙක්. වෙනත් මත තිබෙන්න පුළුවන්. නමුත් අඩු ගණනේ ඒ ක්ෂේත්‍රය ගැන දන්නා පුද්ගලයෙක්. "මිහින් එයාර්" එකේ මුදලත් "ශ්‍රීලංකන් එයාර් ලයින්ස්" එකට දමලා කටයුතු කරන්න පුළුවන් නම් අඩු ගණනේ එක ආයතනයක්වත් හරියාකාරව දුවන්න පුළුවන් වේවි කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ අනුව මෙතැන- I would like to mention, Sir, that Clause 92 basically states the manner it has got to be operative in regard to holders of airline licences and foreign airline owners. I quote Clause 92 (1)(a), (b) and (c), which states:

> "92. (1) (a) charging fares and rates on any particular routes which are, in the aggregate, insufficient to cover the cost of providing the services to which they relate;
>
> (b) the addition of excessive capacity or frequency of service;
>
> (c) the practices in question are of a permanent nature rather than temporary;"

All these are just theoretical. Nothing relevant is there in order to bring the industry together and get what is required out of that. Then, the conviction that I mentioned about could take place. These are obnoxious. These are things that have got to be looked at.

Yesterday, ජනාධිපති මොනවාද කිව්වේ? 1950 සම්මත කළ මේ පනත් දැන්ලු සංශෝධනය කරන්නේ. අනේ දැන්වත් ඒක තේරුණ එක ලොකු දෙයක්. ඔය ඔක්කෝම හිරිහැර කරන්නේ 1950, 1948, 1930 තිබෙන ඒවායින්. 1950 පනතේ තිබෙන කොටස් එහෙමම අඩංගු කරලා මේකේදීත් දානවා නම් මොකක්ද තිබෙන ඵලය? ඒකයි ඊයේ ජනාධිපතිතුමාත් කිව්වේ. ඉතින් ඒවා තමයි අපි අහන්නේ. මේක අහන්න, ඔය සම්බන්ධයෙන් කථා කරන්න Consultative Committee එකටම එන්න ඕනෑය.

Then, Clause 92 gets overridden when you read Clause 121. මොකක්ද? මේ පනත් කෙටුම්පතේ 121 වගන්තියෙන් කියන්නේ, දැන් මෙතැන ඔබතුමා ඇමතිවරයෙක් වශයෙන් ඉන්නවා වුණත්, මුදල් ඇමතිට ඒක අභිභවා යන්න පුළුවන් කියලායි. Clause 121 states, I quote:

"121 The Minister in charge of the subject of Finance may in consultation with the Minister, make regulations for and in respect of all or any of the following matters:-

(a) the sale of passenger tickets for travel by aircraft and the booking of passage for travel by aircraft;

(b) the collection of freight charges by on exports aircraft;

(c) the collection of freight charges on imports by aircraft, where contract for such carriage of freight is made in Sri Lanka;"

The benefit that is intended to get accrued through Clause 92 is completely offloaded by Clause 121 because you have got obnoxious clauses coming back, where you have one Minister going into the next Minister's activity. In a country, where we are looking at a delegating authority and decentralizing functions, you do not need to centralize it back again to the Minister of Finance. If so, you do not need a Minister of Aviation. These are things that need to be done. I appreciate that the Consultative Committee on Ports and Aviation was held yesterday but I am sure the President himself was stunned with disbelief that the officials were unable to comprehend certain questions that were posed to them. I am sure the Hon. Dinesh Gunawardena who was there was basically trying to defend but at the end of the day, he saw that there were certain realities.

Likewise, Clause 94 has another area which I highlighted because Clause 94 brings in the Computer Reservation System. This is certainly an area that has got to be looked at. But, I do not understand the overemphasis to have such a computer system, to have a licence which is operated every year. That is for nothing else but for the officials who play around. If it is an open system and if you accept the cargo system reservations or passenger system reservations, then you can give a licence that will be good enough to operate. But, if you say it is for one year, the huge capital cost that is going to be put, needs to be amortized in one year. Then, your cost per unit goes up. So, if you give it for five years, then you amortize it over five years. That was not understood by the officials and I am sure that was not something to be retained by the Government but it was only to give the competitive edge for the passengers who are there. This happened when Air Lanka was privatized. They made it "SriLankan". They changed the passenger computer system and gave the Emirates system. They brought in a huge capital and that is what they showed as capital infusion which was brought into the airline. Today, you are going to change all that.

Sir, Clause 94(3) states, I quote:

"A permit issued under subsection (1) shall be valid for a period of one year from the date of its issue and may be renewed at the end of that period on application made in that behalf and on the payment of the prescribed renewal fee".

Hon. Minister, I am sure you would take up these matters in the Cabinet. If you do not want anybody else to come in, it is well and good but ensure that there is a sense of competitiveness which finally gives the benefit to the consumer.

Look at Clause 94. I think the officials gave a response which was acceptable at the Consultative Committee, and I appreciate that. That needs to be spelt out in this. Now, e-ticketing is very common and you do not have a ticket that is bought. You just get a piece of paper that comes out. So, that is the paperless system that we are going into. If that is going to be the computer system in future, and if this piece of obnoxious law that has been brought in stops that, then where are you going to go? Are you going to tell -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
It is the practice followed.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
For God's sake, please listen, Hon. Member. Hon. Speaker, I would like to see Members who are responsive in listening. They jump like a jack-in-the-box not knowing what I have been explaining to a Minister who was there yesterday. [*Interruption.*] What I am telling is universal. Then, your laws should be universal in nature, not only a subsection which is applicable in Colombo. So, on that basis, you must ensure that e-ticketing is also gazetted and legislated so that it will be part and parcel of this.

Sir, then the next matter is, ensure that we basically have a shipping fund. It was started about five or six years ago, if I am not wrong, or maybe seven or eight years ago. Today, we do not know what has happened to the shipping fund. In Clause 113, you have basically said that you are going to start a Civil Aviation Development Fund. Clause 113 (1) states, I quote:

"There shall be established a Fund called the "Civil Aviation Development Fund", which shall consist of all monies credited to such Fund by the Director General under Section 104 and Section 114 of this Act".

[ගරු රවි කරුණානායක මහතා]

Now, when I mentioned it, the Hon. Minister was there and what did the President say? “Why do we need to have these funds under the Director-General?” Now, that is precisely what I am saying. If you have a Government policy, you do not need to have a fund which is at the beck and call of some Director-General. What is he developing? He is going to develop and provide civil aviation infrastructure in the country. That is none of his business. That is part of his action but he does not need to use the Civil Aviation Development Fund to do that. Then, Sir, Clause 113 (b) states, I quote:

"developing human resources needed for the provision of an efficient and safe aeronautical service within the country in accordance with the standards required under the Convention ;"

So, you do not need to use the Civil Aviation Development Fund. That is why the President told you to ensure that these funds come under one corporate fund or one compounded fund.

Sir, Clause 113 (c) states, I quote:

"any other function or activity which the Authority considers necessary to further the development of the civil aviation industry in the country."

I guess that is the only acceptable fact because if certain things are not accepted, then how can this fund be looked at? But, invariably this civil aviation funds are there in order to develop the industry *per se.* But, here what you are trying to do is infrastructure development. That has no relevance at all. That is Government policy. If the Government wants to have 10 airports, you do need not to have the Civil Aviation Development Fund to do that. Even if you have a fund, you will never be able to complete the capital expenditure through this fund. So, what is the purpose of having it at somebody’s beck and call. Instead of two vehicles he will use three vehicles and he will say that it was used for Civil Aviation Development Fund activity. So, Hon. Speaker, I wanted these matters to be further highlighted for these reasons. Now, I am happy that at least it has gone into a Standing Committee, which I proposed, instead of going to the Consultative Committee where it will be the same old thing that will be going on. Therefore, we can rectify ourselves.

Then, I must appreciate and I was also happy with certain things that were brought up by the Hon. Wimal Weerawansa under Section 88, which I thought was relevant. But, the issue that was there under Section 88 (3) that they should ensure that once a Government asset is bestowed on to a company through this basis that is spelt out, there should not be subletting anymore. Clause 88 (3) (c), states, I quote:

“grant a lease of any such property to any other person, without the prior written approval of the Authority.”

So, instead of that, you coulc say "no subletting" and that solves the problem. So, these are matters that need to be done and I am sure it had immediate reaction yesterday.

Hon. Speaker, all I could basically say is that we have taken all this time on a matter that officials should be resolving. If they consulted the industry - I do not say that we know it all. We also know only the hands-on experience of the relevant areas that we are dealing with. You have to develop the cargo area. The Hon. Arundika Fernando, Member of Parliament, contributed yesterday in this regard. We have got to develop in order to ensure that the industry is driven. Today, the industrialists say that they have never been consulted in this area.

Furthermore, under the salient legal provision of the draft Civil Aviation Bill which they have given as an attachment to us in order to enhance some knowledge, it states:

“Safeguarding airlines is against unfair state practices”.

Now, this very Government that is talking of protecting the consumer does not have any reference to that. That is what I mentioned yesterday. Now, in general, your hobby-horse was hammering the UNP, saying that we are for the businessmen. We are for the people. They are the ones who keep the thing going on. Our difference is that when you have a lot of consumers who have money, then you can get the business running. But, this Government feels that if you have the business, money will come in. No, it will not. That is what is happening now. Where is the cash? It is absolutely cash-strapped these days. You have businesses that are there. They are talking but nothing is moving because money does not come in. It only revolves round two to three per cent of the society. That is the difference.

So, Hon. Speaker, all I could basically say is that I touched on the areas of consumer affairs. Then, the other one is that you have lots of aircraft. I want to be a little political. There are many aircraft lined there at the airport. අපට union එකෙන් කියනවා, පොඩි පොඩි aircraft ගණනාවක් තිබෙනවාලු කියා. එකක් මැලේසියාවෙන් ආවාලු. අනෙක් එක ආවාලු තව තැනකින්. පොඩි පොඩි aircraft දීලා. මේවා කාගෙද? එක පැත්තකින් කියනවා එල්ටීටීඊ එක අප්‍රිකා රටේ airport අල්ලා ගෙන තිබුණාලු කියා. එක aircraft එකක "K" ගහලා තිබෙනවා ලු. අනෙක් එකේ "P" ගහලා තිබෙනවා ලු. මේ දෙකම KP ට අයිති ද කියලාත් කියා අහනවා. මේවාගේ දේවලුයි තිබෙන්නේ.

So, what are all these people who are saying that they have got to be licensed doing? Ensure that these aircraft are properly licensed. They are mushrooming and coming up all over not knowing that there are companies utilizing funds and basically buying aircraft instead of being commercially able. There are certain companies absolutely trying to develop the industry. I must say that there are some young talented teams that are there. This

country can basically make itself as the cargo hub for the Indian subcontinent. That is for sure. Even though we might not be able to make it for the passengers, our geographical location helps us. The port is well located. The country is well located. But, owing to the mismanagement and misdirection of the policies of the Government, we have not been able to do so. These are the areas that we should have been looking at when privatizing SriLankan Airlines. These were the things that should have been looked at. We looked at the correct partner but not the correct policy. That was the problem. Now, we have an aviation policy that should have been put in place 10 years ago. So, we are beginning today what should have been done 10 years ago. The laws that should be enacted in 2010, is not even being looked at.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Are you talking for this Bill or against this Bill?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
If you cannot understand what I say, probably in the Debate we can listen and see who knows what the industry is.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
That is what I am asking, are you talking for this Bill or against this Bill?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
You can take only one stand. -*[Interruption.]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
If you have not understood, you can take it from the debate that is there. I am sure the Hon. Dinesh Gunawardena could understand and even the President understood in one hour what we basically said. I do not need to relate to a backbencher Member of Parliament, who basically goes carrying bags for the President where ever he goes. [*Interruption.*]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
Do not forget that you too were a backbencher sometime back. [*Interruption.*]

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Where is the Sathosa asset? [*Interruption.*]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
All I have got to say is that you have been a part and parcel of the economy losing Rs. 900 million in 2009, Rs. 2,500 million in 2008, Rs. 190 million in 2006 and I cannot remember what your loss was in 2007. If all these were put together, you do not need to increase the price of bread. අද පාන් ගෙඩිය රුපියල් 50 වෙන්නේ නැහැ, ඔය "මිහින් එයාර්" වාගේ ඒවා තිබුණේ නැත්නම්. මේක තමයි තිබෙන්නේ. ඉතින් මම මේ අවස්ථාවේදී දන්නා විෂය දැන ගෙන කථා කරනවා මිසක් නිකරුණේ ඒක පටන් ගත්තා කියලා ඇද ගෙන යන්නේ නැහැ. අපෙන් අහනවා මොනවාද ඒ කථා කළේ කියලා. ජනාධිපතිතුමාට තේරුණා ඊයේ පැයෙන්. මෙතුමාට මම හිතන්නේ දවසක් කථා කළත් තේරෙන්නේ නැති නිසා ඒකට උත්තරයක් දෙන්න අවශ්‍යතාවක් නැහැ. ඉතින් මේ සම්බන්ධයෙන් මට කියන්න පුළුවන් වෙන්නේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, කරුණාකරලා -

We also have ground handling. I spoke to the decision -makers of the Sri Lankan Airlines today. They themselves like challenges and competition. Hon. Speaker, you mentioned during your term that you would like to ensure that nobody will be able to get a cartelization or a monopoly of a particular thing. But, do not let two Government institutions compete. Ensure that there is a private partnership so that competition takes place. Then, you can download certain capital cost that is there. That should be put to the benefit of the consumer.

The airport does not reflect that the entire system goes well. You need to do something. You can bring down the cost of the ticket by at least 35 per cent. That could be done if a proper policy is there; if competition is there. You have budget airlines, but you must ensure that they are budget airlines. By Air Asia, you are able to go to Thailand at Rs. 7,000. By Thai Airways, you are able to go at Rs. 30,000. By SriLankan Airlines, it will cost Rs. 35,000. That is what a budget airline is. You do not need to have a budget airline that goes to Maldives at Rs. 28,000 when SriLankan Airlines goes at Rs. 31,000. What is the "budget" in that? That is, you are trying to exist as an airline just for the sake of its survival. Those are policy -oriented. Air Asia is not losing money. That is a private company. That is what you should basically have if you want to have Mihin Lanka also in the Sri Lankan aviation industry.

So, Hon. Minister, all we can basically say is, ensure that this is looked at. Ground handling is necessary. Likewise, I think the Hon. Arundika Fernando mentioned about catering. I think the Hon. Sarath Kumara Gunaratne from Gampaha also mentioned about the competitive element that was there. You must have catering that takes place there because these are cash cows. Catering makes

[ගරු රවි කරුණානායක මහතා]

Rs. 980 million, I think. Ground handling makes Rs. 1.5 billion. If both are put together, the loss of the SriLankan Airlines can be reduced because of the group handling of these two items.

So, these are the things that need to be included in this particular Bill and ensure that those are basically strengthened and fortified, so that you are able to have an industry, which we can proudly say, has legislation to ensure that the industry can go forward. Today, this is one of the biggest problems that is there. You do not know at what moment you have legislative changes coming in. You must have coherent, consistent, crisp and clear policies in place. Then only you can take the Government forward. Just because you pick a UNPer from here who works well in the UNP machinery, do not think that the machine works well at that end. It proves that just because you take a nut, that does not mean that the machine works. The machine is here. That is the difference.

So, Hon. Speaker, I do not want to take much of your time because we agreed that we will try to reduce the time. But, I only hope that we go on record that next time when this is corrected and rectified and when we bring in those amendments, - I am sure you will have to send it to the Attorney-General's Department and the Department of Legal Draftsman again - we will be able to speak again because we need to ensure that this is perfected and let us bring something on national interest. That is what we, from the Opposition, are saying. Just because we are in the Opposition, it does not mean that all what we recommend should be ridiculed. What we give in is sometimes more essential than just basically approving the Government proposals. So, Sir, we would like to ensure that this is rectified and brought in line with international compliances; we are not standing in that way. But, ensure that it is done so that it stands with the growth of the industry rather than being a roadblock to the development of the industry.

Thank you, Sir.

[අ. භා. 2.52]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම හිතන්නේ අපේ රටේ ජාතික වශයෙන් ඉතාමත්ම වැදගත් වන පනත් කෙටුම්පතක් තමයි අද අප මේ සාකච්ඡාවට ලක් කරන්නේ. ඒ නිසා විශේෂයෙන් නැවත අවස්ථාවකදී කාරක සභා අවස්ථාව සඳහා දැන් අද ඉදිරිපත් කරපු සංශෝධනත් සලකලා, ඒ සංශෝධනයන් පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමන්ලාගේ අධ්‍යයනයක්, සංවාදයක් ඇතුව මීට වඩා පුළුල් ආකාරයට මේක සාකච්ඡා කිරීම වැදගත් වනවා. ඒකේදී මූලික වශයෙන් කාරණා කීපයක් ඉස්මතු කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අප කවුරුත් දන්නවා අපේ රටේ ජාතික වශයෙන් වැදගත් ආයතන දේශපාලනීකරණය කිරීමේ වරදට අප රටක් හැටියට ඇති තරම් වන්දි ගෙවලා තිබෙනවාය කියලා. අපේ දේශපාලන ප්‍රතිරූපයකට හෝ දේශපාලන මිත්‍රත්වයකට හෝ ජාතික ආයතන යොදා ගැනීම පාපකාරියි. අප කියන්නේ දැන් මේ සිදු වන සිදු වීම්වලත් එවැනි වැරැද්දක් සිද්ධ වෙනවා නම් ඒකේ වන්දිය ගෙවන්න වන්නේ අනාගත පරම්පරාවට කියලායි. සිවිල් ගුවන් සේවාව, ගුවන් සේවා අධිකාරිය පිහිටුවීම, ඒක ඇතුළේ හදන මේ වෙනස්කම් බලපාන්නේ අපේ මුළුමහත් ජාතියටමයි. ඒක නිසා තමයි අප කියන්නේ මේවා පිළිබඳව මීට වඩා රටක් හැටියට අවධානයට ලක් කරන්න ඕනෑ කියලා. නමුත් අප දන්නවා අර බූලත් හෙප්පුවට හෙණ වැදුණාට පස්සේ හුනු කිල්ලෝටෙට වුණේ මොකක්ද කියලා අහලා වැඩක් නැහැ කියලා. ඒ වාගේ තමයි දැන් තියෙන්නේ. මුළු ක්‍රියාවලියටම අද හෙණ වැදිලා තියෙන්නේ. නමුත් මේ කාරණාවේදී විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ දේවල් ටිකක් තියෙනවා. අප කවුරුත් දන්නවා දැනටමත් European Commission එකට අයත් රටවල්වල ගුවන් සේවාවන් නිශ්චිත ප්‍රමිතියෙන් නැති බව. යුරෝපා කොමිසමේ වාර්තාවක් වෙබ් අඩවිවල තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යුරෝපා කොමිසම air safety හරියාකාරයෙන් පවත්වා ගෙන යන්නේ නැති නිසා විශේෂයෙන් අප්‍රිකානු රටවල සහ ඇෆ්ගනිස්ථානය වැනි රටවල ගුවන් සේවාවන් ගණනාවක්ම ලැයිස්තු ගත කර තිබෙනවා, ban කරන මට්ටමට. ඒක බලපවත්වන හැටියට වෙබ් අඩවියේ තිබෙන්නේ, 2010.09.09 වන දා සිට යි. මොකද, සිවිල් ගුවන් සේවා පවත්වා ගෙන යාමේදී ඒ ගුවන් සේවාවල පවත්වා ගත යුතු ප්‍රමිතිය නිසියාකාරයෙන් නොමැතිකම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ගරු දයාශ්‍රිත තිසේරා මැතිතුමා මේ පනත් කෙටුම්පත ගැන පැහැදිලි කළා. 1944 වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අප සම්බන්ධ වී තිබෙනවා. අද ඉදිරිපත් කර ඇති මේ පනත් කෙටුම්පතේ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලියට අප අදාළ වී තිබෙනවා. නමුත් අපේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් මේ රටේ ජාතික වැදගත්කම, එහෙම නැත්නම් ජාත්‍යන්තර ප්‍රමිතීන්, ජාත්‍යන්තර නීතින් අදාළ කර ගන්නේ නැතිව නම් අප ගුවන් සේවාවල තත්ත්වය -විශේෂයෙන් මිහින් ලංකා ගුවන් සේවාව- පවත්වා ගෙන යන්නේ, ඒ ගැන සලකා බැලිය යුතු වනවා. යුරෝපා කොමිසමේ අද මේ ban කර තිබෙන, restrictions දමා තිබෙන ගුවන් සේවාවන් ගැන බලන විට, ඒවාත් එක්ක සම්බන්ධ කරලා හිතන කොට අප ඉන්නේ හුඟක් පහළ මට්ටමකයි. නමුත් මැද

පෙරදිග සහ මාලදිවයින, ඉන්දියාව වැනි කලාපීය රටවලට පමණක් අපේ ගුවන් සංචාරයන් සීමා වන නිසා මිහින් ලංකා ආයතනයට -අපට- ගැලවිල්ලක් තිබෙන්නට පුළුවන්.

ගරු ඇමතිතුමන්ලාගේත් අවධානය සඳහා, තහනම් කර තිබෙන සහ තහංචි පනවා තිබෙන ගුවන් සේවාවන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා යුරෝපා කොමිසමේ වාර්තාව මා **සභාගත*** කරනවා.

දීර්ඝ ලැයිස්තුවක් තිබෙනවා. 2010 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 09 වන දා ඒ අය අලුතෙන්ම ලැයිස්තු ගත කර තිබෙනවා ගුවන් සේවාවන්. ඔබතුමන්ලාට තකහනියේ, කඩිමුඩියේ, හදිසියේ මේ පනත් කෙටුම්පත ගෙන එන්න බලපාන්නට පුළුවන් ජාත්‍යන්තර සාධක ඒවා වන්නට පුළුවන්කම තිබෙනවා. නමුත් එහෙම ජාත්‍යන්තර වශයෙන් බලපෑම් ඇවිත්, යුරෝපා කොමිසමෙන් බලපෑම් ඇවිත්, ඒ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳව අපට ඇඟිල්ලෙන් ඇන්නාට පස්සේ, අප අවදි කළාට පස්සේ මතක් වෙලා ප්‍රමිති හදන එක නොවෙයි කෙරෙන්නට ඕනෑ දෙය වශයෙන් තිබෙන්නේ. අපේ රටේ ජාතික ගුවන් සේවාව, අපේ අභිමානය, අපේ රට පිහිටා තිබෙන තැන අනුව ගත්තාම විශේෂයෙන්ම ජාත්‍යන්තර වශයෙන් වැදගත් මූලික කාරණා දෙකක් වන්නේ ගුවන් සේවා සහ නාවුක ගමනාගමනයයි. එම නිසා අපේ ලංකාව පිළිබඳ අභිමානය ලෝකයට ගෙන යන්නට තිබෙන ප්‍රධානම මාර්ගයක් තමයි ගුවන් සේවාව හා නාවුක සේවාවන් නිසියාකාරයෙන් පවත්වා ගෙන යාම. ඒක ජාත්‍යන්තර ප්‍රමිතියෙන් කටයුතු කෙරෙන එකේ වගකීම තිබෙන්නේ රජයට. ඒක දැන් කළ යුතුව තිබෙනවා. ජාත්‍යන්තර ප්‍රමිතිය තිබෙන ගමන් දේශපාලන ප්‍රමිතිය අයින් කරන්න ඕනෑ. අද අපි දන්නවා, අපේ සිවිල් ගුවන් සේවා අධිකාරියට ආයතන 26ක් තිබෙන බව. මෙතැන තිබෙන බරපතළම සැකය මොකක්ද? 2007 අවුරුද්දේත් මේ පනත ගෙනෙන වෙලාවේදී අපි සංවාදයට ලක් කළා; මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළා; කරුණු ඉදිරිපත් කළා. අපේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත සමරසිංහ මන්ත්‍රීතුමා ඒ වෙලාවේ දීර්ඝ වශයෙන් මේ පිළිබඳව අධ්‍යයනය කළා; කරුණු ඉදිරිපත් කළා. ඒ වෙලාවේදී ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ හිටපු ඇමතිතුමා ඒක පිළිගත්තා. ඒකයි වැදගත් දේ. ඒ වෙලාවේ අපි ඉදිරිපත් කරපු කරුණු පිළිගත්තා. ඒ නිසා මේක තාවකාලිකව නැවැත්වූවා.

විශේෂයෙන්ම මෙන්න මේ ආයතන පෞද්ගලික අංශයට පවරන්න, මේ ආයතනවලට විවිධ අයව සම්බන්ධ කරන්න, විවිධ දේශපාලන වුවමනාවන්ට මේකට මිනිස්සු ඇඳන්න, පුද්ගලයින්ට සේවාවන් විකුණන්න වැනි දේවල් ගැන අපි කරුණු ඉදිරිපත් කළා. මිලදී ගැනීම් කරද්දී ගුවන් සේවාවට විශාල වශයෙන් මිලදී ගැනීම් කරන්න තිබෙන බව අපි දන්නවා. ඒ මිලදී ගැනීමේදී පෞද්ගලීකරණ ක්‍රියාවලියකට මේක ලක් කිරීමේ ඉඩකඩ තිබෙනවා. ඒ නිසා තමයි වෘත්තීය සමිති මේ ගැන දැඩි අවධානයක් යොමු කර තිබෙන්නේ. වෘත්තීය සමිති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෙන්න පුළුවන්, එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්න පුළුවන්, පක්ෂ භේදයෙන් තොරව තමුන්නාන්සේලාගේ අවධානයට ලක් කරලා තිබෙන්නේ එක කාරණාවයි; සිවිල් ගුවන් සේවා අධිකාරිය යටතේ තිබෙන මේ ආයතනවලින් ලබා දෙන මුළු ක්‍රියාවලිය දේශපාලන හිතවත්කම්වලට ගජ මිතුරන්ට දෙන්න ඉඩ තියන්න එපා කියන කාරණාවයි. ඒ සඳහා වන ව්‍යවස්ථාපිත නීතිය පාර්ලිමේන්තුවේ සම්මත කරන්න එපා කියන දේ තමයි අපි අවධාරණය කරන්නේ. අපි දන්නවා ඒකට දේශපාලන බැඳීම් තිබෙන්න පුළුවන්, දේශපාලන මිත්‍රකම් තිබෙන්න පුළුවන්, දේශපාලන හිතවත්කම් තිබෙන්න පුළුවන්, හැබැයි ඒ දේශපාලන හිතවත්කම් මත, ඥාති සංග්‍රහය මත මේ ආයතනය විනාශ වෙන්න දෙන්න එපා කියන කාරණාව තමයි රටේ ජනතාව වෙනුවෙන් අපට අවධාරණය කරන්න තිබෙන්නේ. නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක තමයි මූලික වශයෙන් අවධාරණය කරන්න තිබෙන්නේ.

ඒ වාගේම රවි කරුණානායක මන්ත්‍රීතුමාත් මේ කාරණය අවධාරණය කළා. විශේෂයෙන්ම මේක අපේ රාජ්‍ය ගුවන් සේවාව නම්, අද මේ රාජ්‍ය ගුවන් සේවාව රජය යටතේ ලාභ ලබන ආයතනයක් බවට පත් කර ගන්න ඕනෑ නම් ඔබතුමන්ලාට පුළුවන් මේ ගැන සලකා බලන්න. දැනටමත් රාජ්‍ය නිලධාරින් විශාල ප්‍රමාණයක් විදේශගත වෙනවා. විදේශගත වන කොට පාවිච්චි කරන්නේ ලංකාවේ ගුවන් සේවාව නොවෙයි. රාජ්‍ය නිලධාරින් විදේශගත වෙද්දි හුඟ දෙනෙක් විවිධ වෙනත් ගුවන් සේවාවන් තමයි පාවිච්චි කරන්නේ. දැන් ඔබතුමන්ලාට පුළුවන් යම් කිසි සහතිකයක් දෙන්න, තහවුරුවක් හදන්න, රජයේ නිලධාරින්ට යම් ප්‍රමිතියක් ඇති කරන්න, ඒ විදේශ ගමන්වලට රජයේ මුදල් නම් වියදම් කරන්නේ වෙනත් ගුවන් සේවාවන්වලට ඒක යොදවන්න අවශ්‍ය වන්නේ නැහැ, රාජ්‍ය ගුවන් සේවාව ඒ සඳහා පාවිච්චි කරන්න කියලා.

නමුත් අපි දන්නවා, අනන්තවත් ඒ දේ එහෙම සිද්ධ වන්නේ නැහැ. ඒ වාගේම මේ සංශෝධන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ දී අපි නැවතත් ඒ ගැන වැඩිපුර අවධානයක් යොමු කරවන්නට බලාපොරොත්තු වනවා. විවිධ සේවාවන් සපයන්නන්ට පෞද්ගලික ක්‍රියාවලියක් හරහා එන්න මෙයින් ඉඩකඩ හදලා දීලා තිබෙනවා. ඒකට බාධාවන් ඇති කරන්නට ඕනෑ. ජාත්‍යන්තර ප්‍රමිතියකට මේක ලක් කරනවා වාගේම, සේවාවන් ලබා ගන්නවා වාගේම, විවිධ ආයතනවලින් පහසුකම් ලබා ගන්නවා වාගේම, ඒ පහසුකම් සැපයීම හරහා ඕනෑම කෙනෙකුට බාධාවකින් තොරව, සුදුසුකම් ඇති, නැති භේදයකින් තොරව මා කලින් කිව්වා වාගේ දේශපාලන හිතවත්කම් මත, දේශපාලන ක්‍රියාවලියක් ඇතුළේ මේකට සම්බන්ධ වන්නට ඉඩකඩ හදනවා නම් එය අහිතකරයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මේ අදාළ සංශෝධනයන් ඇතුළේ - මා සැලකිය යුතු ප්‍රමාණයක් කියවන්නට උත්සාහ කළා.- සිදු වන්නට යන හානිකර පැත්ත ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කර, එවැනි දේශපාලන ඥාති හිතවත්කම්වලට මේ ආයතන පෞද්ගලීකරණයට ලක් කරන්නට, කොටස් විකුණන්නට, කොටස් මිලදී ගන්නට ඉඩකඩ හදනවාද, එහෙම නැත්නම් ඒ ඉඩකඩ වහනවාද කියන එක ගැන කල්පනා කර බලන්න. ජාත්‍යන්තර ප්‍රමිතිය අනුවත්, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා නීතිරීති අනුවත්, යුරෝපා කොමිසමේ වගකීම අනුවත් අපි ජාත්‍යන්තර ප්‍රමිතියක් හදන්නට ඕනෑ බව ඇත්තයි. හැබැයි ඒ ප්‍රමිතිය හදන මුවාවෙන් මේක දේශපාලන හිතවත්කම්වලට කෑලි කෑලිවලට බෙදා දෙන්නට ඉඩ හදන්නට නම් එපා කියලායි අපි කියන්නේ. එහෙම කළොත්තින් ඒකෙ වන්දිය ගෙවන්නට සිදු වන්නේ අනාගත පරම්පරාවටයි. එක පුද්ගලයෙක්, දෙන්නෙක් සතුටු වෙයි. එක පුද්ගලයෙක්, දෙන්නෙක් සැප විඳියි, එක පුද්ගලයෙක්, දෙන්නෙක් මේකෙන් තවත් බෝකර ගනීවි. හැබැයි මුළුමහත් ජාතියම ඒකෙන් විනාශයට පත් වනවා. නැවත ඒක ගොඩ නඟන්නට බැහැ. Air Lanka ගුවන් සේවාව පෞද්ගලීකරණය කිරීමේ ප්‍රති විපාක අපි වින්දා. ඔබතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට එදා විපක්ෂයේ ඉඳ ගෙන ඒ වෙනුවෙන් හඬ නැඟුවා. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමන්ලා එදා ඒ වෙනුවෙන් කෑගැහුවා. ඒ කෑගහපු කටවල් තමයි අද මේ තිබෙන්නේ. ඒ නිසා හැම දෙයකදීම ඔබතුමන්ලාට නිහඬ වන්නට අයිතියක් නැහැයි කියලා අපි විශ්වාස කරනවා. ඔබතුමන්ලාට වෙන කර කියා ගන්නට දෙයක් නැතිව නිහඬ වන දේශපාලන සංසිද්ධීන් තිබෙන්නට පුළුවන්. හැබැයි ඔබතුමන්ලා පෙනී හිටපු දේවල් මේවා. අද Air

***** ***ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
* ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
* *Document not tendered.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

Lanka ආයතනය රැකෙනවා නම්, ඒක ජාතික ගුවන් සේවාව හැටියට තිබෙනවා නම්, ඒකෙ ගෞරවයේ විශාල පංගුව ලැබෙන්නේ අද ආණ්ඩු පක්ෂයේ වාඩි වෙලා සිටින ඔබතුමන්ලාටයි. ඒක අපි පිළිගන්නවා. ඔබතුමන්ලා ඒ වෙනුවෙන් හඬ නඟපු අය. වමේ දේශපාලනය නිසා හරි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසා හරි, බණ්ඩාරනායක මහත්මයාගේ නමින් ජාත්‍යන්තර ගුවන් තොටුපොළ තිබුණු නිසා හරි, ඒ ගැන හිතලා හරි ඔබතුමන්ලා ඒ වෙනුවෙන් පෙනී හිටපු කණ්ඩායමක් හැටියට එක් කෙනෙකුගේ, දෙදෙනෙකුගේ දේශපාලන වුවමනාවන්වලට අද මේ ගුවන් සේවය විනාශ වන්නට ඉඩ තබන්න ඔබතුමන්ලාට අයිතියක් නැහැයි කියලා අප විශ්වාස කරනවා. එහෙම වෙන්න දෙන්න එපා. ඒ ඉල්ලීම තමයි අපට කරන්නට තිබෙන්නේ. ඒ ඉල්ලීම විතරයි අපට කරන්නට තිබෙන්නේ. ඒකට ඉඩ තබන්න එපා. මේ ආයතනය දේශපාලනීකරණය වන්නට ඉඩ දෙන්න එපා. මේ ආයතනයේ ජාත්‍යන්තර නීති හදන්නට ඕනෑ, නීතිවලට අනුව කටයුතු කරන්නට ඕනෑ වාගේම ඒක විනාශ වෙන්නට ඉඩ දෙන්න එපාය කියන ඉල්ලීම තමයි කරන්නට තිබෙන්නේ. බොහොම ස්තුතියි.

[අ. භා. 3.03]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කෙටියෙන් හෝ අදහස් ප්‍රකාශ කරන්නට මට අවස්ථාව ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා. විශේෂයෙන්ම සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගුවන් යෝග්‍යතා ඉංජිනේරුවකු වශයෙනුත්, ඒ වාගේම විධායක අධ්‍යක්ෂකවරයකු වශයෙනුත් මා සේවය කළ නිසා මෙම පනත් කෙටුම්පත සම්පාදනය කිරීම සඳහා දායකත්වය ලබා දීමට හැකි වීමත් මා ලැබූ භාග්‍යයක් කියා මා හිතනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පතට සංශෝධන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. කාරක සභා අවස්ථාවේදී එම සංශෝධන සම්මත කර ගැනීමට හැකි වෙයි කියා මා විශ්වාස කරනවා.

විශේෂයෙන්ම 'මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව ශ්‍රී ලංකාවේ වේගවත් සංවර්ධනයට පංචකේන්ද්‍රීය සංකල්පය ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරනවා. ඒ තුළින් ඉදිරියේ දී ජාත්‍යන්තර වශයෙන් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් ඇති වන අතර, ඒ සඳහා ජීවය ලබා දෙන්නේ ගුවන් කේන්ද්‍රීය සංකල්පය බව පැවසුවොත් එය නිවැරදියි. ඒ වාගේම ගුවන් සේවය ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයටත් විශාල පිටුවහලක් වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. අද මත්තල වැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළවල් පමණක් නොව රටේ අභ්‍යන්තරයේ තිබෙන ගුවන් තොටුපොළවල් ද සංවර්ධනය වන අතර චන්ද්‍රිකා අභ්‍යවකාශගත කිරීම් වැනි කාර්යයන් ද අනාගතයේදී සිදු වේ යැයි අප විශ්වාස කරනවා. අපේ අනාගතය භාර ගන්න ඉන්න දූ දරුවන්ට චන්ද්‍රිකා අභ්‍යවකාශගත කිරීමේ හැකියාවක් ලැබේවි කියලා අප විශ්වාස කරනවා. චන්ද්‍රිකා අභ්‍යවකාශ ගත කිරීමේදී අප රටේ භූගෝලීය පිහිටීම ඉතාමත් වැදගත් සාධකයක් වෙනවා.

1948 දී ශ්‍රී ලංකාව අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රඥප්තිය අත්සන් කළා. ඒ ප්‍රඥප්තිය අත්සන් කිරීමෙන් පසුව 1950 අංක 15 දරන ගුවන් සංතරණ පනත -Air Navigation Act - නිර්මාණය කළා. එය නිර්මාණය කිරීමෙන් පසුව 1997 දී බැඳුම්කාර රාජ්‍යයක් ලෙස සිවිල් ගුවන් සේවය නිරුපද්‍රිතතා සුපිරික්සුම් -safety oversight- විගණනයට ලක් වුණා. ඒ විගණනයේදී කෙරුණු නිර්දේශයන් අතර තිබුණු වැදගත්ම නිර්දේශයක් තමයි අපේ යල් පැන ගිය, එහෙම නැත්නම් අඩු පාඩු සහිත Air Navigation Act එක සංශෝධනය කිරීම. මේ මාසය අවසානයේ නැවත වරක් ICAO ආයතනයෙන් අපේ රටේ අන්තර් සිවිල් ගුවන් සේවය පිළිබඳව නිරුපද්‍රිතතා විගණනයක් කෙරෙනවා. මෙම සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත සම්මත කර ගැනීම තුළින් අපට ඒ විගණනයෙන් සමත් වන්නට හැකියාවක් ලැබේවි කියා අප බලාපොරොත්තු වෙනවා.

Hon. Deputy Chairman of Committees, air transport is critical to our global society. It represents some eight per cent of the world's GDP and is an economic lifeline for many developing countries like Sri Lanka. So, in order to actively participate in international civil aviation without impediments, it is vital that Sri Lanka shall effectively implement and enforce international standards and recommended practices adopted by the International Civil Aviation Organization. I am happy to note that the Civil Aviation Bill has laid a good foundation for this purpose.

The International Civil Aviation Organization - ICAO - is a specialized agency of the United Nations charged with the subject of civil aviation. It was created in 1944 to promote the safe and orderly development of international civil aviation throughout the world. The ICAO has 190 Member States to date.

Safety is paramount for the growth of civil aviation as people will place confidence on air transportation if and only safety is guaranteed.

Sri Lanka should also be mindful of the impact of civil aviation on environment. We should align ourselves with the ICAO environment programme for addressing carbon dioxide emissions in aviation. It will not only reduce emissions but also will contribute to fuel efficiency which is the key to reduce the cost of air travel. Also, Sri Lanka should implement the ICAO standards on aircraft noise so that the airports will be much quieter.

Beyond safety, security and environmental sustainability aspects of aviation, great strides have been made globally for improving the efficiency of air transport operations, in technological and operational terms. This in turn will make it possible to further reduce fuel burn, and hence emissions lower the risks associated with accidents and improve customer service. Airlines prefer flying on user defined trajectories for cost saving. Sri Lanka should get ready to implement the Performance -Based Navigation - PBN - giving benefits to the airport users.

The Bill presented before you today does that in order to develop the civil aviation as it gives provision for developing or providing the civil aviation infrastructure and human resources in the country and many other development activities in air transportation.

Most importantly, Sri Lanka, being a signatory to the Convention on International Civil Aviation, is bound to implement the standards given by 18 Annexes to the Convention as the minimum standard in the identified area of aviation. For example, Annex 6 (Operations) describes the minimum standards that require to be met in the operation of aircraft.

This being the primary aviation legislation, it could be said is the foundation of aviation in our motherland. Development in civil aviation would not only make air travel more accessible to the public, but also would increase safety, efficiency, availability, frequency, reliability and lower cost.

Some of the economic benefits anticipated are, developing new aircraft maintenance facilities whereby we would be able to cater to international markets in maintaining a varied range of aircraft and its components and opening of a new civil aviation training centre to provide skilled staff to serve in aviation. That will be needed not only to cater to local civil aviation requirements but also can be used as a good source for earning foreign exchange by sending our youths for employment abroad. There is a good demand in the Middle East for skilled workers in aviation. If we train our youths in such areas and send them there for employment, it will be far better than sending housemaids there.

By giving priority to the youths of the country and harnessing the intellect of the returning aviation experts, we would be able to design and manufacture light aircraft in our country. By doing all this, we would be able to increase the Gross Domestic Product and reduce unemployment rates and improve the international trade. As per the "Mahinda Chintana - Vision for the Future", by carrying out the above activities, we would be able to create great enterprises to conquer the world.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාරක සභා අවස්ථාවෙන් පසුව සංශෝධන සමඟ මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා පක්ෂ භේදයකින් තොරව අපි සියලු දෙනාම සහයෝගය ලබා දිය යුතුයි.

අද මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරපු වරාය හා ගුවන් සේවා අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම එම විෂයය භාරව හිටපු අමාත්‍ය වර්තමාන ගරු කථානායකතුමාට, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ලා දෙපළ ප්‍රමුඛ එම අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ට, සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපතිතුමා, ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලුම නිලධාරින්ට සහ අදහස් දැක්වූ නිදහස් සේවක සංගම්වල සියලුම නිලධාරින්ට මාගේ ගෞරවයත් මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම ඉදිරියේදී පැවැත්වෙන සිවිල් ගුවන් සේවා විගණනයේදී ඔබගෙන් ලැබෙන සහයෝගය තුළින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම අප රටේ ගුවන් සේවාවල පවතින ඒ ගුණාත්මකභාවය ලොවට ප්‍රදර්ශනය කිරීම සඳහාත් හැකියාවක් ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 3.12]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், விமானச்சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Aviation)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ඇති සිවිල් ගුවන් සේවා අධිකාරියට අදාළව සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී ඒ වෙනුවෙන් අදහස් දක්වපු සියලුම මහ ජන නියෝජිතයන්ට විෂයය භාර ගරු අමාත්‍යවරයා මෙන්ම අපේ රටේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා වෙනුවෙන් ප්‍රථමයෙන්ම මගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා.

අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී මා මේ කාරණය මතක් කළ යුතුයි. මේ ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පතට පෙර, සිවිල් ගුවන් සේවා අධිකාරිය සම්බන්ධයෙන් 1950 අංක 15 දරන ගුවන් සංතරණ පනත පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තා. ඒ සම්මත කර ගත්ත පනතට1950 සිට 2010 වර්ෂය දක්වා විටින් විට පාර්ලිමේන්තුවේදී සංශෝධන ඇතුළත් කර තිබුණා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ අනුව 1952, 1964, 1981, 1982, 1983, 1987, 1988, 1992 සහ 2003 කියන වර්ෂවලදී 1950 අංක 15 දරන ගුවන් සංතරණ පනතට සංශෝධන ඇතුළත් වුණා. ඊටත් අමතරව 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත මේ පාර්ලිමේන්තුව තුළදී සම්මත කර ගත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂය, විපක්ෂය හැටියට අපි අද මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී විශේෂයෙන් විපක්ෂය තුළින් විවිධ අදහස් ඉදිරිපත් වුණා. ඒ හා සමානවම චෝදනාත් ඉදිරිපත් වුණා. ඒ වාගේම කාරක සභා අවස්ථාවේදී නොයෙක් යෝජනාත් ඉදිරිපත් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තිබුණු පනත වෙනුවට නව පනතක් ඉදිරිපත් කරන්න හේතු සාධක වුණු කරුණු මොනවාද කියලා මෙහිදී අප කල්පනා කර බැලිය යුතුයි.

1950 ඉඳලා 2010 දක්වා වූ කාලය කියන්නේ අවුරුදු 60ක දීර්ඝ කාලයක්. මේ වකවානුව තුළ රටේ ඇති වූ නොයෙක් වෙනස්කම්වලට, ජාත්‍යන්තරයේ ඇති වූ නොයෙක් වෙනස්කම්වලට අප මුහුණ දී තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. 2005 වර්ෂයේදී බලයට පත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ජයග්‍රහණයන් ලබා දෙමින් රට ඉදිරියට ගෙන යමින් තිබෙනවා. රට ආර්ථිකමය වශයෙන් සංවර්ධනය කරා ගෙන යෑම වෙනුවෙන් තිබෙන නීති රීති, අණ පනත් වෙනස් කර ගැනීමට යම් යම් අවස්ථාවලදී අපට සිදු වනවාය කියන එක අප මතක් කරන්න ඕනෑ.

1950 දී ජාත්‍යන්තරයත් එක්ක අපේ සම්බන්ධතාවන් ඇති කර ගැනීමේදී අද මේ ක්ෂේත්‍රයේ තිබෙන පරාසය තරම් පුළුල් පරාසයක අපට ඉන්න ලැබුණේ නැහැ. අද තිබෙන භෞතික සම්පත් ප්‍රමාණය දිහා බලද්දී එදා තිබුණු භෞතික සම්පත් සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එදා ජාත්‍යන්තර රටවල් එක්ක සම්බන්ධකම් පැවැත්වූවාට වැඩිය ඉතා විශාල ප්‍රමාණයකින් නව ජාත්‍යන්තර ප්‍රජාව සමඟ එකතු වන්න අද අපට සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ ඉදිරි අනාගතය ආරක්ෂා කර ගැනීම සඳහා කැප වන වෙලාවලදී අපට අවශ්‍ය

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

වනවා මහින්ද චින්තනය. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයෙහි එක තැනක ලියැවී තිබෙනවා නිල් අහස ජය ගැනීම අපේ පරමාර්ථයයි කියලා. "පංච මහා කේන්ද්‍රය" සංකල්පය ජය ගන්න අවස්ථාවේදී අපට අවශ්‍ය වනවා ජාත්‍යන්තරය එක්ක සබඳතාවන් පවත්වා ගන්න. එහිදී රටේ තිබෙන දේපොළ සියල්ල ආරක්ෂා කර ගැනීමේ වග කීමත් අපට පැවරෙන නිසායි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්නේ.

1944 විකාගෝ නුවරදී ආරම්භ කළ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා අධිකාරිය හෙවත් ICAO කියන ජාත්‍යන්තර සංවිධානය අද ලෝකයේ රටවල් 190ක සිවිල් ගුවන් සේවා වැඩ පිළිවෙළත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. යම් රටක් ඒ වගකීම ඉටු කරනවාද, ඒ ආරක්ෂාව, සේවා සැපයීම ජාත්‍යන්තර ප්‍රමිතියට ලබා දෙනවාද කියන එක ඔවුන් බලාපොරොත්තු වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි ජාත්‍යන්තරය අත හැරලා, "නෑ, අපි තනියෙන්ම ජීවත් වනවා. මේක අපේ රට. අපි විසින්ම තීන්දු අර ගෙන ජීවත් වනවා" කියන මානසිකත්වයෙන් කටයුතු කරන්න අපට බැහැ. ජාත්‍යන්තරය සමඟ සබඳකම් පවත්වන කොට අපට අවශ්‍ය වනවා ඒ ජාත්‍යන්තර සංවිධානත් එක්ක එකට එකතු වෙලා වැඩ කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය -ICAO- ගැන කථා කරමින් යම් යම් අවස්ථාවලදී මේ පනත් කෙටුම්පත ගැන අර්ථ කථනයන් ඇති කරනවා, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් අපේ රටේ මේ විෂයය පථයට අයත් වන රාජ්‍ය ආයතන පෞද්ගලීකරණයක් කරන්න යනවා, ICAO කියන සංවිධානයට ඕනෑ විධියට අපේ රටේ පනතක් හදන්න යනවා කියලා. එබඳු විවේචන අපට යම් යම් තැන්වලදී අහන්න සිද්ධ වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අතිගරු මහින්ද රාජපක්ෂ ජනපතිතුමා මේ රටේ නව දේශපාලන පිටුවක් ආරම්භ කරපු නායකයෙක්. මා වග කීමකින් කියනවා මේ රටේ ඉතිහාසයේ තිබුණ හැම ආණ්ඩුවක්ම - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා නායකත්වයට එන්න ඉස්සර වෙලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පුමුඛව තිබුණු ආණ්ඩුත්- පෞද්ගලීකරණය තුළින් රාජ්‍ය ආයතන විකුණා දැම්ම බව. එවැනි ඉතිහාසයක් සහමුලින්ම වෙනස් කරපු එකම රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාය කියන එක අද අප බොහොම පැහැදිලිව මතක් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන තිබෙන අවස්ථාවේ මේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මම මේ උත්තරීතර සභාවේදී කියනවා, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් අප අමාත්‍යාංශය යටතේ තිබෙන මොන යම් හෝ ආයතනයක් විකිණීමට හැකියාවක් තිබෙනවාය කියලා කාට හෝ කෙනකුට මේ පනත් කෙටුම්පතේ එක තැනකින් හෝ පෙන්නුම් කරන්න පුළුවන් නම් ඒ වගකීම භාර ගන්න අපි ලෑස්තියි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න මගේ සහෝදර සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට මතක් කරනවා පෞද්ගලීකරණය, එහෙම නැත්නම් රාජ්‍ය ආයතන විකිණීමේ ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් කිසි සේත්ම අප ළඟ නැහැ කියලා. ඒකට කිසි සේත්ම අපි ඉඩ තියලා නැහැ කියන එක ජනතා විමුක්ති පෙරමුණට අපි මතක් කර දෙනවා. එතුමා ශ්‍රීලංකන් ගුවන් සමාගම ගැන කථා කෙරුවා. විකුණපු එක ගැන කථා කෙරුවා. ඔව්. අපි පිළිගත්තා. නමුත් එතුමාට එකක් අමතක වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විකුණපු ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සියයට සියයක අයිතිය අද තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ ආණ්ඩුවට කියන එක අද අපට කියන්න පුළුවන්කමක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ අපේ සියලු දේවල් ආරක්ෂා කර ගෙන රට ආර්ථික වශයෙන් දියුණු වන, අපි ජාත්‍යන්තර ප්‍රජාවත් එක්ක එකට එකතු වෙලා වැඩ කරන, ලෝකයේ දියුණු වන සමාජයත් එක්ක එකතුව ඒ වගකීම් ඉටු කරන අවස්ථාවකය කියන එක බොහොම පැහැදිලිව මේ අවස්ථාවේදී මතක් කරනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා දැන් මෙම ගරු සභාව තුළ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා අදහස් දැක්වීමේදී බොහොම උනන්දුවෙන් ඔප්පු කරන්න හැදුවා, අපේ රාජ්‍ය නිලධාරින්ට වැඩ පිළිවෙළක් නැහැ, අපේ රාජ්‍ය නිලධාරින්ට මේ ගැන වැටහීමක් නැහැ කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ දවසේ එතුමා මේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට සහභාගි වුණා. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විෂයභාර අමාත්‍යතුමා හැටියට එතුමාගේ සභාපතිත්වයෙන් තිබුණු උපදේශක කාරක සභාවට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සහභාගි වුණා. ඒ වෙලාවේ එතුමා නැඟූ ප්‍රශ්නවලට සභාපතිතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමා පිළිතුරු දුන්නා. ඒ නිලධාරින් තමන්ගේ වගකීම හරියට ඉටු කළා. බොහොම පැහැදිලිව විපක්ෂයට කිව්වා, සංශෝධන තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියා. ඒ සංශෝධන ඉදිරිපත් කරන්න කියා කිව්ව අවස්ථාවේදී එතුමා ඉදිරිපත් කළ දේවල් අද මෙතැනදී කිව්වා අපිට ඇහුණා. විශේෂයෙන්ම ගුවන් යානයකට ඇතුළු වන මඟියා ආරක්ෂා කිරීමට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියා එතුමා ඇහුවා. අපි ඊයේ දවසෙත් එතුමාට පැහැදිලි කර දුන්නා, පනතේ අංක 92 සහ 99 කියන වගන්තිවලින් ගුවන් මඟියාට රැකවරණය ලැබීම, ආරක්ෂා වීම සිදු වනවාය කියන එක. ඒ වාගේම අපි එතුමාට මතක් කරන්න වෙනවා, බොහොම පැහැදිලිව ඒ නිලධාරින් තමන්ගේ වගකීම ඉටු කර තිබෙනවාය කියන කාරණයත්. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත නව පනතක් හැටියට -ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සංශෝධන පනතක් නොව නව පනතක් හැටියට- ඉදිරිපත් කිරීමේදී අතිවිශාල කාර්ය භාරයකට නිලධාරින්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒක මානුෂිකත්වයෙන් බැලීමට ආණ්ඩුවක වග කියන මහ ජන නියෝජිතයන් හැටියට අපට යුතුකමක් හා වග කීමක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නම්‍යශීලී සහ ජනතාවට ඇහුම් කන් දෙන ආණ්ඩුවක් හැටියට විපක්ෂයට තමන්ගේ සංශෝධන ඉදිරිපත් කරන්න අවස්ථාව දීලා තිබෙනවා. වෘත්තීය සමිතිවල අයිතීන් ආරක්ෂා කර, ඔවුන්ට ඇහුම් කන් දෙමින් ඔවුන් සමඟ සාකච්ඡා වට දිගින් දිගටම පවත්වා අද දවසේත්, අවසාන මොහොතේත් තවත් කාරක සභා අවස්ථාවකට මේ සංශෝධන ඉදිරිපත් කරන්න ඉඩ ලබා දීලා අපි මේ කටයුත්ත කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන, ප්‍රජාතන්ත්‍රවාදය තුළ වග කීමෙන් කටයුතු කරන ආණ්ඩුවක් නිසායි කියන එක අද අපි බොහොම පැහැදිලිව කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි එහෙම කරද්දී පාර්ලිමේන්තුව ඇතුළේ වැද්දෝ බණ කියනවාත් ඇහෙනවා. ඒ අතරතුරේ ඉඳලා හිටලා වැද්දෝ බණ කියනවා. මත්තල ගුවන් තොටුපොළක් හදන්නේ මොකටද කියලා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහනවා අපට ඇහුණා. කොළඹට වහින කොට මත්තලටත් වහිනවාලු. දැන් එතුමා කියනවා, කොළඹට වහින වෙලාවෙම මත්තල ගුවන් තොටුපොළ හදන ප්‍රදේශයටත් වහිනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔය වාගේ කථා කියන්න ඒ මන්ත්‍රීතුමාට හොඳ හැකියාවක් තිබෙන බව මේ උත්තරීතර සභාව විතරක් නොවෙයි, මුළු රටම, මුළු ලෝකයම දන්නවා. ඇට නැති දිව ඕනෑම පැත්තකට හරවන්න පුළුවන්. ඒ ඇට නැති දිව හරවලා, මත්තලට වහින වෙලාවේම කටුනායකටත් වහිනවාය කියලා කිව්ව ඒ මන්ත්‍රීතුමා මීට කලිනුත් ඔය වාගේම කථාවක් කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ඔබතුමා පාර්ලිමේන්තුවේ නොසිටින්න ඇති. වීරෝදාර රණ විරුවා -අද එතුමාගේ ජීවිතය ආරක්ෂා වන, අද එතුමාටත් භයක් සැකක් නැතුව, ආරක්ෂක භටයන් නැතුව පාරට බහින්න පුළුවන්

තත්ත්වයක් ඇති කරලා දුන්නු ඒ වීරෝදාර රණ විරුවා- එදා තොප්පිගල කැලේ ඇල්ලුවාම කිව්වා, "ඕක මොකට අල්ලා තිබෙනවාද? ඕක මහා සන කැලෑවක්." කියලා. වීරෝදාර රණ විරුවා අලි මංකඩට යන කොට කිව්වා, "අලි මංකඩ නොවෙයි යන්නේ, පාමංකඩ" කියලා. වීරෝදාර රණ විරුවා කිලිනොච්චියට ගිහින් වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ පරිපාලන මධ්‍යස්ථාන අල්ලන කොට කිව්වා, "ඔය ගියේ කිලිනොච්චියට නොවෙයි, මැදවච්චියට" කියලා. එහෙම කියපු ඒ මන්ත්‍රීතුමා දැන් කියනවා, "මත්තලට ගුවන් තොටු පොළක් මොකටද? මත්තලටත්, කටුනායකටත් එක වෙලාවටම වහිනවා"ය කියලා.

අද මේ පනත් කෙටුම්පත මෙපමණ නම්‍යශීලී විධියට අප ඉදිරිපත් කරන කොට, ඒ පනත් කෙටුම්පත ගැන ඉතාම අවධානයෙන් කටයුතු කරන කොට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට අමතක වෙලා තිබෙනවා, පෞද්ගලීකරණය කරපු දේවල් ගැන. අපි ඒ ගැන කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒක පැත්තකටම දමන්න. රටේ ආයතන විකුණපු එක ගැන අපි කථා කරන්නේ නැහැ. නමුත් එතුමා මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි, එතුමාට මෙය මතක් කරලා දෙන්න. එතුමා නිලධාරින් ගැන කථා කළා. ඊට පස්සේ මේ පනත් කෙටුම්පතේ තිබෙන යම් යම් දේවල් ගැන කථා කළා. සාධාරණ විවේචනයක් නම් එය භාර ගන්න අපි ලෑස්තියි.

2002 පැවැති ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමායි අගමැතිතුමා වශයෙන් සිටියේ. අපි විපක්ෂය පැත්තේ පුටුවල වාඩි වෙලා සිටියේ. එදා අගමැතිතුමා රනිල් වික්‍රමසිංහ මහත්මයා. 2002 පෙබරවාරි මාසයේ 21 වන දා පාර්ලිමේන්තුව ඇතුළේදී, එදා විපක්ෂ නායකතුමා හැටියට සිටි, අද ජනාධිපතිතුමා හැටියට සිටින මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇහුවා,"මේ රට පාවා දෙන ගිවිසුමක් අත්සන් කරන්න ලෑස්ති වනවාය කියා අපට ආරංචියක් තිබෙනවා. ඒ ආරංචිය ඇත්තද?" කියලා. එහෙම අහන කොට ඒ ආණ්ඩුව ඇතුළේ ඉඳ ගෙන එතුමන්ලා කිව්වේ, "අපි ඒ කිසිම දෙයක් අත්සන් කරන්නේ නැහැ. එහෙම ගිවිසුමක් අත්සන් කරනවා නම් එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තමයි අත්සන් කරන්නේ" කියලායි. රවි කරුණානායක මන්ත්‍රීතුමාත් දන්නේ නැහැ, පෙබරවාරි 22 වන දා රනිල් වික්‍රමසිංහ මහත්මයා වේළුපිල්ලේ ප්‍රභාකරන් එක්ක ගිවිසුම අත්සන් කරලා. එහෙමයි රට විකුණුවේ. එහෙමයි රටේ භූමියෙන් තුනෙන් දෙකක් වේළුපිල්ලේ ප්‍රභාකරන්ට ලියා දුන්නේ. එහෙමයි රටේ භූමිය වටේට තිබෙන මුහුදෙන් තුනෙන් දෙකක් වේළුපිල්ලේ ප්‍රභාකරන්ට ලියා දුන්නේ. එහෙම ඉතිහාසයක් තිබෙන පක්ෂයක අය තමයි අද "වැද්දෝ බණ කියනවා වාගේ" මෙහෙම කියන්නේ. මේ ටික මා කියන්න සිටියේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. නමුත් කියන්න සිද්ධ වුණා.

මේ සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපැහැදිලි දේවල් තිබෙනවා නම්, වෙනස් කළ යුතු තැන් තිබෙනවා නම්, අපට නොපෙනෙන දෙයක් තිබුණා නම්, අපට නොගැළපෙන දෙයක් තිබුණා නම් ඒ විවේචන භාර ගන්න අපි ලෑස්තියි. ඒ සංශෝධනවලට අපි ලෑස්තියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බොහොම පැහැදිලිව කියනවා, අද ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත තුළින් බලාපොරොත්තු වන්නේ, අපේ රටේ ඉදිරි ගමනේ ආර්ථිකය ශක්තිමත් කරන වැඩ පිළිවෙළට දායකත්වයක් ඇති කර ගැනීමයි කියලා. ඒ සඳහායි මේ පනත් කෙටුම්පත අද අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. අපි වග කීමකිනුයි වැඩ කරන්නේ.

වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමා හැටියට කටයුතු කරන්නේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. වරාය හා ගුවන් සේවා නියෝජ්‍ය ඇමතිවරු දෙ පොළ හැටියට මමත්, දයාශ්‍රිත තිසේරා මගේ සහෝදර නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ අප අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතන, අධිකාරි ඒ වෙනුවෙන් කැප වෙලා, ඒ වෙනුවෙන් තමන්ගේ යුතුකම, වගකීම ඉටු කරන්න ලෑස්තියි. ඒ වාගේම සියලුම වෘත්තිය සමිති සමඟ අපි බොහොම පැහැදිලිව සාකච්ඡා පැවැත්වුවා. ඒ වෘත්තිය සමිතිවලින් ඔවුන්ට නොගැළපෙන - [බාධා කිරීමක්] බොහොම හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම මේ මතක් කරන්න ආවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය කාලයේ SriLankan Airlines, Sri Lanka Telecom වැනි ආයතන 40ක් විතර පෞද්ගලීකරණය කළේ කවුද කියන එකයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. මොකද මේ අපට දමන්නේ? එක්සත් ජාතික පක්ෂය නොවෙයි, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාලයේ තමයි එවැනි දේවල් පෞද්ගලීකරණයට යොමු කළේ. මොනවාද ඒවාට දෙන උත්තර? ඔක්කොම එක්සත් ජාතික පක්ෂයට දමනවා. කරුණාකරලා ඒවා ගැන හරියට කතා කරන්න. හරි තත්ත්වය පෙන්වන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

There is no point of Order there.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

බොහොමත්ම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. කොහේ ඉඳන් ආවත් හැම දාම තමුන්නාන්සේ වල්ගෙ තමයි පාග ගන්නේ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. එහෙම නම් ඔබතුමා කතා කරන්න මම අහගෙන ඉන්නම්. හරි. ඉවරද? හැම දාම පාග ගන්නේ වලිගයක්. බොහොම පැහැදිලිව මම කියන්නේ මොකක්ද? තමුන්නාන්සේ කොහේ හරි ඉඳ ගෙන කවුරු හරි කියපු දෙයක් අහගෙන ඇවිල්ලා තිබෙනවා. බොහොම පැහැදිලිව වග කීමකින් මම කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛව හදපු ආණ්ඩු, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය නැතුව තමුන්නාන්සේලාගේ ආණ්ඩු එක්ක මේ රටේ පෞද්ගලීකරණ කටයුතු කළාය කියා. මම ඒක බොහොම පැහැදිලිව කිව්වා. එහෙම කියන්න පුළුවන් හැකියාවක් අපට තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ආයෙත් පනිනවා. ඔය, ආයෙත් පාග ගත්තා, වලිගය. බොහොම පැහැදිලිව වග කීමෙන් එහෙම කියන්න පුළුවන්කමක් අපට තිබෙනවා. මම හිතන්නේ ඒකට නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දුව ගෙන ආවේ කියලා. මම හිතුවේ තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමා එදා අගමැතිතුමා හැටියට මේ රට පාවා දීපු සම්මත ගිවිසුම ගැන කතා කරන්න ආවාය කියායි. මට බයත් හිතුණා. වෙන දා අඳින ඇඳුමත් නොවෙයි තමුන්නාන්සේ ඇඳ ගෙන ඉන්නේ. දුව ගෙන එන කොට වැරදිලාවත් මොනවා හරි වුණා නම් මොකද වන්නේ? කලින් තමුන්නාන්සේ අඳින ඇඳුම නම් අවුලක් වන්නේ නැහැ. මේ ඇඳුමත් එක්ක වැටුණොත් සෙල්ලම් නොවෙයි, පුරුදු නැතිව. [බාධා කිරීමක්] නැහැ, නැහැ. අනේ නැහැ. නායකයකුගේ ගති ලක්ෂණ පෙනෙනවා. ඒකට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මේ නිසායි. තමුන්නාන්සේ පළමුවැනි පෙළේ හිටියත් පිටුපස පේළිවල ඉන්නා අය දැන් මට අතින් යම් යම් සංඥා කරනවා. තමුන්නාන්සේට ඒවා පෙනෙන්නේ නැහැ. බලන්න අද තමුන්නාන්සේලාගේ පක්ෂයට ගිහින් තිබෙන කල? මොකක්ද මේකේ තේරුම? මේ පක්ෂයට ගිය කල මොකක්ද? මේකද සිද්ධ වෙලා තිබෙන්නේ? [බාධා කිරීමක්] තමුන්නාන්සේට පුළුවන් නම් හොරෙන් හැරිලා බලන්න. එහෙම නැත්නම් මේ පැත්තේ කාට හරි කියන්න, සිදු වන්නේ මොකක්ද කියා කියන්නය කියලා. අර පැත්තේ අය ඇඟිලි පෙන්වනවා; හොඳ වැඩ කොටසක් වෙනවා. මෙන්න අද

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

තමුන්නාන්සේලාගේ පක්ෂයට ගිහින් තිබෙන කල! [බාධා කිරීමක්] අන්න හරි. බලන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොන්දක් නැති අය තමයි එහෙම කරන්නේ. [බාධා කිරීමක්] ඒ කියන්නේ කොන්ද නැති අය.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තත්පරයක් දෙන්න. ඒ ගරු මන්ත්‍රීතුමාට අමතක වෙලා තිබෙනවා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේදී ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කාලයේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් - එමිරේට්ස් සමඟ ගිවිසුම ගැන. එවකට එක්සත් ජාතික පක්ෂයේ මලික් සමරවික්‍රම මහත්මයා team එකක් එක්ක ගියා. මේකේ වැරදි ඒවා මෙන්න මේවා තමයි - [බාධා කිරීමක්] මෙන්න මේවා තමයි වැරදි ඒවා. ඒවා නිරාකරණය කරන්න - [බාධා කිරීමක්] අන්තිමට මොකද වුණේ, කොහොමද ආවේ? තමුන්නාන්සේ දන්නවා නේ. [බාධා කිරීමක්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි කොහොම වුණත් මම ඒ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, සභා ගර්භයට ඇවිල්ලා මුහුණ දෙන්න ඇති හැකියාව ගැන. විපක්ෂ නායකවරයාට නැති ඒ හැකියාව, ආත්ම ශක්තිය එතුමාට ලැබී තිබෙන එක ගැන අපි සන්තෝෂ වෙනවා. පිටුපසින් ඉන්න පිරිවර එතුමාට අපහාස කළත්, අභියෝග ආවත් ඒ අභියෝග ජය ගෙන එතුමා ඉදිරියට යන එක ගැන ආණ්ඩු පක්ෂය හැටියට අපි සතුටු වනවා.

අපි ඒ ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි ලෙසම මතක් කරනවා, එතුමා ඉදිරිපත් කරපු -අතිගරු ජනාධිපතිතුමාත් අසුන් ගත් උපදේශක කාරක සභාවේදී ඉදිරිපත් කරපු- යම් යම් සංශෝධන ගැන බොහොම පැහැදිලිවම අපේ අවධානය යොමු කරනවාය කියා. බොහොම සද්භාවයෙන් ඉදිරිපත් කරන හැම කරුණක් ගැනම අවධානය යොමු කරන්න අපි ලැස්තියි.

ඒ වාගේම විශේෂයෙන්ම අපි මත්තල ගුවන් තොටුපළ ගැන මතක් කරන්න ඕනෑ. අද වන කොට යුද්ධය අවසන් කර තිබෙන නිසා දේශීය හා විදේශීය සංචාරකයන්ගේ පැමිණීම, භාණ්ඩ ප්‍රවාහනය ආදී මේ සියල්ල අද බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටු පළ තුළින් කර ගන්න බැරි තරමට ලොකු තදබදයක් ඇති වෙලා තිබෙනවා. අද අලුත් ගුවන් සමාගම් අපිත් එක්ක එකතු වන්න, ගිවිසුම් ගත වන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එකක් කියන්න. [බාධා කිරීම්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
තමුන්නාන්සේ 22 වැනි දාට මගෙත් එක්ක ඇවිල්ලා මේ උත්සවයට අපිත් එක්ක සම්බන්ධ වන්න. අපි බොහොම වග කීමකින් කථා කරන්නේ. ඒ නිසා ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට අද දවසේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී අපි කියනවා, 2012 වසරේ සිංහල අවුරුද්දට පෙර අපි මත්තල ගුවන් තොටු පොළේ පළමුවන අදියර අවසන් කරන බව. [බාධා කිරීමක්] නැහැ, මම හැන්සාඩ් ගත වන්නයි කියන්නේ. තමුන්නාන්සේ භය වන්න එපා. මට අභියෝග කරන්න. අපි වරායේ කරදියවර මංගල්‍ය මාස හතරහමාරක්, පහක් ඉදිරියට ගෙනාවා. ඒ වාගේම අපි මේ වග කීමත් ඉටු කරනවා. තමුන්නාන්සේ මේවාට ගණන් හදලා පෙන්නුවා; පොලිය හදලා පෙන්නුවා. අපි භය නැහැ. අපි භය නැතුව වැඩ කරන්නේ. [බාධා කිරීමක්] අපි කිසි දෙයකට භය වන්නේ නැහැ. අපි වග කීමකින් යුතුව ඒ ඉලක්ක සහගත වැඩ පිළිවෙළට යන්න ලැස්තියි. ඒ වගකීම ඉටු කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ඒ වාගේම නිලධාරින්ගේ සහයෝගයෙන්, සියලු දෙනා එකට එකතු කර ගෙන ඒ ජයග්‍රහණය ලබනවා. බාධක ඇති වෙයි. ඒ බාධකයන් සියල්ලත් එකට එකතු කර ගෙන යන්න අපි ලැස්ති වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මිහින් ලංකා ආයතනය ගැන කථා කළා. විශේෂයෙන්ම මිහින් ලංකා ආයතනය ගැන විවේචනාත්මකව කථා කරන වෙලාවන්වලදී අපි බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එදා මිහින් ලංකා ආයතනය අපි ආරම්භ කරන කොට අපේ මානසිකත්වය මොකක්ද? අපි හැම වෙලාවේම කතා කරනවා, අපේ රටේ රාජ්‍ය සම්පත් ගැන, අපේ දේශීයත්වයට ගරු කරන්න, අපේ රට තුළ සිටින මිනිසුන් අතරින් ඇති හැකි මිනිසුන්ට සහ නැති බැරි මිනිසුන්ටත් යමක් කරන්න පුළුවන් හැකියාව ලැබෙන්න ඕනෑ කියන කාරණා ගැන. ඒ නිසා දැන් - [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෙහාට එන්නද හදන්නේ?

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු මන්ත්‍රීතුමා ඉන්න. ඇයි යන්නේ?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
එතුමා පාමංකඩ යනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මම හිතුවේ එතුමා මේ පැත්තට එන්න හදනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට භයක් ඇති වුණා. මොකද හේතුව එක පුටුවක්වත් නැහැ මේ පැත්තේ. මෙතුමාට ආවොත් දෙන්න වන්නේ බංකුවක් විතරයි. [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජනතා විමුක්ති පෙරමුණට උපදෙස් දෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මම හිතා ගෙන සිටියේ මෙතුමා එන්න හදනවා කියලා.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ආවා, හාගෙට.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා මිහින් ලංකා ආයතනය ඇති කළේ, මේ රටේ ඇති හැකි මිනිසුන්ට වාගේම මේ රටේ රාජ්‍ය සේවයේ නියුතු රාජ්‍ය සේවකයෙකුට, මේ රටේ කම්කරුවකුට ගුවන් යානයකට ගොඩ වෙලා විදේශ රටකට යන්න තිබෙන ආශාව ඉෂ්ට කරන්න වාගේම, බෞද්ධ, ඉස්ලාමීය, කතෝලික හා හින්දු බැතිමතෙකුට ආගමික සිද්ධස්ථානයකට යන්න පුළුවන් වටපිටාව හදන්නයි.

එදා අපි හිතා ගත්තා නම් ලංකා බැංකුව විතරයි තිබෙන්න ඕනෑ, මහජන බැංකුවක් ඕනෑ නැහැ කියලා. එහෙම නම් මුළු රටේම රාජ්‍ය බැංකුව විධියට එකම බැංකුවයි -ලංකා බැංකුව විතරයි.- තිබෙන්න ඕනෑ. පුංචි මිනිසුන්ටත්, ඇති හැකි මිනිසුන්ට ලබන්න පුළුවන් ආස්වාදය ලැබෙන විධියට, ඒ අයට සිහිනයක්ව තිබුණු දේ අද යථාර්ථයක් බවට පත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද බලන්න බුද්ධගයාවට යන්න කොපමණ බෞද්ධ ජනතාවක් මිහින් ලංකා ගුවන් සමාගමත් එක්ක එකතු වනවාද කියලා. මේ රටේ පෞද්ගලික බස් එකකට - private bus එකකට- කවදාකවත් ගොඩ වන්න බැරි වෙච්ච අපේ අහිංසක උපාසිකා මාතාවෝ අපි දකිනවා අපේ කටුනායක ගුවන් තොටු පොළෙන් ඉන්දියාවට ගිහිල්ලා බුද්ධගයාව වැඳ පුදා ගෙන එනවා. නමුත් විපක්ෂයට මේවා දිහා මානුෂික පැත්තෙන් බලන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඇයි හේතුව? හැම දෙයකටම වෛරය පෙරදැරි කර ගත්තා වූ වැඩ පිළිවෙළක් තුළ තමයි මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ බව අද අපි මතක් කරන්න ඕනෑ.

දැන් මේ අවස්ථාවේදී බලන්න ගුවන් තොටු පොළට ගුවන් යානා එනවා යනවා වාගේ විපක්ෂ නායකතුමා ආවා, ගියා. [බාධා කිරීම්] මේ පනත වටින්නේ එතුමාට. [බාධා කිරීමක්] බලන්න කෝ, මම හිතුවා ආවාම අඩු ගණනේ land කරයි කියලා. නැහැ, කෙළින්ම take-off. [බාධා කිරීමක්] මේක transit එකක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමා වන්න. මොකද, කථාව කර ගෙන යන කොට ඇස් දෙකට දකින දේවල් තිබෙනවා නේ. ඒවාටත් උත්තර දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

අපි අද ඉදිරිපත් කළ මෙම පනත් කෙටුම්පත, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කථානායකතුමාගේ අවසරය අනුව කාරක සභා අවස්ථාවේදී සංශෝධන සහිතව සම්මත කර ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඒ අවස්ථාවන්වල දී අපට උදවු කළ අප අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ සියලුම නිලධාරින්ටත්, අධිකාරියට අනුබද්ධිත අනෙකුත් ආයතනවල සියලුම නිලධාරින්ටත්, පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යාංශය ඇතුළු සියලුම අංශවල නිලධාරින්ටත්, නීතිපති දෙපාර්තමේන්තුවේ සියලු දෙනාටත්, විශේෂයෙන්ම අපේ සියලුම වෘත්තිය සමිති නායකයන්ට හා ඒ සියලු දෙනාටත් අතිගරු මහින්ද රාජපක්ෂ ජනපතිතුමා වෙනුවෙන්, ආණ්ඩුව වෙනුවෙන් අපේ හෘදයංගම ස්තුතිය පුද කරනවා. මෙම පනත රටේ ඉදිරි ජයග්‍රහණයට හේතු වන, රටේ ඉදිරි ගමන් මාර්ගය ශක්තිමත් කරන පනතක් බව ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම පනත් කෙටුම්පත පිළිබඳ විවාදය හෙට දිනයට කල් තබන ලෙස ඉල්ලනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.***
*இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Item No. 2.

## පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන විශේෂ කාරක සභාව
## பாராளுமன்ற சேவையின் சுயாதீனப்பண்பை வலுப்படுத்துவது பற்றி ஆராய்ந்து அறிக்கை சமர்ப்பிப்பதற்கான தெரிகுழு
## SELECT COMMITTEE TO INQUIRE AND REPORT ON STRENGTHENING THE INDEPENDENT CHARACTER OF THE PARLIAMENTARY SERVICE

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I move,

"Whereas it has become necessary to submit recommendations to strengthen the independent character of the Parliamentary Service in all its areas of activity,

This House resolves that a Select Committee of Parliament be appointed to inquire and report on:

(a) Strengthening of the independent character of the Parliamentary service;

and

(b) any other matters the Committee deem relevant.

2. (a) The Committee and its Chairman shall be nominated by Mr. Speaker;

and

(b) Notwithstanding the provisions of Standing Order 95, the Committee shall consist of five (05) members.

3. That the Committee shall have the power to:

(a) fix its quorum;

(b) summon any person to appear before it, require any person to produce any document or record, to procure and invite all such evidence, written and/or oral representations from present and former members of the Staff of the Secretary-General of Parliament and Staff organizations, as the Committee may think it necessary for the fullest consideration of the matters referred to above;

(c) obtain the services of Specialists and Experts in the relevant fields to assist the Committee; and

(d) make interim reports from time to time and to sit notwithstanding any adjournment of Parliament.

4. The Committee on considering all such matters shall make its Report to Parliament within a period of five (05) months of the setting up of the Committee or such latter date as Parliament may in its discretion appoint."

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The Adjournment Motion is to be moved by the Hon. Shantha Bandara.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Since we are adjourning early, he has not yet come.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.45ට, 2010 ඔක්තෝබර් 07 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 3.45 மணிக்கு பாராளுமன்றம், 2010 ஒக்ரோபர் 07, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 3.45 p.m. until 1.00 p.m. on Thursday, 07th October, 2010.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year. Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.